# නිවන

යනු

## මනසේ නිවීමයි

**නිබ්බන්ති ධීරා යථා යං පදීපො**

ප්‍රඥාවන්තයෝ තෙල් වැටි නිම වූ පහන් සේ පිරිනිවෙති

ධර්ම දානය පිණිසයි !

# නිවන

යනු

## මනසේ නිවීමයි

සම්පාදනය

**මාපලගම සුසිලවංශ හිමි**

**අත්ථි, භික්ඛවෙ, තදායතනං, යත්ථ නෙව පථවී, න ආපො, න තෙජො, න වායො, න ආකාසානඤ්චායතනං, න විඤ්ඤාණඤ්චායතනං, න ආකිඤ්චඤ්ඤායතනං, න නෙවසඤ්ඤානාසඤ්ඤායතනං, නායං ලොකො, න පරලොකො, න උභො චන්දිමසූරියා. තත්‍රාපාහං, භික්ඛවෙ, නෙව ආගතිං වදාමි, න ගතිං, න ඨිතිං, න චුතිං, න උපපත්තිං, අප්පතිට්ඨං, අප්පවත්තං, අනාරම්මණමෙවෙතං. එසෙවන්තො දුක්ඛස්සාති.**

මහණෙනි, යම් නිවනෙක්හි පෘථිවිධාතුව නැත්තේ ය, ආපෝධාතුව නැත්තේ ය, තෙජෝධාතුව නැත්තේ ය, වායෝධාතුව නැත්තේ ය, ආකාසානඤ්චායතනය නැත්තේ ය, විඤ්ඤාණඤ්චායතනය නැත්තේ ය, ආකිඤ්චඤ්ඤායතනය නැත්තේ ය, නෙවසඤ්ඤානාසඤ්ඤායතනය නැත්තේ ය, මෙලොව නැත්තේ ය, පරලොව නැත්තේ ය, සඳ හිරු දෙදෙනාද නැත්තේ ය, මහණෙනි, ඒ නිවනට ඒමක්ද නොකියමි, ඒ නිවනින් යාමක්ද නොකියමි. පැවැත්මක්ද නොකියමි, චුතියක්ද නොකියමි, උපතක්ද නොකියමි, ඒ නිවන නොපිහිටියේ ය. නොපවත්නේ ය. අරමුණු රහිත ය. නිවන, සියලු දුක්ඛයන්හී නිමාව ය.

(ඛුද්දකනිකාය / උදානපාළි / පාටලිගාමියවග්ගො / පඨමනිබ්බානපටිසංයුත්තසුත්තං)

**අත්ථි, භික්ඛවෙ, අජාතං අභූතං අකතං අසඞ්ඛතං. නො චෙතං, භික්ඛවෙ, අභවිස්ස අජාතං අභූතං අකතං අසඞ්ඛතං, නයිධ ජාතස්ස භූතස්ස කතස්ස සඞ්ඛතස්ස නිස්සරණං පඤ්ඤායෙථ. යස්මා ච ඛො, භික්ඛවෙ, අත්ථි අජාතං අභූතං අකතං අසඞ්ඛතං, තස්මා ජාතස්ස භූතස්ස කතස්ස සඞ්ඛතස්ස නිස්සරණං පඤ්ඤායති.**

මහණෙනි, නූපන්නා වූ පහළ නො වූ නොකරන ලද්දා වූ සකස් නො වූ නිවන ඇත්තේ ය. මහණෙනි, නූපන්නා වූ පහළ නො වූ නොකරන ලද්දා වූ සකස් නො වූ නිවන නොවී නම්, උපන්නා වූ පහළ වූ කරන ලද්දා වූ සකස් වූ අත්භවයෙන් නිදහස්වීමක් නොපැණවෙන්නේ ය.

මහණෙනි, යම් හෙයකින් වනාහී නූපන්නා වූ පහළ නො වූ නොකරන ලද්දා වූ සකස් නො වූ  නිවන ඇත්තේ ය. එහෙයින් උපන්නා වූ පහළ වූ කරන ලද්දා වූ සකස් වූ අත්භවයෙන් නිදහස්වීම පැණවෙන්නේ ය.

(ඛුද්දකනිකාය / උදානපාළි / පාටලිගාමියවග්ගො / තතියනිබ්බානපටිසංයුත්තසුත්තං)

**නිස්සිතස්ස චලිතං, අනිස්සිතස්ස චලිතං නත්ථි. චලිතෙ අසති පස්සද්ධි, පස්සද්ධියා සති නති න හොති. නතියා අසති ආගතිගති න හොති.**
**ආගතිගතියා අසති චුතූපපාතො න හොති.**
**චුතූපපාතෙ අසති නෙවිධ න හුරං න උභයමන්තරෙන එසෙවන්තො දුක්ඛස්සාති.**

ඇල්මෙන් අරමුණු ඇසුරු කළ සිතෙහි කම්පාව ඇත. ඇල්මෙන් අරමුණු ඇසුරු නොකළ සිතෙහි කම්පාව නැත. කම්පාව නොමැති කල්හී, සිතෙහි නිවුණු බව ඇත. සිතෙහි නිවුණු බව ඇති කල්හී, කාමයට සිත නැමීමක් නැත. කාමයට සිත නැමීමක් නොමැති කල්හී, මෙලොව පරලොව ගති නැත. මෙලොව පරලොව ගති නොමැති කල්හී, ඉපදීමක් මරණයක් නැත. ඉපදීමක් මරණයක් නොමැති කල්හී, මෙලොව පරලොවද ඒ අතරද නොපිහිටි සිතින් සියලු දුකින් අත මිදෙන්නේ ය.

(ඛුද්දකනිකාය / උදානපාළි / පාටලිගාමියවග්ගො / චතුත්ථනිබ්බානපටිසංයුත්තසුත්තං)

**ජාතං භූතං සමුප්පන්නං, කතං සඞ්ඛත මද්ධුවං**

**ජරාමරණසංඝාටං, රොගනීළං පභංගුනං**

**ආහාරනෙත්තිප්පභවං, නාලං තදභිනන්දිතුං**

උපන්නා වූ පහළ වූවා වූ ප්‍රත්‍යයෙන් හට ගත්තා වූ කරන ලද්දා වූ සකස් වූ අස්ථිර වූ ජරා මරණයෙන් ගැට ගසන ලද්දා වූ රෝගයන්ට වාසස්ථානයක් බඳු වූ කැඩී බිඳී වැනසී යන්නා වූ සතර අහාරය ප්‍රභවය කොට ඇත්තා වූ මේ පංච උපාදානස්කන්ධය වූ කලී සතුටු වන්නට සුදුස්සක් නොවේ.

**තස්ස නිස්සරණං සන්තං, අතක්කාවචරං ධුවං**

**අජාතං අසමුප්පන්නං, අසොකං විරජං පදං**

**නිරොධො දුක්ඛධම්මානං, සඞ්ඛාරූපසමො සුඛොති**

ඒ පංච උපාදානස්කන්ධයෙන් නිදහස්වීම නම් වූ ශාන්ත වූ ප්‍රඥාවට පමණක් ගෝචර වන්නා වූ සදාතනික වූ නූපන්නා වූ ප්‍රත්‍යයෙන් හට නොගත්තා වූ ශෝක නැත්තා වූ අනාල පදය වූ
සියලු දුක්ඛ ධර්මයන්ගේ නිමාව වූ සංඛාරයන්ගේ සදාතනික සංසිඳීම නිවන් සැපය ය.

# පෙළගැස්ම


| | |
|---|---|
| නිවන් සැප ලැබේවා? | 09 |
| නිවන යනු මනසේ නිවීමයි | 10 |
| පරම සැපය නිවනයි | 13 |
| කර්මය රැස්වන පටිච්ච සමුප්පාද ක්‍රියාවලිය | 17 |
| පටිච්ච සමුප්පාද ධර්ම සංක්ෂිප්තව මෙසේය | 19 |
| පටිච්ච සමුප්පාදයේ සමුදය නොහොත් සසර මග | 21 |
| සසර උදා කරන අනුලෝම පටිච්ච සමුප්පාදය | 25 |
| පටිච්ච සමුප්පාදයේ නිරෝධය නොහොත් උතුම් නිවන් මග | 27 |
| සසර නිමා කරන ප්‍රතිලෝම පටිච්ච සමුප්පාදය | 30 |
| තුන් ලෝ සතුන් තුන් කල් දවන තුන්විධ ගින්න | 32 |
| ගින්න සහ නිවන තමා තුළින්ම දැකගත හැක්කේය | 35 |
| සියල්ල ඇවිළ ගත්තේය | 37 |
| සකල ලෝක සත්වයා දවන එකොළොස් මහා දුක් ගින්න | 45 |
| තමන් සතු සියල්ල එකොළොස් ගින්නෙන් දැවෙන්නේ ය | 46 |
| ඇස නිසා උරුම වූ එකොළොස් ගින්දර | 48 |
| ඇවිළගත් වනයේ ගිනි තැපීම | 51 |
| අපමණ කාලයක සිට සසර එකොළොස් ගින්නෙන් දැවෙයි | 54 |
| ආස්වාදය යට සැඟවුණු බිහිසුණු ගින්දර | 57 |
| ආස්වාදය අතිශයින් බිහිසුණුය | 60 |
| ආස්වාදය විඳීමට වඩා තමා විසින් තමාව නසා දැමීම උතුම් | 60 |
| අවබෝධයෙන් රැකෙන අරියකන්ත සීලය යනු සළායතනයන්ගේ සංවරයයි | 64 |
| සුතවත් අරිය සාවකයා ප්‍රඥාවෙන් කලකිරෙයි | 67 |

එකොළොස් ගින්න යන අර්ථයෙන්ද අනිච්ච වෙයි 70

සියල්ල තුළ පවතින හේතුඵල අනිච්ච ලක්ෂණය 71

පුරාණ කර්මය 71

නව කර්මය 72

නිවන් මග නොහොත් ආර්ය අෂ්ඨාංගික මාර්ගය වැඩෙන ආකාරය 76

අනිච්ච ලක්ෂණයෙන් පෙන්වන ද්වතාව 79

පංච උපාදානස්කන්ධයේ ඉපදීම නොහොත් උදය 81

පංච උපාදානස්කන්ධයේ නූපදීම නොහොත් වය 82

විශ්වයේ මහා දැවීම සහ මහා නිවීම 84

මහාපරිළාහ නම් භයානක නිරයක් ඇත්තේය 85

විශ්වයේ මහා දැවීම 87

විශ්වයේ මහා නිවීම 89

මනස දවන භය නම් වූ අපමණ ගින්දර 91

අසත්පුරුෂ පෘථග්ජනයා විසි ආකාරයකින් භයට පත්වෙයි 95

භය නමැති ගින්දර නිවන සදාතනික නිවන 98

ඇතුළත රාගය නිවීමෙන් එකොළොස් ගිනි නිවෙයි 101

පිටත රාගය නිවීමෙන් එකොළොස් ගිනි නිවෙයි 103

හිසේ ගින්නටද පෙර නිවිය යුතු භව ගින්න 105

පසුවදනක් ... උන්නත් දාහ ය මළත් දාහ ය 106



ගෞරවණීය **මාපලගම සුසිලවංශ හිමියන්** විසින් සිදුකරනු ලබන
ධර්ම දේශනා සහ සතිපතා පැවැත්වෙන ධර්ම සාකච්ඡා ශ්‍රවණය
කිරීම සඳහා ඔබට පහත දැක්වෙන දිගුව හෝ QR කේතය හරහා
'ලොව්තුරු අරණ' YouTube නාලිකාවට පිවිසෙන්නට හැකියි.
තෙරුවන් සරණයි!

www.Youtube.com/c/LowthuruArana

# නිවන් සැප ලැබේවා ?

උත්තරීතර ධර්මද්වීපයේ උපන් සුපින්වත් සිංහල බෞද්ධ ජනයාට **නිවන් සැප ලැබේවා** යන වදන සුලබ වදනකි. සිංහල බෞද්ධයෝ, මිය ගිය ස්වකීය ඤාතියාට, හිතවතාට නිවන් සුව පැතීම සාමාන්‍ය සිරිතක් කොටගෙන සිටිති. ඊට හේතුව නිවන් සුවය යනු මියගිය පසු ලැබෙන සැපයක් ය යන බරපතළ වැරැදි අදහසයි. සද්ධර්මයට එරෙහි ලෝක මාර පාක්ෂික බලවේග විසින් ඇති කරන ලද එම වැරැදි මිථ්‍යාදෘෂ්ටික අදහස නිසා, උතුම් වූ මිනිසත්භවය සහ පරම දුර්ලභ සද්ධර්මය උරුම වූ දුර්ලභ ශ්‍රේෂ්ඨ පින්වන්ත උපතක් උරුම ශ්‍රී ලාංකික සිංහල බෞද්ධ ජනතාවට පවා උතුම් අමා නිවන දුරස්ව ගොස් ඇති සැටියකි.

අනුරාධපුර යුගයෙන් පසුව ශත වර්ෂ ගණනාවක් පුරා නිර්මල සද්ධර්මයේ ලොව්තුරු අර්ථය යටපත්ව පැවතීම නිසා, නිවන යනු පින් රැස් කරගෙන මිය යාමෙන් අත්වන ස්වර්ග සම්පත්තිය වැනි සැපතක් යැයි බෞද්ධ ජනයා පවා වරදවා වටහාගෙන සිටිති.

ඕනෑම බෞද්ධ අවමංගල්‍ය උළෙලක, නිවන් සැප ලැබේවා යන වදන, මළ ගෙදර සිට සොහොන දක්වාම නොයෙක් ආකාරයෙන් ප්‍රදර්ශනය වෙයි. එනිසාම, නිවන යනු මළ පසු ලැබෙන සැපයක්ය යන වැරැදි වැටහීම මිනිසුන් තුළ මුල් බැසගෙන පවතී. **නිවන් සැපය**, මළ පුද්ගලයාට, මළ ගෙදරට, මළ සොහොනට සීමා වී ඇත. ජීවත්ව සිටින්නවුන්ට නිවනක් අවැසි නැත.

නිවන යනු මියගිය පසු හිමිවන සුවයක් නොව, නිවන යනු ජීවිත්ව සිටියදී අත්වන සුවයකි. **නිවන යනු මනසේ නිවීමයි.** නිවන යනු මනසේ පවතින අප්‍රමාණ දාහය, දැවිල්ල, සංසිඳීමයි. පින්වත් ඔබ, තවදුරටත් මේ අති බිහිසුණු සසර අන්ධකාරයේ අනාථව අතරමංව ජරා මරණ අතර සැරිසැරිය යුතු නැත. නැවතත් උත්තරීතර නිර්වාණයේ රන් අරුණලු උතුම් ධර්මද්වීපය පුරා පැතිර යමින් පවතී. සත්‍යයේ හිරු මඬල පායා එමින් පවතී. මේ අප්‍රමාණ සංසාර දුක්ඛ අන්ධකාරයෙන් සත්වයා අතමුදවන, සදාතනික පරම ශාන්තිය සලසන ඒ අමා නිර්මල සද්ධර්මය, නැවතත් මේ උතුම් ධර්මද්වීපයේ රැව් පිළිරැව් නැගෙන කාලයයි. අප්‍රමාදීව ඒ උතුම් සද්ධර්මයට සිහි බුද්ධියෙන් යුතුව කන් යොමන්න ...........

# නිවන යනු මනසේ නිවීමයි

නිවන් සුවය යනු ජීවත්ව සිටියදීම ලැබිය හැකි සුවයකි. නිවන් සුවය යනු අන් සුවයක් නොව, සිතේ, මනසේ දාහය, දැවිල්ල සහමුලින්ම නිවාගත් විට අත්වන ස්ථිරසාර වූ සදාතනික වූ සැනසිලිදායක සුවයයි. නිවුණු මනසට අත්වන සංසිඳීමේ ශාන්ත සුවයයි. සැබෑ සැපය හා සැනසීම ඇත්තේ නිවුණු එම ශාන්ත මනස තුළයි.

සකල ලෝක සත්වයා කෙරෙහි පතළ මහා කරුණාවෙන් අමෘත ධර්මය ලොවට පෙන්වා වදාළ අමාමෑණි ශාන්තිනායක සම්මා සම්බුදු රජාණන් වහන්සේගේ පරම උත්තරීතර බුද්ධ වචනයට අනුවම නිවන කුමක්දැයි විමසා බලමු.

සංයුත්තනිකායේ, මහාවග්ගපාළියේ, මග්ග සංයුත්තයේ, අවිජ්ජා වග්ගයේ, දුතියඅඤ්ඤතරභික්ඛු සූත්‍රයේ, පරම බුද්ධ වචනයට අනුවම **නිවන** මෙසේ නිර්වචනය වෙයි.

**එකමන්තං නිසින්නො ඛො සො භික්ඛු භගවන්තං එතදවොච**, එකත්පසෙක හුන්නා වූ ඒ භික්ෂුව, භාග්‍යවතුන් වහන්සේට මෙසේ කී ය.

**රාගවිනයො දොසවිනයො මොහවිනයො ති, භන්තෙ, වුච්චති. කිස්ස නු ඛො එතං, භන්තෙ, අධිවචනං රාගවිනයො දොසවිනයො මොහවිනයො ති ?**

ස්වාමීනි භාග්‍යවතුන් වහන්ස, රාග විනය, ද්වේෂ විනය, මෝහ විනය යැයි කියනු ලැබේ. ස්වාමීනි භාග්‍යවතුන් වහන්ස, රාග විනය, ද්වේෂ විනය, මෝහ විනය යනු කුමක් උදෙසා ව්‍යවහාර වන්නක්ද ?

**නිබ්බානධාතුයා ඛො එතං භික්ඛු අධිවචනං, රාගවිනයො දොසවිනයො මොහවිනයො ති. ආසවානං ඛයො තෙන වුච්චතී.**

මහණෙනි, රාග විනය, ද්වේෂ විනය, මෝහ විනය යන මෙය, නිර්වාණ ධාතුවට නමකි. ආශ්‍රවයන්ගේ ක්ෂය කිරීම එයින් අදහස් කරනු ලැබේ.

පාලි භාෂාවෙන් වින යනු විනාසය යන අර්ථයයි. රාග විනය, ද්වේෂ විනය, මෝහ විනය යන පද රාග, ද්වේෂ, මෝහ සහමුලින් ක්ෂය කිරීම යන අර්ථය මුල් කරගෙන සැකසී ඇත. රාග ද්වේෂ මෝහ ත්‍රිවිධ අකුසලය දුරු වන, ක්ෂය වන, පහ වන, නැසෙන අන්දමින් කටයුතු කරමින් හික්මීම යන අර්ථය ඇතිව **විනය** යන පදය නිර්මාණය වී ඇත. ඊට **සුගත විනය** යනුවෙන්ද ව්‍යවහාර වෙයි.

නිර්වාණ ධාතුව යනු රාගය, ද්වේෂය, මෝහය අවසන් වූ පාරිශුද්ධ සිතක ස්වභාවයයි. රහතන් වහන්සේගේ සිතෙහි ස්වභාවයයි. පාලි භාෂාවේ එන ආසව හෝ සංස්කෘත භාෂාවේ එන ආශ්‍රව හෝ යන පදයන්ගේ ශුද්ධ සිංහල පදය වන්නේ ආසාව යන්නයි. ආශ්‍රවයන්ගේ ක්ෂය කිරීම යනු, සිතෙහි සියලු ආසාවන් සහමුලින්ම දුරු කර දැමීමයි. **ආසවක්ඛයා නිබ්බානං** - ආසාවන්ගේ නිමාව නිවනයි.

**එවං වුත්තෙ සො භික්ඛු භගවන්තං එතදවොච** - මෙසේ කී කල්හී ඒ භික්ෂුව භාග්‍යවතුන් වහන්සේට මෙසේ කීය.

**අමතං, අමතන්ති, භන්තෙ, වුච්චති. කතමං නු ඛො, භන්තෙ, අමතං ?**

ස්වාමීනි භාග්‍යවතුන් වහන්ස, අමෘතයයි, අමෘතය යැයි කියනු ලැබේ. ස්වාමීනි භාග්‍යවතුන් වහන්ස, අමෘතය යනු කුමකට ව්‍යවහාර වන්නක්ද ?

**යො ඛො, භික්ඛු, රාගක්ඛයො දොසක්ඛයො මොහක්ඛයො, ඉදං වුච්චති අමතං.**

මහණෙනි, යම් සේ රාගය ක්ෂය කිරීම, ද්වේෂය ක්ෂය කිරීම, මෝහය ක්ෂය කිරීම වේද, එය අමෘතය යැයි කියනු ලැබේ.

රාගය, ද්වේෂය, මෝහය අවසන් වූ විට නැවත කර්ම රැස්වීමක් නොමැත. කර්ම රැස්වීමක් නොමැති තැන නැවත උපතක් නැත. නැවත උපතක් නොමැති තැන ජරා මරණ දුක් කිසිවක් නැත. නැවත නැවතත් ජරා මරණ අතර සත්වයා සැරිසරන්නේ කර්ම හේතු කොට ගෙන ය. කර්ම රැස්වන්නේ අනවබෝධය හේතු කොටගෙන ය. කර්ම යනු රාග, ද්වේෂ, මෝහ චේතනාවන්ගෙන් යුත් ක්‍රියාකාරකම් ය.

**චේතනාහං භික්ඛවෙ, කම්මං වදාමි. චෙතයිත්වා කම්මං කරොති කායෙන වාචාය මනසා වා**

මහණෙනි, රාග, ද්වේෂ, මෝහ චේතනාවෝම කර්මය යැයි වදාරමි. කය, වචනය, මනස යන තුන් දොරින් රාග, ද්වේෂ, මෝහ චේතනාවන්ගෙන් යුක්තව කටයුතු කිරීම කර්මයයි.

ආශාවන් හා බැඳීම් හේතුවෙන් අඛණ්ඩව කර්ම ශක්තිය රැස්වන ආකාරයත්, ඒ කර්ම ශක්තිය තුළින් මෙලොව පරලොව නැවත නැවත ජරා මරණ සහිත දුක්ඛස්කන්ධය හට ගන්නා ආකාරයත් නුවණින් දුටු විට ආශාවන් හා බැඳීම් සැප නොව දුක වශයෙන් ප්‍රඥාවට වැටහෙයි. මේ සියලු දුක්ඛයන්ට හේතුව ආශාවන් හා බැඳීම් බව අවබෝධ වෙයි. එවිට සිතේ රාගය, ද්වේෂය, මෝහය පියවරෙන් පියවර නූපදින තත්වයට පත්වෙයි. කර්ම රැස් නොවෙයි. කර්ම රැස් වීමක් නොමැති කල්හී නැවත පුනර්භවයක් හට නොගනියි. පුනර්භවයක් නොමැති කල්හී නැවත උපතක් නොහොත් ජාතියක් හට නොගනියි. උපත නොහොත් ජාතිය නොමැති කල්හී ජරාව (මහළුවීම / ජර) හෝ මරණය (මරණය / මර) හෝ නොමැත. ජරා මරණ / ජරමර නොමැති හෙයින් නිවන අජරාමර නම් වෙයි. නිවන අමරණීය වෙයි. එබැවින් නිවනට අමෘතය කියයි.

සංයුත්තනිකායේ, සළායතනවග්ගපාළියේ, ජම්බුක්ඛාදක සංයුත්තයේ, එන නිබ්බානපඤ්හා සූත්‍රයේද, සාමණ්ඩක සංයුත්තයේ, එන නිබ්බාන සූත්‍රයේද, නිවන මෙසේ නිර්වචනය වෙයි. අග්‍රශ්‍රාවක මහෝත්තම සාරිපුත්තයන් වහන්සේ විසින් එහි නිවන නිර්වචනය කරනු ලබයි. ඖරස බුද්ධපුත්‍ර දම් සෙනෙවි සාරිපුත්තයන් වහන්සේගේ දේශනාද, බුද්ධ දේශනා වශයෙන්ම, සම්මා සම්බුදු පියාණන් වහන්සේ සාධුකාර දී අනුමත කළ සේක.

දිනක් සාරිපුත්තයන් වහන්සේ හමුවට එන ජම්බුක්ඛාදක පරිබ්‍රාජකයා, මෙවැනි ප්‍රශ්නයක් අසයි.

**නිබ්බානං, නිබ්බානන්ති, ආවුසො සාරිපුත්ත, වුච්චති. කතමං නු ඛො, ආවුසො, නිබ්බානන්ති?**

සාරිපුත්තයන් වහන්ස, නිවන, නිවන යැයි කියනු ලැබේ. ඇවැත්නි, නිවන යනු කුමක්ද?

**යො ඛො, ආවුසො, රාගක්ඛයො දොසක්ඛයො මොහක්ඛයො, ඉදං වුච්චති නිබ්බානන්ති.**

ඇවැත්නි, රාගයේ අවසානයක් වේද, ද්වේෂයේ අවසානයක් වේද, මෝහයේ අවසානයක් වේද, ඊට නිවන කියති.

# පරම සැපය නිවනයි

සංයුත්තනිකායේ, සගාථවග්ගපාළියේ, දේවතා සංයුත්තයේ, නන්දන වග්ගයේ එන නන්දන සූත්‍රයේ මෙවැනි පුවතක් දැක්වෙයි.

අමාමෑණි ලොව්තුරු බුදු පියාණන් වහන්සේ, එක් සැඳෑවක සැවැත්නුවර දෙව්රම් වෙහෙර දම්සභා මණ්ඩපයේ භික්ෂූන් පිරිවරා වැඩ සිටින මොහොතක, භික්ෂූන් අමතා පෙර වූ සිදුවීමක් මෙසේ ගෙනහැර දැක් වූ සේක.

**භූතපුබ්බං, භික්ඛවෙ, අඤ්ඤතරා තාවතිංසකායිකා දෙවතා නන්දනෙ වනෙ අච්ඡරාසඞ්ඝපරිවුතා දිබ්බෙහි පඤ්චහි කාමගුණෙහි සමප්පිතා සමඞ්ගීභූතා පරිචාරියමානා තායං වෙලායං ඉමං ගාථං අභාසි.**

මහණෙනි, පෙර වූවක් කියමි. තව්තිසා දෙව්ලෝ වැසි එක්තරා දෙවියෙක්, දිව්‍ය නන්දන වනයෙහි දෙවඟනන් සමූහයා විසින් පිරිවරන ලද්දේ, දිව්‍යමය වූ පඤ්චකාම සම්පත්තීන් යුක්ත වූයේ, සමන්විත වූයේ, මනස්කාන්ත දිව්‍ය රූප ශබ්ද සුගන්ධ රස පහසාදියෙන් විනෝද වූයේ ඒ වේලාවෙහි මේ ගාථාව කී ය.

**න තෙ සුඛං පජානන්ති, යෙ න පස්සන්ති නන්දනං**

**ආවාසං නරදෙවානං, තිදසානං යසස්සිනන්ති**

නොමැත සැප දන්නො - නඳුන් උයනේ සිරි නොදන්නෝ

දෙව් විමන් වැරූණු - තිදස් ලොව මහ යසස් පිරූණු

අප්‍රමාණ යස ඉසුරු සැප සම්පත් උරුම මහා පින් මහිම හිමි මහේශාක්‍ය මනුෂ්‍යයන්ට සහ දෙවියන්ට වාසස්ථාන වූ තව්තිසා ලොව පිහිටි, නොයෙක් වර්ණ ඇති අත්‍යාංලකාර වස්ත්‍රාභරණයන්ගෙන් සැරසුණු දුටුවන් මන බන්දන අති සුන්දර අප්‍රමාණ රූ ඇති දිව්‍ය අප්සරාවන්ගෙන් පිරිවැරුණු, අති ආකර්ශනීය දිව්‍ය නර්තන, ගායන, වාදන සපිරුණු, බැලු බැලූ අත, තුරුණු වයසින් යුත් දෙවියන් දෙවඟනන් කෙළිදෙලෙන් විනෝදවන, සිතහවෙන් සතුටින් පසුවන දිව්‍ය ආකාශමය නන්දන වනය, යමෙක් නොදක්නේද, ඔහු සැපය ගැන කිසිවක් හෝ නොදන්නේ ය.

**එවං වුත්තෙ, භික්ඛවෙ, අඤ්ඤතරා දෙවතා තං දෙවතං ගාථාය පච්චභාසි**, එවිට අසළ සිටි තවත් දෙවියෙක්, එම දෙවියාට මෙසේ පිළිතුරු දුන්නේ ය.

**න ත්වං බාලෙ පජානාසි, යථා අරහතං වචො ....**

බාල වූ අනුවණ ය, රහතුන්ගේ වචනය යම්සේද, එසේ තෝ නොදන්නෙහි ය.

**අනිච්චාවත සඞ්ඛාරා - උප්පාදවය ධම්මිනො**

**උප්පජ්ජිත්වා නිරුජ්ඣන්ති - තෙසං වූපසමො සුඛො ති**

සියලු සංඛාරයෝ ඒකාන්තයෙන් අනිච්ච ය. හේතු ඇති කල්හී හට ගන්නා වූද, හේතු නොමැති කල්හී නිරෝධ වන්නා වූද, හේතු නිරෝධයෙන් නිරෝධ කළයුතු වන්නා වූද, හේතුඵල ධර්මයකි. සංඛාර හට ගැනීමේ අවසානයක්, නිරෝධයක් වේද, එම උතුම් සංසිඳීමට සැපය කියති.

මනෝරම්‍ය තව්තිසා දෙව් ලොව නන්දන උද්‍යානයේ දිව්‍ය කාමයෙන් මත් වී සිටි එම මිථ්‍යාදෘෂ්ටික දෙවියාට, එහිම වාසය කළ මාර්ගඵලලාභි සම්‍යක්දෘෂ්ටික දෙවියෙකු විසින් පෙන්වා දෙනු ලැබුවේද, දෙව් සැප බ්‍රහ්ම සැප ආදි සියලු සැප ඉක්මවන **පරම සැපය නිවන් සැපය** බවයි. සැබෑ සදාතනික සුවය මනසේ සංසිඳීම බවයි.

දිව්‍ය ආස්වාදයෙන් ඇළලී ගිය තව්තිසා දෙව් විමනේ අභිරූ දෙව්ලියන් පිරිවරා අප්‍රමාණ කාමයෙන් මත් වී ප්‍රමාදව වාසය කරන දෙවියන්ගේ මනසේ සැමවිටම රාගය උත්කර්ෂවත්ව පවතී. දෙවියන්ට පුණ්‍ය විපාකයක් වශයෙන් සැමවිටම රාගයෙන්, ප්‍රේමයෙන්, කෙළිදෙලෙන්, විනෝදයෙන් කල් ගත කිරීමට අවකාශ උදා වී පවතී. එම දිව්‍ය ආස්වාදය හේතු කරගෙනම දෙවියන් තුළ නොයෙක් නොයෙක් කාම දාහයන්ද, සෝක පරිදේවයන්ද, දුක්ඛ දෝමනස්ස උපායාසයන්ද හට ගනියි. එමනිසා දෙවියන්ගේ මනසේ කිසිදු සංසිඳීමක් නොපවතියි. දෙවියන්ද කාමයෙන් දැවෙන මනසින්, මානසික පීඩාවන්ගෙන් යුක්තව කල් ගත කරයි. එබැවින් දෙවියන් විඳින දිව්‍ය සුවයද විවිධ මානසික දුක් පීඩා සහිත වූවකි. චිත්ත දාහය බහුල වූවකි. කොතැන වුවත් කාමය ඇති තැන ඇත්තේ සෝකය සහ භයයි. කාමය අග්‍ර කරගත් දෙවියන්ටද සෝකයෙන් සහ භයෙන් නිදහස් විය නොහැක. එබැවින් දෙවියෝද සැප යනුවෙන් සිතාගෙන දුකක්ම විඳිති.

එම ගාථාවේ අර්ථය ගැඹුරට විමර්ශනය කර, නිවන කුමක්දැයි තවදුරටත් අවබෝධ කොටගත යුත්තාහ.

**අනිච්චාවත සංඛාරා - උප්පාදවය ධම්මිනො**

සංඛාර යනු මොනවාද ? පාලි භාෂාවෙන් සංඛාර, අභිසංඛාර යන පදවලින් සිතෙහි හට ගන්නා රාග චේතනා, ද්වේෂ චේතනා, මෝහ චේතනා හැඳින්වෙයි.

- කාය සංචේතනා අයං වුච්චති, කාය සංඛාරා (රාග, ද්වේෂ, මෝහ චේතනාවක් මුල් වූ කායික ක්‍රියාකාරකම්)
- වචී සංචේතනා අයං වුච්චති, වචී සංඛාරා (රාග, ද්වේෂ, මෝහ චේතනාවක් මුල් වූ වාචික ක්‍රියාකාරකම්)
- මනො සංචේතනා අයං වුච්චති, මනො සංඛාරා (රාග, ද්වේෂ, මෝහ චේතනාවක් මුල් වූ මානසික ක්‍රියාකාරකම්)

අපගේ සිතේ හට ගන්නා රාග, ද්වේෂ, මෝහ චේතනා සහිත ක්‍රියාකාරකම් **කර්ම** යන නමින්ද හැඳින්වෙයි.

**චෙතනාහං භික්ඛවෙ, කම්මං වදාමි, චෙතයිත්වා කම්මං කරොති, කායෙන, වාචාය, මනසා වා.**

රාග චේතනා, ද්වේෂ චේතනා, මෝහ චේතනා සියල්ල, සංඛාර (අභිසංඛාර) නොහොත් කර්ම වෙයි. සියලු සංඛාර අනිච්ච ය. නොහොත් මේ සියලු සංඛාර හේතුවක් නිසාම හට ගන්නේ ය. හේතුවක් නොමැතිව හට නොගන්නේ ය. හේතුවක් නිසා හට ගන්නා සංඛාර ඒකාන්තයෙන් දුක පිණිසම හේතු වන්නේ ය. සසර පැවැත්ම යනු ජාති, ජරා, මරණ, සෝක, පරිදේව, දුක්ඛ, දෝමනස්ස, උපායාස යන මහා දුක්ඛස්කන්ධයේ පැවැත්මයි. එසේ නම් මේ සියලු සංඛාර නොහොත් කර්ම හේතු වන්නේ නැවත නැවත මේ සසර දුක්ඛස්කන්ධයේ හට ගැනීම පිණිස ය. එසේ නම් අපගේ සිතෙහි හට ගන්නා සියලු රාග, ද්වේෂ, මෝහ චේතනා තුළින් නිපදවෙන කර්ම ශක්තියෙන්, මොලොවත් පරලොවත් අප්‍රමාණ දුක්ඛයන් ගෙනදෙනු ලබයි. එසේම රාග, ද්වේෂ, මෝහ යනු මනසේ හට ගන්නා ත්‍රිවිධ වූ ගින්දර ය. රාග, ද්වේෂ, මෝහ චේතනා නැගුණු සිතේ ගිනි ඇවිළෙයි. ඒ මනස දැවීමට ලක්වෙයි. මනසේ දාහය, පරිදාහය, තාපය, සංතාපය ඇතිවෙයි.

එසේම ඒ රාග, ද්වේෂ, මෝහ චේතනා නිසා හට ගන්නා කර්ම ශක්තියෙන් පරලොවක්ද සකස් වෙයි. පරලොවද මෙවැනි ජරා මරණ සහිත, අප්‍රමාණ පීඩා සහිත දුක්ඛස්කන්ධයක් උරුම වෙයි. පරලොවද මෙසේම මනසේ දාහය, පරිදාහය, තාපය, සංතාපය හට ගනියි. පරලොවද මෙසේම දැවෙයි.

එබැවින් සංඛාර නොහොත් රාග, ද්වේෂ, මෝහ චේතනා මෙලොවත් දුක් ගින්දර උරුම කර දෙයි. පරලොවත් දුක් ගින්දර උරුම කර දෙයි. විශ්වයේ සියලු ලෝ සතුන් මෙලොව පරලොව වශයෙන් අනන්ත අප්‍රමාණ සංසාර දුක්ඛස්කන්ධයක් උසුලන්නේ සංඛාර (කර්ම / පින් සහ පව්) හේතු කොටගෙන ය. සිය මනසේම හට ගන්නා රාග, ද්වේෂ, මෝහ චේතනා තුළින් උපදින කර්ම ශක්තිය හේතු කොට ගෙන ය.

සියලු සංඛාර ඒකාන්තයෙන් දුක පිණිසම පවතින්නකි. එබැවින් සියලු සංඛාර දුක ය. ප්‍රඥාවන්ත තීරණය නම් එබඳු දුක උපදවන සංඛාර නොහොත් රාග, ද්වේෂ, මෝහ චේතනා සිතින් සහමුලින්ම දුරු කර දැමිය යුතු බවයි. එබඳු රාග, ද්වේෂ, මෝහ චේතනා නොහොත් සංඛාර සිතෙහි හට නොගන්නා ආකාරයෙන් කටයුතු කිරීමයි. එසේ කටයුතු කිරීමෙන් නව කර්ම හට නොගැනීම නිසා නැවත දුක්ඛිත සසර ගමනක් සකස් නොවේ. සියලු සංඛාරයන්ගේ හට ගැන්ම අවසන් කළ යුතු ය. සංඛාර හට ගැනීමට හේතුවන සියලු හේතු නැසිය යුතු ය. සංඛාර පහ කළ යුතු ය. සංඛාර නිමා කළ යුතු ය. සංඛාර ක්ෂය කළ යුතු ය.

**උප්පජ්ජිත්වා නිරුජ්ඣන්ති - තෙසං වූපසමො සුඛො**

සංඛාර නිරුද්ධ කළ යුතු ය. සංඛාර සදාතනික වශයෙන්ම නිරෝධ වූ විට ඒ ඇතිවන සදාතනික සංසිඳීම සැපය වෙති. **ඊට ශාන්ත වූ ප්‍රණීත වූ නිර්වාණ පරම සුඛය කියති.**

ලෝකයේ පවතින්නා වූ කාම සැපය හේතුඵල වූවකි. තාවකාලික වූවකි. අප්‍රමාණ දුක් සහිත වූවකි. එසේම නැවත නැවත දුක් උපදවන්නට හේතුවන්නකි. නමුත් කාමය, ආස්වාදය සැපයකැයි සත්වයා වරදවා සිතයි. ඊට හේතු වෙන්නේ කාමයේ ආස්වාදයෙන් මත්වන සත්වයාට කාමයේ ආදීනව නොපෙනී යාමයි. ආදීනව සිහි නොවීමයි. එහෙයින් කාමය ඉදිරියේ සත්වයා ප්‍රමාදයට පත්වෙයි. ආස්වාදය උදෙසා ඕනෑම අකුසල කර්මයක නියැලෙයි. ඕනෑම පාප කර්මයක යෙදෙයි. ආස්වාදයෙන් මත්වන සත්වයාට තමන් මහළු වන බව හෝ මිය යන බව හෝ සිහි නොවෙයි. මොහොතින් මොහොත තමන් ජරා ජීර්ණවන බව සිහි නොවෙයි. ඕනෑම තත්පරයක ජීවිතය අවසන් විය හැකි බව සිහි නොවෙයි. ආස්වාදයෙන් කාමයෙන් මත් වී නොයෙක් කර්ම රැස් කරමින් කල් ගත කරන සත්වයා, මරණින් මතු ඒ කර්ම විපාක අනුව පරලොව ජීවිතයක් ලබයි. එහි ඇත්තේද, මෙහි පවතින්නා වූ ජාති, ජරා, මරණ, සෝක, පරිදේව, දුක්ඛ, දෝමනස්ස, උපායාස, රාග, ද්වේෂ, මෝහ යන එකොළොස් ගින්දරම ය. එහෙයින් කාමය දුකම ය. නිවන සැපයම ය. නිවන පරම සැපය ය. **නිබ්බානං පරමං සුඛං.**

# කර්මය රැස්වන පටිච්ච සමුප්පාද ක්‍රියාවලිය

සිතේ කර්ම රැස් වන්නේ ආශාවන් හා බැඳීම් හේතු කරගෙන ය. ආශාවන් හා බැඳීම් සැප යැයි සිතන තුරු සිතේ රාගය, ද්වේෂය, මෝහය හට ගනියි. කර්ම රැස් වෙයි. ආශාවන් හා බැඳීම් සැපතක් යැයි සත්වයා තුළ පවතින වැරැදි වැටහීම නොහොත් ඒ අනවබෝධයට, ධර්මය තුළ **අවිජ්ජාව** කියයි. අවිජ්ජාව හේතුවෙන් මෙම ජරා මරණ සහිත අසාර සිත කය තුළින් ගොඩ නැගෙන ලෝකය ගැන සත්වයා තුළ ඇල්මක්, ආලයක්, ආදරයක්, ප්‍රේමයක් හට ගනියි. ඊට ධර්මය තුළ **තණ්හාව** කියයි.

**ඒ අනුව සියලු කර්ම රැස් වන්නේ අවිජ්ජාව සහ තණ්හාව හේතු කරගෙන ය.** සත්වයාගේ මනසේ පවතින අවිජ්ජාව සහ තණ්හාව යන මූල හේතු දෙක පදනම් කරගෙන කර්ම රැස්වන සහ ඒ රැස් වූ කර්ම හේතුවෙන් විපාක වශයෙන් නැවත උපතක් නොහොත් පුනර්භවයක් සකස්වන මෙම ක්‍රියාවලිය, ධර්මය තුළ **පටිච්ච සමුප්පාදය** නමින් හඳුන්වයි. පටිච්ච සමුප්පාදය යනු හේතුඵල ධර්මතාවලියයි. හේතුවක් නිසා ඵලය උදාවන බවත්, හේතුව නැති කිරීමෙන් ඵලය උදා නොවන බවත් (නිරුද්ධ වන / නිරෝධ වන), පෙන්වා දෙන න්‍යාය ධර්මයයි.

මජ්ඣිමනිකායේ, උපරිපණ්ණාසපාළියේ, අනුපදවග්ගයේ, බහුධාතුක සූත්‍රයේ පටිච්ච සමුප්පාදය ගැන සහ ඒ පිළිබඳ අවබෝධය මෙසේ දැක්වෙයි.

**කිත්තාවතා පන, භන්තෙ, පටිච්චසමුප්පාදකුසලො භික්ඛූති අලං වචනායාති ? ඉධානන්ද, භික්ඛු එවං පජානාති, ඉති ඉමස්මිං සති ඉදං හොති, ඉමස්සුප්පාදා ඉදං උප්පජ්ජති, ඉමස්මිං අසති ඉදං න හොති, ඉමස්ස නිරොධා ඉදං නිරුජ්ඣති, යදිදං, අවිජ්ජාපච්චයා සඞ්ඛාරා, සඞ්ඛාරපච්චයා විඤ්ඤාණං, විඤ්ඤාණපච්චයා නාමරූපං, නාමරූපපච්චයා සළායතනං, සළායතනපච්චයා ඵස්සො, ඵස්සපච්චයා වෙදනා, වෙදනාපච්චයා තණ්හා, තණ්හාපච්චයා උපාදානං, උපාදානපච්චයා භවො , භවපච්චයා ජාති, ජාතිපච්චයා ජරාමරණං සොකපරිදෙවදුක්ඛදොමනස්සුපායාසා සම්භවන්ති. එවමෙතස්ස කෙවලස්ස දුක්ඛක්ඛන්ධස්ස සමුදයො හොති.**

ස්වාමීනි, කොපමණකින් වනාහි පටිච්ච සමුප්පාදයෙහි දක්ෂ වූ භික්ෂුවකැයි කීමට සුදුසුවේද ? ආනන්දය, මේ ශාසනයෙහි මහණ තෙමේ මෙසේ දැනගනීද, **මෙය ඇති කල්හී මෙය වේ. මෙහි ඉපදීමෙන් මෙය උපදී. මෙය නැති කල්හී මෙය නොවේ, මෙහි නිරුද්ධවීමෙන් මෙය නිරුද්ධ වේ.** එනම් අවිද්‍යාවගේ හේතුවෙන් සංඛාරයෝ වෙති. සංඛාර හේතුවෙන් විඤ්ඤාණය වේ. විඤ්ඤාණ හේතුවෙන් නාමරූප වේ. නාමරූප හේතුවෙන් සළායතන වේ. සළායතන හේතුවෙන් ඵස්සය වේ. ඵස්සය හේතුවෙන් වේදනාව වේ. වේදනා හේතුවෙන් තෘෂ්ණාව වේ. තෘෂ්ණා හේතුවෙන් උපාදාන වේ. උපාදාන හේතුවෙන් භවය වේ. භවය හේතුවෙන් ජාතිය වේ. ජාතිය හේතුවෙන් ජරා මරණ ද සෝක පරිදේව දුක්ඛ දොම්නස්ස උපායාසයෝ ද හටගනිත්. මෙසේ මේ සම්පූර්ණ දුක්ඛස්කන්ධයාගේ හට ගැනීම සිදුවේ.

**අවිජ්ජාය ත්වෙව අසෙසවිරාගනිරොධා සඞ්ඛාරනිරොධො, සඞ්ඛාරනිරොධා විඤ්ඤාණනිරොධො, විඤ්ඤාණනිරොධා නාමරූපනිරොධො, නාමරූපනිරොධා සළායතනනිරොධො, සළායතනනිරොධා ඵස්සනිරොධො, ඵස්සනිරොධා වෙදනානිරොධො, වෙදනානිරොධා තණ්හානිරොධො, තණ්හානිරොධා උපාදානනිරොධො, උපාදානනිරොධා භවනිරොධො, භවනිරොධා ජාතිනිරොධො, ජාතිනිරොධා ජරාමරණං සොකපරිදෙවදුක්ඛදොමනස්සුපායාසා නිරුජ්ඣන්ති. එවමෙතස්ස කෙවලස්ස දුක්ඛක්ඛන්ධස්ස නිරොධො හොති.**

**එත්තාවතා ඛො, ආනන්ද, පටිච්චසමුප්පාදකුසලො භික්ඛූති අලං වචනායාති.**

අවිද්‍යාව ඉතිරි නොකොටම නිරුද්ධ කිරීමෙන් සංඛාර නිරොධ වේ. සංඛාර නිරෝධයෙන් විඤ්ඤාණ නිරෝධ වේ. විඤ්ඤාණ නිරෝධයෙන් නාමරූප නිරෝධ වේ. නාමරූප නිරෝධයෙන් සළායතන නිරෝධ වේ. සළායතන නිරෝධයෙන් ඵස්සය නිරෝධ වේ. ඵස්ස නිරෝධයෙන් වේදනා නිරෝධ වේ. වේදනා නිරෝධයෙන් තණ්හා නිරෝධ වේ. තණ්හා නිරෝධයෙන් උපාදාන නිරෝධ වේ. උපාදාන නිරෝධයෙන් භව නිරෝධ වේ. භව නිරෝධයෙන් ජාති නිරෝධ වේ. ජාති නිරෝධයෙන් ජරා මරණද සෝක පරිදේව දුක්ඛ දෝමනස්ස උපායාසයෝද නිරුද්ධ වෙත්. මෙසේ මේ සම්පූර්ණ දුක්ඛස්කන්ධයාගේ නිරෝධය (නූපදීම) සිදුවෙයි.

ආනන්දය, මෙතෙකින් වනාහි පටිච්ච සමුප්පාදයෙහි දක්ෂ භික්ෂුවකැයි කීමට සුදුසු ය.

පටිච්ච සමුප්පාද න්‍යායට අනුව සසර ප්‍රභවය කරන ප්‍රධාන හේතු දෙක අවිජ්ජාව සහ තණ්හාවයි. අවිජ්ජාව සහ තණ්හාව ශේෂයක් හෝ ඉතිරි නොකොට මනසින් සහමුලින්ම දුරු කර දැමීමෙන් සසර නැවත උදා නොවන බව / හට නොගන්නා බව / නිරෝධ වන බව / ජරා මරණ සෝක පරිදේව දුක්ඛ දෝමනස්ස උපායාස සහිත දුක්ඛස්කන්ධය සදහටම අවසන් වන බව, අසිරිමත් බුදු පියාණන් වහන්සේ තුන් ලෝක සත්වයාට පෙන්වා දුන් පරම සත්‍යයයි.

# පටිච්ච සමුප්පාද ධර්ම සංක්ෂිප්තව මෙසේය

**අවිජ්ජාව** - ආස්වාදය, කාමය පතා උදා කර ගන්නා ජරා, මරණ සහිත අත්භවය, සසර පැවැත්ම සැපයක් යැයි වන වැරැදි වැටහීම නොහොත් අනවබෝධය

**සංඛාර** - රාග චේතනා, ද්වේෂ චේතනා, මෝහ චේතනා නොහොත් කර්ම හට ගැනීම

**විඤ්ඤාණ** - රාග, ඇසින් රූප දැන ගැනීම, කනින් ශබ්ද දැන ගැනීම, නාසයෙන් ගන්ධ දැන ගැනීම, දිවෙන් රස දැන ගැනීම, සිරුරෙන් පහස දැන ගැනීම, මනසින් අදහස් දැන ගැනීම

**නාමරූප** - සිත කය දෙක ක්‍රියාත්මක වීම

**සළායතන** - ඇස, කන, නාසය, දිව, ශරීරය, මනස ආයතන ලෙස ක්‍රියාත්මක වීම

**ඵස්ස** - ඇස, කන, නාසය, දිව, ශරීරය, මනස මගින් ස්පර්ශ ලැබීම

**වේදනා** - සැප වේදනා, දුක්ඛ වේදනා, උපේක්ෂා වේදනා හට ගැනීම

**තණ්හා** - ඇල්ම / ආදරය / ප්‍රේමය ඇතිවීම

**උපාදාන** - කාම අදහස් හා බැදීම්, දෘෂ්ටි හා බැදීම්, බලාපොරොත්තු හා බැදීම්, අත්භවය හා බැදීම්

**භව** - කර්මය (පින් පව්) රැස්වීම

**ජාති** - උපත ලැබීම

**ජරා** - මහලුභාවයට පත්වීම

**මරණ** - මරණයට පත්වීම

**සෝක** - සෝක කිරීම

**පරිදේව** - හැඬීම, වැළපීම

**දුක්ඛ** - කායික දුක් වේදනා හට ගැනීම

**දෝමනස්ස** - මානසික දුක් වේදනා හට ගැනීම

**උපායාස** - බලවත් මානසික පීඩා හට ගැනීම

මේ සියල්ල පටිච්ච සමුප්පන ධර්ම නම් වෙයි. එනම් හේතුඵල ධර්ම යන්නයි. සත්වයාගේ මනසේ පවතින අවිජ්ජාව හේතු කරගෙන සංඛාර නොහොත් රාග, ද්වේෂ, මෝහ චේතනා උපදියි. එම සංඛාර හේතු ප්‍රත්‍ය කරගෙන විඤ්ඤාණ, විඤ්ඤාණ හේතු ප්‍රත්‍ය කරගෙන නාමරූප යනාදි වශයෙන් සියලු ධර්මයෝ එකට එකක් ප්‍රත්‍ය කරගෙන හේතුඵල වශයෙන් උපදිති. එම හේතු නිරෝධ වූ විට එම ධර්මයෝ නූපදිති. මෙම න්‍යාය ධර්මයට පටිච්ච සමුප්පාදය කියති.

## අනුලෝම පටිච්ච සමුප්පාදය (සමුදය ධර්ම / සසර උපදීම)

අවිජ්ජා පච්චයා සංඛාරා, සංඛාර පච්චයා විඤ්ඤාණං, විඤ්ඤාණ පච්චයා නාමරූපං, නාමරූප පච්චයා සළායතනං, සළායතන පච්චයා ඵස්සො, ඵස්ස පච්චයා වෙදනා, වෙදනා පච්චයා තණ්හා, තණ්හා පච්චයා උපාදානං, උපාදාන පච්චයා භවො, භව පච්චයා ජාති, ජාති පච්චයා ජරා මරණං සොක පරිදෙවානං දුක්ඛ දොමනස්ස උපායාසා සම්භවන්ති, එවමෙතස්ස කෙවලස්ස දුක්ඛක්ඛන්ධස්ස සමුදයො හොති.

## පටිලෝම පටිච්ච සමුප්පාදය (නිරෝධ ධර්ම / සසර නූපදීම)

අවිජ්ජාය ත්වෙව අසෙසවිරාග නිරොධා සංඛාර නිරොධො, සංඛාර නිරොධා විඤ්ඤාණ නිරොධො, විඤ්ඤාණ නිරොධා නාමරූප නිරොධො, නාමරූප නිරොධා සළායතන නිරොධො, සළායතන නිරොධා ඵස්ස නිරොධො, ඵස්ස නිරොධා වෙදනා නිරොධො, වෙදනා නිරොධා තණ්හා නිරොධො, තණ්හා නිරොධා උපාදාන නිරොධො, උපාදාන නිරොධා භව නිරොධො, භව නිරොධා ජාති නිරොධො, ජාති නිරොධා ජරා මරණං සොක පරිදෙවානං දුක්ඛ දොමනස්ස උපායාස නිරුජ්ඣන්ති, එවමෙතස්ස කෙවලස්ස දුක්ඛක්ඛන්ධස්ස නිරොධො හොති.

# පටිච්ච සමුප්පාදයේ සමුදය නොහොත් සසර මග

(පහත විස්තර වන්නේ, ලෝභ මූලික පටිච්ච සමුප්පාදය ක්‍රියාත්මක වන ආකාරය පමණි. උතුම් නිර්වාණ අවබෝධය පිණිස ප්‍රමුඛ වශයෙන් අවබෝධ කරගත යුත්තේ මෙම පටිච්ච සමුප්පාදයයි.)

පටිච්ච සමුප්පාදය යනු සෑම සත්වයෙකුගේම සිතේ ක්‍රියාත්මක වන හේතුඵල ධර්ම ක්‍රියාවලියයි. සෑම සත්වයෙකුම ක්‍රියා කරනු ලබන්නේ තම සිත තුළ උපදින චිත්ත ශක්තිය මගිනි. සත්වයෝ තම සිතේ උපදින චිත්ත ශක්තිය නොයෙක් නොයෙක් ආකාරයෙන් ප්‍රයෝජනයට ගනිමින් තම තමන්ගේ සැපය සලසා ගැනීමට වැර දරති. මෙලොවදී තම සිතෙහි උපදින චිත්ත ශක්තිය කෙබඳුදැයි යන්න සත්වයා දැන සිටියි. නමුත් සත්වයා නොදැන සිටින්නේ මෙලොවදී තම සිතෙහි උපදින එම චිත්ත ශක්තිය තුළින්ම උපදින කර්ම ශක්තිය හේතුවෙන් පරලොවදී උරුම වන කර්ම විපාක ගැනයි. සත්වයා නොදැන සිටින්නේ කර්මය දායාද කරගෙන ජරාව මරණය සහිත ජාතියක් හට ගන්නා ආකාරය ගැනයි. මෙලොවදී තම සිතේ උපදින චිත්ත ශක්තිය තුළ සත්වයා නොදන්නා රහසක් සැඟව ඇත. එනම් කර්මයයි.

සෑම සත්වයෙක්ම රාග, ද්වේෂ, මෝහ සහිත සිතකින් යුක්තව සිතයි, කතා කරයි, ක්‍රියා කරයි. සිත තුළ මෙසේ උපදින රාග චේතනා, ද්වේෂ චේතනා, මෝහ චේතනා හේතුවෙන් සත්වයාගේ මෙලොව ගති ස්වභාවයක්ද පෙනෙයි. ඒ සමඟම ඒ රාග චේතනා, ද්වේෂ චේතනා, මෝහ චේතනා තුළින් පරලොව උපත පිණිසද කර්ම ශක්තිය රැස්වෙයි. ඒ අනුව රාග චේතනා, ද්වේෂ චේතනා, මෝහ චේතනා තුළින් සත්වයාගේ මෙලොව පරලොව ගති ස්වභාවය නිර්මාණය කරයි. මෙලොව පරලොව වශයෙන් ගතික සත්වයෙකු නිර්මාණය කරන එම රාග චේතනා, ද්වේෂ චේතනා, මෝහ චේතනා තුළින් උපදින ශක්තියට කර්ම ශක්තිය කියයි. සිතේ උපදින රාග චේතනා, ද්වේෂ චේතනා, මෝහ චේතනා තුළින් කර්ම ශක්තිය හට ගැනීම සහ එසේ හටගත් කර්ම ශක්තීන්ට අනුව විපාක වශයෙන් ජරා මරණ සහිත උපතක් සකස් වීම යන හේතුඵල ක්‍රියාවලිය, පටිච්ච සමුප්පාදය නම් වෙයි. සසර අන්ධකාරයේ අතරමං වූ ලෝක සත්වයා සම්මා සම්බුදු පියාණන් වහන්සේගේ අමා සද්ධර්මය අසා අවබෝධ කරගන්නා තුරු නොදකින සත්‍යය ය නම් පටිච්ච සමුප්පාදයයි. යමෙක් මෙම පටිච්ච සමුප්පාද න්‍යාය තම නුවණින් අවබෝධ කර ගතහොත් ඒ සමඟම සියලු සංසාර දුකින් මුදවන අජරාමර නිර්වාණ මාර්ගයට පැමිණෙයි. නිර්වාණ මාර්ගයට පැමිණෙන ප්‍රඥාවන්ත සුතවන්ත ඒ බුද්ධ ශ්‍රාවකයා එකී අවබෝධයෙන්ම සිතේ රාගය, ද්වේෂය, මෝහය සහමුලින්ම අවසන් කොට නිර්වාණ ධාතුවට පත්වෙයි.

**යො පටිච්ච සමුප්පාදං පස්සති - සො ධම්මං පස්සති**

**යො ධම්මං පස්සති - සො මං පස්සති**

යමෙක් පටිච්ච සමුප්පාදය නුවණින් දකින්නේද, ඔහු ධර්මය දකින්නේ ය.

යමෙක් ධර්මය දකින්නේද, ඔහු නිවන දකින්නේ ය.

මේ හේතුඵල ධර්මතාවලිය නොහොත් පටිච්ච සමුප්පාදය අවබෝධ කර නොගන්නා අඥ්ඥාණ පෘථග්ජන සත්වයා කර්ම රැස්වීමට, නැවත නැවත මෙලොව පරලොව ජරා මරණ දුක්ඛ දෝමනස්ස උපායාස සහිත දුක්ඛස්කන්ධය ජනිතවීමට හේතුවන ආස්වාදය නොහොත් සිත කය කාමයෙන් පිනවීම, සැපය යැයි වරදවා වටහාගෙන සිටියි. ආස්වාදය ලැබීමට උපකාර වන ඇස, කන, නාසය, දිව, ශරීරය, මනස යන ආයතන සැප ආයතන යැයි වටහාගෙන සිටියි. ඒ නිසා සිත කය සහ බාහිර අරමුණු තුළින් සකස්වන ලෝකය සැප ලෝකයකැයි වටහාගෙන සිටියි. පංචස්කන්ධය සැපයකැයි වටහාගෙන සිටියි. සත්වයා තුළ පවතින මෙම වැරැදි වැටහීම, වැරැදි අවබෝධය **අවිජ්ජාව** නම් වෙයි. පටිච්ච සමුප්පාදය ආරම්භ වන්නේ අවිජ්ජාව මුල් කරගෙන ය.

මෙම අවිජ්ජාව හේතුවෙන් මනසේ නොයෙක් ආශ්‍රව නොහොත් ආසාවන් උපදියි. සත්වයා මෙම ආසාවන් ඉටු කර ගැනීමට යාම හේතුවෙන් මනසේ රාග චේතනා, ද්වේෂ චේතනා, මෝහ චේතනා උපදියි. පටිච්ච සමුප්පාද ක්‍රියාවලිය ගැන සත්වයා තුළ පවතින අනවබෝධය හේතුවෙන් මනසේ රාග චේතනා, ද්වේෂ චේතනා, මෝහ චේතනා හට ගැනීම පටිච්ච සමුප්පාද සමුදය තුළ **අවිජ්ජා පච්චයා සංඛාරා** යන න්‍යායෙන් පෙන්වා දෙයි. **අවිජ්ජා ප්‍රත්‍යයෙන් සංඛාර හටගනියි.**

එසේ මනසේ හට ගන්නා සංඛාර නොහොත් රාග චේතනා, ද්වේෂ චේතනා, මෝහ චේතනා සහ අනෙකුත් චෛතසික එක්ව සිතක් ගොඩ නැගෙයි. චෛතසිකවල ස්වභාවය අනුව සිත කෙබඳුදැයි තීරණය වෙයි. රාග චේතනාවන් මුල් වී සරාග සිතක්ද, ද්වේෂ චේතනාවන් මුල් වී සදෝස සිතක්ද, මෝහ චේතනාවන් මුල් වී සමෝහ සිතක්ද යනාදි වශයෙන් සිත් සකසයි. මෙසේ රාග චේතනා, ද්වේෂ චේතනා, මෝහ චේතනාවන්ට අනුව සිතක් උප්පාද වීම, පටිච්ච සමුප්පාද සමුදය තුළ **සංඛාර පච්චයා විඤ්ඤාණං** යන න්‍යායෙන් පෙන්වා දෙයි. **සංඛාර ප්‍රත්‍යයෙන් විඤ්ඤාණ හටගනියි.**

එසේ වර්තමානයේ අලුතින් උප්පාද වූ සිත (රාග සිත, ද්වේෂ සිත, මෝහ සිත) අනුව ඒ මොහොතේ සිත කය දෙකේ ක්‍රියාකාරිත්වය වෙනස් වෙයි. ඒ ඒ මොහොතේ හට ගන්නා සිතේ ස්වභාවයට අනුකූලව ඒ ඒ මොහොතේ සිත කය දෙකේ ස්වභාවය පරිවර්තනය වෙයි. ඒ නිසා ඒ ඒ මොහොතේ උපදිනා සිත අනුව සත්වයා තුළ රාගික ස්වභාවය, වෛරී කිපුණු ස්වභාවය, මෝහ සහගත මාන අහංකාර ස්වභාවය විද්‍යාමාන වෙයි. මෙසේ වර්තමානයේ උපදිනා සිත හේතු කොටගෙන චිත්ත කාය ක්‍රියාවලිය ඊට අනුකූලව පරිවර්තනය වීම, පටිච්ච සමුප්පාද සමුදය තුළ **විඤ්ඤාණ පච්චයා නාමරූපං** යන න්‍යායෙන් පෙන්වා දෙයි. **විඤ්ඤාණ ප්‍රත්‍යයෙන් නාමරූප හටගනියි.**

එසේ පරිවර්තනයට ලක් වූ සිත කය දෙක තුළින් ඇස, කන, නාසය, දිව, ශරීරය, මනස ක්‍රියාත්මක වීම ඇරඹෙයි. ඒ ඒ මොහොතේ සිත කය දෙක මෙහෙයවන විඤ්ඤාණයට අනුව, ඒ ඒ මොහොතේ ඇස, කන, නාසය, දිව, ශරීරය, මනස යන සළායතනයන්ගේ ක්‍රියාකාරිත්වය, ස්වභාවය, ස්වරූපය කෙබඳුදැයි තීරණය වෙයි. ඒ නිසා ඒ ඒ මොහොතේ පවතින චිත්ත කාය ස්වභාවයන්ට අනුකූලව ඇසේ, කණේ, නාසයේ, දිවේ, ශරීරයේ, මනසේ ස්වභාවය, කාමුක රාග සහගත, වෛරී ද්වේෂ සහගත, අඥ්ඥාණ මෝහ සහගත යන ස්වරූපයන් පළ කරයි. මෙසේ වර්තමානයේ සිත කය දෙකේ ස්වභාවය වෙනස්වීම හේතු කොටගෙන, ඊට අනුකූලව ඇස, කන, නාසය, දිව, ශරීරය, මනස යන

ආයතනයන්ගේ ක්‍රියාකාරිත්වය පරිවර්තනය වීම, පටිච්ච සමුප්පාද සමුදය තුළ **නාමරූප පච්චයා සළායතනං** යන න්‍යායෙන් පෙන්වා දෙයි. **නාමරූප ප්‍රත්‍යයෙන් සළායතන හටගනියි.**

එසේ පරිවර්තනයට ලක් වූ ඇස, කන, නාසය, දිව, ශරීරය, මනස යන සළායතන තුළින් අරමුණු රැස් කිරීම සිදුවෙයි. ඇසින් ප්‍රිය රූපද, කනින් ප්‍රිය ශබ්දද, නාසයෙන් ප්‍රිය ගන්ධද, දිවෙන් ප්‍රිය රසද, ශරීරයෙන් ප්‍රිය පහසද, මනසින් ප්‍රිය අදහස්ද රැස් කෙරෙයි. ඇස, කන, නාසය, දිව, ශරීරය, මනස යන සළායතන තුළින් මෙලොව උදෙසා රූප, ශබ්ද, ගන්ධ, රස, පහස, අදහස් රැස් කෙරෙයි. පරලොව උදෙසා කර්ම රැස් කෙරෙයි. මෙලොව පරලොව උදෙසා සියල්ල රැස් කරන අර්ථයෙන් ආයතන වෙයි. ඇස, කන, නාසය, දිව, ශරීරය, මනස මෙසේ ආයතන වශයෙන් ක්‍රියාත්මක වීම හේතු කොටගෙන, දිගින් දිගට ඇසට ප්‍රිය රූපද, කනට  ප්‍රිය ශබ්දද, නාසයට ප්‍රිය ගන්ධද, දිවට ප්‍රිය රසද, ශරීරයට ප්‍රිය පහසද, මනසට ප්‍රිය අදහස්ද ස්පර්ශ වෙයි. මෙසේ අභ්‍යන්තර සළායතන සහ බාහිර සළායතන අඛණ්ඩව එකිනෙක ස්පර්ශ වීම, පටිච්ච සමුප්පාද සමුදය තුළ **සළායතන පච්චයා ඵස්සො** යන න්‍යායෙන් පෙන්වා දෙයි. **සළායතන ප්‍රත්‍යයෙන් ඵස්සය හටගනියි.**

එසේ අඛණ්ඩව අභ්‍යන්තර සළායතන සහ බාහිර සළායතන ස්පර්ශ වීම හේතු කොටගෙන, සෝමනස්ස සහගත සුඛ වේදනා නොහොත් සතුටු සහගත සැප වින්දනය මනසෙහි හට ගනියි. ඊටම ධර්මය තුළ ආස්වාදය යන පදයද ව්‍යවහාර වෙයි. කෙළෙස් සහිත අඤ්ඤාණ ලෝ සතුන් සැපය වශයෙන් ප්‍රාර්ථනා කරන්නේ මෙම ආස්වදයයි. ඇසද රූපද නිසා ආස්වාදය හට ගනියි. කනද ශබ්දද නිසා නිසා ආස්වාදය හට ගනියි. නාසයද ගන්ධද නිසා ආස්වාදය හට ගනියි. දිවද රසද නිසා ආස්වාදය හට ගනියි. ශරීරය පහසද නිසා ආස්වාදය හට ගනියි. මනසද අදහස්ද නිසා ආස්වාදය හට ගනියි. මෙසේ අභ්‍යන්තර සහ බාහිර ආයතන අතර ස්පර්ශය හේතු කොටගෙන සතුටු සහගත සැප වින්දනය හට ගැනීම, පටිච්ච සමුප්පාද සමුදය තුළ **ඵස්ස පච්චයා වේදනා** යන න්‍යායෙන් පෙන්වා දෙයි. **ඵස්ස ප්‍රත්‍යයෙන් වේදනා හටගනියි.**

එසේ අඛණ්ඩව සතුටු සහගත සැප වින්දනය හට ගැනීම හේතු කොටගෙන, මනසේ ඒ කෙරෙහි ඇල්මක් හට ගනියි. සැප වින්දනයේ හිත ඇලෙයි. ආස්වාදය ගැන හිතේ ඇල්මක් හට ගනියි. ආස්වාදය, සතුට, සතුටු සහගත සැප වින්දනය ලබාදෙන පණ ඇති, පණ නැති සියල්ල කෙරෙහි ආලයක් හට ගනියි. ඇස රූප, කන ශබ්ද, නාසය ගන්ධ, දිව රස, ශරීරය පහස, මනස අදහස් යන සියල්ල ගැන ප්‍රිය භාවයක් ඇතිවෙයි. එම ප්‍රිය වස්තූන් සියල්ල ගැන මනසේ ප්‍රේමය හට ගනියි. මෙසේ සෝමනස්ස සහගත සුඛ වේදනා නොහොත් සතුටු සහගත සැප වින්දනය හේතු කොටගෙන, ඒ සැප වින්දනය ලබා දෙන සියල්ල කෙරෙහි ඇල්ම, ආලය හට ගැනීම, පටිච්ච සමුප්පාද සමුදය තුළ **වේදනා පච්චයා තණ්හා** යන න්‍යායෙන් පෙන්වා දෙයි. **වේදනා ප්‍රත්‍යයෙන් තණ්හාව හටගනියි.**

එසේ අඛණ්ඩව ඇල්ම, ආලය හට ගැනීම හේතු කොටගෙන, මනසේ ආස්වාදය පිළිබඳ දැඩි අදහස්, දෘෂ්ටි, බලාපොරොත්තු, අත්තනෝමත හට ගනියි. කෙසේද යත්, මේ මේ ආකාරයෙන් ආස්වාදය ලද යුතුය යනුවෙන් අදහස් ඇතිවෙයි. තවද, යහපත් ආකාරයෙන් හෝ අයහපත් ආකාරයෙන් හෝ, කාම සමාචාරයෙන් හෝ කාම

විසමාචාරයෙන් හෝ ආසාවන් ඉටු කරගත යුතු බවට දෘෂ්ටි ඇතිවෙයි, රාගයෙන් මනස දැඩිව මත්වීම නිසා පින් පව් නැතැයි, මෙලොව පරලොව නැතැයි, කර්මය කර්ම විපාක නැතැයි දෘෂ්ටි ඇතිවෙයි. තවද, කාමය, ආස්වාදය ගැන සෑහීමකට තෘප්තියකට පත් නොවන මනස, මතු මතුත් වැඩි වැඩියෙන් කාමයම ප්‍රාර්ථනා කරයි, මතු මතුත් කාමයම බලාපොරොත්තු වෙයි. තවද, ආස්වාදය තම තමාගේ අභිලාෂයන්ට අනුව විඳියි. ජීවිතය ගැන, අත්භවය ගැන, සිත කය ගැන, අරමුණු ගැන, තම තමන්ට ආවේණික තම තමන්ගේ අදහස්වල එල්බගෙන සිටියි. කාමය කෙරෙහි ඇති ඇල්ම හේතුවෙන් හට ගන්නා මෙම දැඩි අදහස්, දෘෂ්ටි, බලාපොරොත්තු, අත්තනෝමත ධර්මය තුළ උපාදාන නම් වෙයි. උපාදාන යනු සත්වයාගේ ගති ස්වභාවයයි. මෙසේ ආස්වාදය කෙරෙහි වන ඇල්ම නොහොත් ආලය හේතු කොටගෙන, මනසේ ගති ස්වභාව හට ගැනීම, පටිච්ච සමුප්පාද සමුදය තුළ **තණ්හා පච්චයා උපාදානං** යන න්‍යායෙන් පෙන්වා දෙයි. **තණ්හා ප්‍රත්‍යයෙන් උපාදාන හටගනියි.**

එසේ හට ගන්නා ගති ස්වභාව නොහොත් උපාදාන හේතු කොටගෙන අඛණ්ඩව පුණ්‍ය ශක්තිය, පාප ශක්තිය වශයෙන් රැස්වෙයි. කෙනෙක් සිත කය ඇසුරේ නොහොත් පංච උපාදානස්කන්ධය තුළ ආත්මයක් ඇත යන ශාස්වත දෘෂ්ටියේ පිහිටා පුණ්‍ය ශක්තිය රැස් කරයි. කෙනෙක් සිත කය ඇසුරේ නොහොත් පංච උපාදානස්කන්ධය තුළ ආත්මයක් නැත යන උච්ඡේද දෘෂ්ටියේ පිහිටා පාප ශක්තිය රැස් කරයි. දෙදෙනාටම කර්ම ශක්තිය රැස් වෙයි. මනසේ කර්ම ශක්තිය රැස්වීම, **කර්මභවය** ලෙස හඳුන්වයි. කර්මභවය යනු කර්මයෙන් අත්භවය සකස් කරන්නේය යන අර්ථයයි. රාග, ද්වේෂ, මෝහ චේතනා තුළින් උපදින කර්ම ශක්තිය මෙම කර්මභවයේ පිහිටයි. සත්වයාගේ පරලොව පුනර්භවය තීරණය වන්නේ, මෙලොව කර්මභවයට අනුකූලව ය. කර්මභවය යම් සේද පුනර්භවය එසේ ය. යම් හෙයකින් කර්මභවයේ පිහිටි කර්ම ශක්තිය තුළ පාපී ශක්තිය බලවත් නම්, සත්වයා මරණින් පසු පාපයේ දුක් විපාක ඇති දුගතියේ උපදියි. යම් හෙයකින් කර්මභවයේ පිහිටි කර්ම ශක්තිය තුළ පුණ්‍ය ශක්තිය බලවත් නම්, සත්වයා මරණින් පසු පිනේ සැප විපාක ඇති සුගතියේ උපදියි. කර්මභවය නිරුද්ධ වුවහොත් කිසිඳු තැනක නූපදියි. මෙසේ සත්වයාගේ ගති ස්වභාවයට අනුව අඛණ්ඩව කර්ම රැස්වීම, පටිච්ච සමුප්පාද සමුදය තුළ **උපාදාන පච්චයා භවො** යන න්‍යායෙන් පෙන්වා දෙයි. **උපාදාන ප්‍රත්‍යයෙන් භවය හටගනියි.**

එසේ හට ගත්තා වූ කර්මභවය අනුව, මරණින් පසු හිමිවන අත්භවයේ ස්වභාවය තීරණය වෙයි. නිරය, අසුර, ප්‍රේත, තිරිසන් යන සතර අපාය, මනුෂ්‍ය ලෝකය, දිව්‍ය ලෝක හය යන එකොළොස් ලෝකය, කාම ලෝක නම් වෙයි. ප්‍රාණඝාතාදි දස අකුසලයේ යෙදෙමින් දුශ්චරිතයම වඩමින් පාපී අකුසල ශක්තියම උපදවා ගත් අඥ්ඥාණ අන්ධ බාල සත්වයා මරණින් පසු, අති බිහිසුණු නිරය සහිත සතර අපායේ නොහොත් කාම දුගතියේ උපදියි. ප්‍රාණඝාතාදි දස අකුසලයෙන් වැළකී සුචරිතයම වඩමින් දානය සහ සීලය යන පුණ්‍ය කර්ම දෙක බහුලව සිදු කරමින් කාමාවචර කුසලය බහුලව වඩවා ගත් සත්වයා මරණින් මතු, මිනිස් ලොව සහ සදෙව්ලොව යන සප්ත කාම සුගතියේ උපදියි. ලෞකික ධ්‍යාන භාවනා, සමථ භාවනා, සමාපත්ති බහුලව ප්‍රගුණ කරමින් රූපාවචර කුසලය සහ අරූපාවචර කුසලය බහුලව වඩන සත්වයා මරණින් මතු රූපාවචර බ්‍රහ්ම ලෝක දහසයේ සහ අරූපාවචර බ්‍රහ්ම ලෝක හතරේ උපත ලබයි. කර්මභවයේ රැස් වූ

කර්ම ශක්තියට අනුකූලව පුනර්භවය කෙබඳු විය යුතුදැයි කර්මය මගින්ම තීරණය වෙයි. ඊට කිසිවෙකු හෝ කිසිදු බලවේගයක් මැදිහත් නොවෙයි. කර්මභවය යම් සේද, පුනර්භවය එසේයි. මෙසේ තමන් හෝ අනුන් හෝ මුල් නොවී කර්මභවයට අනුව සත්වයාගේ පරලොව උපත තීරණය වීම හා ඒ අනුව උපත ලැබීම, පටිච්ච සමුප්පාද සමුදය තුළ **භව පච්චයා ජාති** යන න්‍යායෙන් පෙන්වා දෙයි. **භව ප්‍රත්‍යයෙන් ජාතිය හටගනියි.**

එසේ නැවත ජාතියක් හටගත් තැන ඒකාන්තයෙන්ම ජරාව නොහොත් මහලු බව පවතී. මරණය නොහොත් අත්භවයේ අවසානයක් පවතී. උපතක් ඇති තැන ඒකාන්තයෙන් ජරාවක් සහ මරණයක් පවතී. උපත සහ මරණය අතරතුර, සත්වයාගේ අවිජ්ජාව සහ තණ්හාව හේතුවෙන් අප්‍රමාණ සෝක, පරිදේව, දුක්ඛ, දෝමනස්ස, උපායාස හට ගනියි. මේ ආකාරයෙන් නැවත ජරා මරණ සහිත අසාර දුක්ඛස්කන්ධය ජනිත වෙයි. මෙසේ ජාතිය නොහොත් උපත හේතු කොටගෙන ජරා මරණ සහිත දුක්ඛස්කන්ධය ජනිත වීම, පටිච්ච සමුප්පාද සමුදය තුළ **ජාති පච්චයා ජරා මරණං සොක පරිදෙව දුක්ඛ දොමනස්ස උපායාසා සම්භවන්ති, එවමෙතස්ස කෙවලස්ස දුක්ඛක්ඛන්ධස්ස සමුදයො හොති** යන න්‍යායෙන් පෙන්වා දෙයි. **ජාතිය ප්‍රත්‍යයෙන් ජරා මරණ සෝක පරිදේව දුක්ඛ දෝමනස්ස උපායාස යන සම්පූර්ණ දුක්ඛස්කන්ධය ජනිත වෙයි.**

සසර උදා කරන අනුලෝම පටිච්ච සමුප්පාදය

**අවිජ්ජා පච්චයා සංඛාරා**

**සංඛාර පච්චයා විඤ්ඤාණං**

**විඤ්ඤාණ පච්චයා නාමරූපං**

**නාමරූප පච්චයා සළායතනං**

**සළායතන පච්චයා ඵස්සො**

**ඵස්ස පච්චයා වේදනා**

**වේදනා පච්චයා තණ්හා**

**තණ්හා පච්චයා උපාදානං**

**උපාදාන පච්චයා භවො**

**භව පච්චයා ජාති**

**ජාති පච්චයා ජරා මරණං සොක පරිදෙව දුක්ඛ දොමනස්ස උපායාසා සම්භවන්ති, එවමෙතස්ස කෙවලස්ස දුක්ඛක්ඛන්ධස්ස සමුදයො හොති.**

අවිජ්ජා ප්‍රත්‍යයෙන් සංඛාර හටගනියි

සංඛාර ප්‍රත්‍යයෙන් විඥ්ඥාණ හටගනියි

විඥ්ඥාණ ප්‍රත්‍යයෙන් නාමරූප හටගනියි

නාමරූප ප්‍රත්‍යයෙන් සළායතන හටගනියි

සළායතන ප්‍රත්‍යයෙන් ඵස්සය හටගනියි

ඵස්ස ප්‍රත්‍යයෙන් වේදනා හටගනියි

වේදනා ප්‍රත්‍යයෙන් තණ්හාව හටගනියි

තණ්හා ප්‍රත්‍යයෙන් උපාදාන හටගනියි

උපාදාන ප්‍රත්‍යයෙන් භවය හටගනියි

භව ප්‍රත්‍යයෙන් ජාතිය හටගනියි

ජාතිය ප්‍රත්‍යයෙන් ජරා මරණ සෝක පරිදේව දුක්ඛ දෝමනස්ස උපායාස යන සම්පූර්ණ දුක්ඛස්කන්ධය ජනිත වෙයි.

මෙසේ ධර්මයෝ එකිනෙකට හේතුඵල වශයෙන් ආහාර වෙමින්, ප්‍රත්‍ය වෙමින්, හේතු වෙමින් ස්වකීය පැවැත්ම පවත්වනු ලබයි. ධර්මයෝ විසින්ම ධර්මයන් පුරවයි. ධර්මයෝ විසින්ම ධර්මයන් පවත්වයි. මෙම හේතුඵල ධර්ම ක්‍රියාවලිය මෙසේ පටිච්ච සමුප්පාදය නමින් විස්තර වෙයි.

මෙම පටච්ච සමුප්පාද සමුදය යමෙකුට අවබෝධ වන්නේ නම් ඒ සමගම, එහි නිරෝධයද අවබෝධ වෙයි. මේ හේතු ඇති කල්හී මේ ධර්මයෝ පවතිනු ලබත් නම්, මේ හේතු නොමැති කල්හී මේ ධර්මයෝ නොපවතිනු ලබත් යන හේතුඵල න්‍යායට අනුව, සංසාර දුක අවසන් කරන පටිච්ච සමුප්පාද නිරෝධය එසේ අවබෝධ කර ගන්නා අරිය සාවකයා, මෙලොවදීම නිරෝධය නොහොත් නිවන් සුවය ප්‍රඥාවෙන් ස්පර්ශ කරයි. සිත විමුක්තියට පත්වෙයි. මේ විශ්වයේ සියලූ දුක් අවසන් කර සදාතනික ශාන්තියට නිවීමට සැනසීමට විමුක්තියට පත් කරන පටිච්ච සමුප්පාද නිරෝධය වූ කලී උතුම් වූ නිර්වාණ මාර්ගයයි. ලෝකෝත්තර කුසල මාර්ගයයි.

# පටිච්ච සමුප්පාදයේ නිරෝධය නොහොත් උතුම් නිවන් මග

යමෙක් පටිච්ච සමුප්පාදය තම නුවණින් තත් පරිදි අවබෝධ කරගත හොත්, එම අවබෝධය තුළින් පංච උපාදානස්කන්ධය ගැන කලකිරෙයි. කාමය ගැන කලකිරෙයි. ආස්වාදය ගැන කලකිරෙයි. එම ප්‍රඥාවෙන් ඇති වන කලකිරීම තුළ උපාදානස්කන්ධය ගැන ඇති ආලය, ඇල්ම ක්‍රම ක්‍රමයෙන් දුරු වී යයි. ආසාවන් ක්‍රමක්‍රමයෙන් ක්ෂය වී යයි.

මනස කාමයෙන් වෙන්වන විට, මනසේ ආසාවන් දුරුවන විට, ආස්වාදයේ ආදීනව නිරන්තරයෙන් ප්‍රඥාවෙන් මෙනෙහි කරන විට, මනසේ උපදින රාග, ද්වේෂ, මෝහ චේතනා නොහොත් සංඛාර (කර්ම) ක්‍රමක්‍රමයෙන් දුරු වී යයි. මෙසේ සත්‍යය නුවණින් මෙනෙහි කිරීම හේතු කොටගෙන මනසේ සංඛාර හට නොගැනීම, පටිච්ච සමුප්පාද නිරෝධය තුළ **අවිජ්ජා නිරොධා සංඛාර නිරොධො** යන න්‍යායෙන් පෙන්වා දෙයි. **අවිජ්ජාව නිරෝධ වීමෙන් සංඛාර නිරෝධ වෙයි.**

එසේ හේතුඵල වශයෙන් සංඛාර හට නොගන්නා කල්හී, විඤ්ඤාණ හට නොගනියි. චෛතසික ගොඩ නොනැගෙන කල්හී සිත් නූපදියි. මනසේ රාග, ද්වේෂ, මෝහ චේතනා හට නොගනී නම්, රාග, ද්වේෂ, මෝහ සිත් ඉපදීමට හේතු නොමැති බැවින් එම විඤ්ඤාණ නූපදියි. නිරෝධයට පත්වෙයි. මෙසේ රාග, ද්වේෂ, මෝහ චේතනා නොහොත් සංඛාර හට නොගැනීම හේතු කොටගෙන රාග, ද්වේෂ, මෝහ විඤ්ඤාණ නූපදීම, පටිච්ච සමුප්පාද නිරෝධය තුළ **සංඛාර නිරොධා විඤ්ඤාණ නිරොධො** යන න්‍යායෙන් පෙන්වා දෙයි. **සංඛාර නිරෝධ වීමෙන් විඤ්ඤාණ නිරෝධ වෙයි.**

එසේ රාග, ද්වේෂ, මෝහ විඤ්ඤාණ නූපදින විට, රාග, ද්වේෂ, මෝහ සහිත චිත්ත කාය පරිවර්තනයක් සිදු නොවෙයි. එසේ චිත්ත කාය පරිවර්තනයක් සිදු නොවන විට, ඇසේ, කණේ, නාසයේ, දිවේ, ශරීරයේ, මනසේ ස්වභාවය, කාමුක රාග සහගත, වෛරී ද්වේෂ සහගත, අඥාණ මෝහ සහගත ස්වරූපයන් පළ නොකරයි. රාග, ද්වේෂ, මෝහ විඤ්ඤාණ නූපදින විට සත්වයා තුළ රාග, ද්වේෂ, මෝහ අදහස් හා ක්‍රියා දක්නට නොලැබෙයි. මෙය නාමරූපයන්ගේ නිරෝධයයි. මෙසේ රාග, ද්වේෂ, මෝහ විඤ්ඤාණ නූපදීමෙන් රාග, ද්වේෂ, මෝහ අදහස් චර්යා හට නොගැනීම, පටිච්ච සමුප්පාද නිරෝධය තුළ **විඤ්ඤාණ නිරොධා නාමරූප නිරොධො** යන න්‍යායෙන් පෙන්වා දෙයි. **විඤ්ඤාණ නිරෝධ වීමෙන් නාමරූප නිරෝධ වෙයි.**

එසේ රාග, ද්වේෂ, මෝහ අදහස් චර්යා හට නොගැනීම හේතු කොටගෙන ඇස, කන, නාසය, දිව, ශරීරය, මනස යන සළායතන රාගයෙන්, ද්වේෂයෙන්, මෝහයෙන් ක්‍රියාත්මක නොවෙයි. ඇස, කන, නාසය, දිව, ශරීරය, මනස යන ඉන්ද්‍රියන් මෙලොව උදෙසා රූප, ශබ්ද, ගන්ධ, රස, ස්පර්ශ, අදහස් යන අරමුණුද, පරලොව උදෙසා කර්ම ශක්තියද රැස් කරන ආයතන වශයෙන් ක්‍රියාත්මක නොවෙයි. ඒ නිසාම ඒවා හුදෙක් අරමුණු දැනගන්නා ඉන්ද්‍රියන් වශයෙන් පමණක් ක්‍රියා කරයි. එය සළායතනයන්ගේ නිරෝධයයි. මෙසේ රාග, ද්වේෂ, මෝහ අදහස් චර්යා හට නොගැනීම හේතු කොටගෙන නොහොත් නාමරූප හට නොගැනීම හේතුවෙන් ඇස, කන, නාසය, දිව, ශරීරය, මනස ආයතන වශයෙන් ක්‍රියාත්මක නොවීම, පටිච්ච සමුප්පාද නිරෝධය තුළ **නාමරූප**

**නිරොධා සළායතන නිරොධො** යන න්‍යායෙන් පෙන්වා දෙයි. **නාමරූප නිරෝධ වීමෙන් සළායතන නිරෝධ වෙයි.**

එසේ ඇස, කන, නාසය, දිව, ශරීරය, මනස අභ්‍යන්තර ආයතන වශයෙන් ක්‍රියාත්මක නොවීම හේතු කොටගෙන අඛණ්ඩව රූප, ශබ්ද, ගන්ධ, රස, පහස, අදහස් යන බාහිර ආයතන රාගයෙන් ස්පර්ශවීම වළකියි. අභ්‍යන්තර ආයතන සහ බාහිර ආයතන එකිනෙක ස්පර්ශ වීම නතර වූ විට මනසට එන අරමුණු නවතියි. ඇස, කන, නාසය, දිව, ශරීරය, මනස හුදෙක් අරමුණක් දැන ගන්නා ඉන්ද්‍රියන් වශයෙන් පමණක් ක්‍රියා කිරීම නිසා රාග ස්පර්ශය නිරුද්ධ වී යයි. එය ඵස්ස නිරෝධයයි. මෙසේ ඇසට - රූප, කනට - ශබ්ද, නාසයට - ගන්ධ, දිවට - රස, ශරීරයට - පහස, මනසට - අදහස් වශයෙන් එකිනෙක අඛණ්ඩව රාගයෙන් ස්පර්ශ නොවීම, පටිච්ච සමුප්පාද නිරෝධය තුළ **සළායතන නිරොධා ඵස්ස නිරොධො** යන න්‍යායෙන් පෙන්වා දෙයි. **සළායතන නිරෝධ වීමෙන් ඵස්සය නිරෝධ වෙයි.**

එසේ ඇසට - රූප, කනට - ශබ්ද, නාසයට - ගන්ධ, දිවට - රස, ශරීරයට - පහස, මනසට - අදහස් වශයෙන් එකිනෙක අඛණ්ඩව රාගයෙන් ස්පර්ශ නොවීම, නැතහොත් ආයතන වශයෙන් ක්‍රියාත්මක නොවීම හේතු කොටගෙන, සෝමනස්ස සහගත සුඛ වේදනා නොහොත් සතුටු සහගත සැප වින්දනය හට නොගනියි. වේදනා නිරෝධ වෙයි. එවිට එහි ආස්වාදයක් නොපවතියි. ආස්වාදය යනු රාග සපර්ශය පවතිනතුරු හේතුඵල වශයෙන් හට ගන්නා තාවකාලික සැප වේදනාවකි. ආස්වාදය හේතුඵලයකි. එසේම නැවත නැවත කර්මභවය ගොඩ නැගෙන්නේද ආස්වාදය මුල් කරගෙන ය. ආස්වාදය සැපය යන මිථ්‍යාදෘෂ්ටිය සියලු සංසාර දුක්ඛයන්ට මූල හේතුව වෙයි. ආස්වාදයේ ආදීනව නුවණින් දකින්නා, කාමයෙන්ගෙන් වෙන්ව මනස සංවර කර ගනියි. මෙම සංවර සීලය නිසාම රාග ස්පර්ශය නිරුද්ධ වෙයි. මෙසේ මනසට අරමුණු රාගයෙන් ස්පර්ශ නොවීම හේතුවෙන් සෝමනස්ස සහගත සුඛ වේදනාව උදා නොවීම, පටිච්ච සමුප්පාද නිරෝධය තුළ **ඵස්ස නිරොධා වේදනා නිරොධො** යන න්‍යායෙන් පෙන්වා දෙයි. **ඵස්සය නිරෝධ වීමෙන් වේදනා නිරෝධ වෙයි.**

එසේ සෝමනස්ස සහගත සුඛ වේදනාව නොහොත් ආස්වාදය නූපදින විට සිතේ කිසිවක් ගැන, කිසිවෙක් ගැන ඇල්මක් හට නොගනියි. පණ ඇති, පණ නැති කිසිවක්, කිසිවෙක් කෙරෙහි ආලයක් හට නොගනියි. ඇස - රූප, කන - ශබ්ද, නාසය - ගන්ධ, දිව - රස, ශරීරය - පහස, මනස - අදහස් යන සියල්ල ගැන ඇති ප්‍රියභාවය දුරු වී යයි. පංච උපාදානස්කන්ධය ගැන ඇති ප්‍රේමය මනසින් පහ වී යයි. කාමය, ප්‍රේමය දුක වශයෙන් ප්‍රඥාවෙන් දකියි. ඒ නිසා පංච උපාදානස්කන්ධය කෙරෙහි ඇති ආලය දුරු වී යයි. මෙය තණ්හා නිරෝධයයි. මෙසේ සෝමනස්ස සහගත සුඛ වේදනාව නූපදින විට, පංච උපාදානස්කන්ධය කෙරෙහි ඇති ආලය සිඳීයාම, පටිච්ච සමුප්පාද නිරෝධය තුළ **වේදනා නිරොධා තණ්හා නිරොධො** යන න්‍යායෙන් පෙන්වා දෙයි. **වේදනා නිරෝධ වීමෙන් තණ්හාව නිරෝධ වෙයි.**

එසේ පංච උපාදානස්කන්ධය ගැන ඇති ආලය සිඳීයාම හේතු කොටගෙන, මම මගේ යන දැඩි ඡන්දරාගය දුරු වී යයි. සිත කය කෙරෙහි ඇති බැඳීම දුර්වල වෙයි. මනසේ ආස්වාදය පිළිබඳ දැඩි අදහස්, දෘෂ්ටි, බලාපොරොත්තු, අත්තනෝමත හට නොගනියි.

කෙසේද යත්, මේ මේ ආකාරයෙන් ආස්වාදය ලද යුතුය යනුවෙන් අදහස් ඇති නොවෙයි. තවද, පින් පව් නැතැයි, මෙලොව පරලොව නැතැයි, කර්මය කර්ම විපාක නැතැයි යනාදි දෘෂ්ටි ඇති නොවෙයි, හේතුඵල ධර්මයට අනුව, හේතු ඇති කල්හී ඵලය හට ගන්නා බවත්, හේතු නොමැති කල්හී ඵලය හට නොගන්නා බවත්, හේතු අප්‍රමාදිව හංග කළ යුතු බවත් නුවණින් දකියි. තවද, ආස්වාදයෙන් වෙන්ව, කාමයෙන් වෙන්ව වාසය කිරීම නිසා අනාගත කාමයන්, අනාගත අත්භවයන් ගැන බලාපොරොත්තු අපේක්ෂා ඇති නොවෙයි. තවද, පංච උපාදානස්කන්ධයේ අසාරත්වය, ආත්මීය සාරයෙන් ශුන්‍ය ස්වභාවය ප්‍රඥාවෙන් දකින නිසා අත්භවය ගැන මුළා සහගත අත්තනොමත (මමත්වයේ අදහස්) ඇති නොවෙයි. එය උපාදානයන්ගේ නිරෝධයයි. මෙසේ පංච උපාදානස්කන්ධය කෙරෙහි ඇති ඡන්දරාගය දුරුවන විට මනසේ දැඩිව බැසගෙන තිබූ කාම අදහස්, දෘෂ්ටි, අනාගත අපේක්ෂා, මමත්වයේ අදහස් යන ගති උපාදාන දුරු වී යාම, පටිච්ච සමුප්පාද නිරෝධය තුළ **තණ්හා නිරොධා උපාදාන නිරොධො** යන න්‍යායෙන් පෙන්වා දෙයි. **තණ්හා නිරෝධ වීමෙන් උපාදාන නිරෝධ වෙයි.**

එසේ උපාදාන නිරෝධ වීම හේතු කොටගෙන මනසේ පුණ්‍ය ශක්තිය, පාප ශක්තිය වශයෙන් රැස් නොවෙයි. පටිච්ච සමුප්පාදය නුවණින් අවබෝධ කර ගැනීම තුළ, සිත කය ඇසුරේ නොහොත් පංච උපාදානස්කන්ධය තුළ ආත්මයක් ඇත යන ශාස්වත දෘෂ්ටියත්, පංච උපාදානස්කන්ධය තුළ ආත්මයක් නැත යන උච්ඡේද දෘෂ්ටියත් යන දෘෂ්ටිද්වයෙන් සමන්විත සක්කායදිට්ඨිය දුරු වී යයි. පටිච්ච සමුප්පාදය සිය ප්‍රඥාවෙන් අවබෝධ කර ගන්නා සුතවත් අරිය සාවකයා, නැවත අත්භවය නම් වූ දුක්ඛස්කන්ධය ප්‍රාර්ථනා නොකරයි. එබැවින් මනසේ පුණ්‍ය පාප වශයෙන් කර්ම ශක්තිය රැස් නොවෙයි. කර්ම ශක්තිය රැස් නොවන කල්හී මනසේ කර්මභවය නොපිහිටයි. නව කර්ම රැස් නොවන කල්හී පුනර්භවය සකස් නොවෙයි. එය භව නිරෝධයයි. කර්මභවය අවසන් වූ විට නැවත පුනර්භවයක් සකස් කර ගැනීමේ ශක්තිය ඒ විඤ්ඤාණය සතුව නොපවතී. මෙසේ උපාදාන නිරෝධ වීම හේතු කොටගෙන මනසේ පුණ්‍ය ශක්තිය හා පාප ශක්තිය රැස් නොවීම, පටිච්ච සමුප්පාද නිරෝධය තුළ **උපාදාන නිරොධා භව නිරොධො** යන න්‍යායෙන් පෙන්වා දෙයි. **උපාදාන නිරෝධ වීමෙන් භවය නිරෝධ වෙයි.**

එසේ කර්මභවය නිරෝධ වීම හේතු කොටගෙන නැවත උපතක් සඳහා ඇති හේතු අවසන් වෙයි. කාමවචර කුසල අකුසල කර්ම අවසන් වීමෙන් කාමාවචර ලෝක එකොළහේ සිදුවන උපත අවසන් වෙයි. රූපාවචර කුසල කර්ම අවසන් වීමෙන් රූපාවචර බ්‍රහ්ම ලෝක දහසයේ සිදුවන උපත අවසන් වෙයි. අරූපාවචර කුසල කර්ම අවසන් වීමෙන් අරූපාවචර බ්‍රහ්ම ලෝක හතරේ සිදුවන උපත අවසන් වෙයි. කර්මභවය සහමුලින්ම නිරුද්ධ වීමෙන් තිස් එක් තලයේම සිදුවන උපත අවසන් වෙයි. උපත නොමැති තැන විපත නොමැත. කර්මභවය ක්ෂය කිරීමෙන්, විඤ්ඤාණයට නැවත පුනර්භවයක් සකසා ගැනීමට නොහැකි වෙයි. මුලක් අගක් නොදන්නා වූ අති දීර්ඝ සසර ගමනක ජරා මරණ අතර සැරිසරන සත්වයාට, කවදා හෝ මේ උතුම් සද්ධර්මය අසා අවබෝධ කර, කර්මභවය ක්ෂය කරන තුරුම, හේතුඵල දහමට අනුව උපදිමින් අප්‍රමාණ දුක් ගිනි උහුලමින් මිය යන්නට සිදුවෙයි. කර්මභවය නිරෝධ වීමෙන් කාම, රූප, අරූප යන තුන් ලෝකයේම උපත නිමා වෙයි. සියලු ජාති අවසන් වෙයි. මෙය

ජාති නිරෝධයයි. මෙසේ පුණ්‍ය ශක්තිය හා පාප ශක්තිය වශයෙන් කර්මභවය සකස් නොවීම හේතුවෙන් පංච උපාදානස්කන්ධයේ උපත නිමා වීම, පටිච්ච සමුප්පාද නිරෝධය තුළ **භව නිරොධා ජාති නිරොධො** යන න්‍යායෙන් පෙන්වා දෙයි. **භව නිරෝධ වීමෙන් ජාතිය නිරෝධ වෙයි.**

එසේ නැවත උපතක් නැති තැන ජරාව නොහොත් මහලුබව නොපවතී, මරණය නොපවතී. උපතක් නැති තැන ඒකාන්තයෙන්ම ජරාව සහ මරණය විද්‍යාමාන නොවෙයි. උපතක් මරණයක් නොමැති තැන, සෝක, පරිදේව, දුක්ඛ, දෝමනස්ස, උපායාසද යන දුක්ඛයෝද නොපවතී. මේ ආකාරයෙන් ජරා මරණ සහිත අසාර දුක්ඛස්කන්ධය කෙළවර වෙයි. මෙසේ ජාතිය නොහොත් උපත අවසන් වීම හේතු කොටගෙන ජරා මරණ සහිත දුක්ඛස්කන්ධය නිරුද්ධ වීම, පටිච්ච සමුප්පාද නිරෝධය තුළ **ජාති නිරොධා ජරා මරණං සොක පරිදෙව දුක්ඛ දොමනස්ස උපායාසා නිරුජ්ඣන්ති, එවමෙතස්ස කෙවලස්ස දුක්ඛක්ඛන්ධස්ස නිරොධො හොති** යන න්‍යායෙන් පෙන්වා දෙයි. **ජාතිය නිරෝධ වීමෙන් ජරා මරණ සෝක පරිදේව දුක්ඛ දෝමනස්ස උපායාස යන සම්පූර්ණ දුක්ඛස්කන්ධය කෙළවර වෙයි.**

මේ සංක්ෂිප්තව විස්තර කරන ලද්දේ පටිච්ච සමුප්පාදය ක්‍රියාත්මක වන ආකාරය සහ එය නිරුද්ධ වන ආකාරයයි. නැතහොත් පටිච්ච සමුප්පාදයේ සමුදය සහ නිරෝධයයි.

උතුම් බුද්ධෝත්පාද කාලයක, උතුම් සද්ධර්මය පැතිර ඇති රටක භූමි ප්‍රදේශයක, උතුම් සම්‍යක් දෘෂ්ටික කුලයක, උතුම් මනුසත් භවයක් ලබා ඉපිද, සත් පුරුෂයන් වෙතින් ඒ සද්ධර්මය අප්‍රමාදීව අසා අවබෝධ කර ගැනීමට යමෙකුට අවස්ථාව උරුම වන්නේ ඔහුගේ අනන්ත අප්‍රමාණ පුණ්‍ය ශක්තිය නිසා ය. ධර්මය අවබෝධ කර ගැනීම යනු මෙම පටිච්ච සමුප්පාදය අවබෝධ කර ගැනීමයි. උපත, ජරාව, මරණය සහිත දුක්ඛස්කන්ධය පහළ කරන මෙම පටිච්ච සමුප්පාද න්‍යාය ධර්මය මනාව අවබෝධ කර ගැනීමෙන්, එම භයානක ජරා මරණයෙන් සදහටම නිදහස් වීමට හැකි වේ. පටිච්ච සමුප්පාදය ප්‍රඥාවෙන් දැකීමෙන් මනස දමනය කරගත හැකි න්‍යාය අවබෝධ වේ. එසේ මනස දමනය කරන්නා වූ, සිත පිරිසිදු කරන්නා වූ බුද්ධ ශ්‍රාවක තෙමේ ඒකාන්තයෙන් ජරා මරණ සහිත අසාර පංච උපාදානස්කන්ධ ලෝකයෙන් සදහටම අතමිදී සදාතනික විමුක්තිය උරුම කර ගන්නේ ය. අමෘත මහා නිර්වාණයට පත් වන්නේ ය.

## සසර නිමා කරන ප්‍රතිලෝම පටිච්ච සමුප්පාදය

**අවිජ්ජා නිරොධා සංඛාර නිරොධො**

**සංඛාර නිරොධා විඤ්ඤාණ නිරොධො**

**විඤ්ඤාණ නිරොධා නාමරූප නිරොධො**

**නාමරූප නිරොධා සළායතන නිරොධො**

**සළායතන නිරොධා ඵස්ස නිරොධො**

**ඵස්ස නිරොධා වේදනා නිරොධො**

**වේදනා නිරොධා තණ්හා නිරොධො**

**තණ්හා නිරොධා උපාදාන නිරොධො**

**උපාදාන නිරොධා භව නිරොධො**

**භව නිරොධා ජාති නිරොධො**

**ජාති නිරොධා ජරා මරණං සොක පරිදෙව දුක්ඛ දොමනස්ස උපායාසා නිරුජ්ඣන්ති, ඵවමෙතස්ස කෙවලස්ස දුක්ඛක්ඛන්ධස්ස නිරොධො හොති.**

**අවිජ්ජාව නිරෝධ වීමෙන් සංඛාර හට නොගනියි.**

**සංඛාර නිරෝධ වීමෙන් විඤ්ඤාණ හට නොගනියි.**

**විඤ්ඤාණ නිරෝධ වීමෙන් නාමරූප හට නොගනියි.**

**නාමරූප නිරෝධ වීමෙන් සළායතන හට නොගනියි.**

**සළායතන නිරෝධ වීමෙන් ඵස්සය හට නොගනියි.**

**ඵස්ස නිරෝධ වීමෙන් වේදනාව හට නොගනියි.**

**වේදනා නිරෝධ වීමෙන් තණ්හාව හට නොගනියි.**

**තණ්හා නිරෝධ වීමෙන් උපාදාන හට නොගනියි.**

**උපාදාන නිරෝධ වීමෙන් භවය හට නොගනියි.**

**භව නිරෝධ වීමෙන් ජාතිය හට නොගනියි.**

**ජාති නිරෝධ වීමෙන් ජරා මරණ සෝක පරිදේව දුක්ඛ දෝමනස්ස උපායාස යන සම්පූර්ණ දුක්ඛස්කන්ධය කෙළවර වෙයි.**

**යො පටිච්ච සමුප්පාදයං පස්සති - සො ධම්මං පස්සති**

**යො ධම්මං පස්සති - සො මං පස්සති**

යමෙක් පටිච්ච සමුප්පාදය නුවණින් දකින්නේද, ඔහු ධර්මය දකින්නේ ය.

යමෙක් ධර්මය දකින්නේද, ඔහු නිවන දකින්නේ ය.

# තුන් ලෝ සතුන් තුන් කල් දවන තුන්විධ ගින්න

සකල ලෝක සත්වයාට අපමණ දුක් වේදනා උරුම කරදෙන ගින්දර විවිධාකාර වෙයි. ඛුද්දක නිකායේ, ඉතිවුත්තකපාළියේ, තිකනිපාතයේ, පඤ්චමවග්ගයේ එන අග්ගි සූත්‍රයේ, සසර සියලු දුක් වේදනා උපදවන ප්‍රධාන ගිනි තුන පෙන්වා දෙයි.

**තයොමෙ, භික්ඛවෙ, අග්ගී. කතමෙ තයො? රාගග්ගි, දොසග්ගි, මොහග්ගි, ඉමෙ ඛො, භික්ඛවෙ, තයො  අග්ගී ති.**

මහණෙනි, මේ ගිනි තුන් ආකර වෙත්. කවර තුනක්ද යත් ? රාගය නමැති ගින්නය, ද්වේෂය නමැති ගින්නය, මෝහය නමැති ගින්නය. මහණෙනි, මේ වනාහි තුන් ආකාර වූ ගිනි වෙති.

**එතමත්ථං භගවා අවොච. තත්ථෙතං ඉති වුච්චති,** ඉනික්බිති භාග්‍යවතුන් වහන්සේ එහිදී මෙසේ ද දෙසූ සේක.

**රාගග්ගි දහති මච්චෙ, රත්තෙ කාමෙසු මුච්ඡිතෙ**

**දොසග්ගි පන බ්‍යාපන්නෙ, නරෙ පාණාතිපාතිනො**

රාගය නමැති ගින්න, කාමයන්හී ඇලුණා වූ මූර්ඡා වූ සත්වයන් දවයි.
ද්වේෂය නමැති ගින්නේ දැවෙන නපුරු සිත් ඇති සත්වයෝ ප්‍රාණඝාත ආදි පව්කම් කරමින් දැවෙත්.

**මොහග්ගි පන සම්මූළ්හෙ, අරියධම්මෙ අකොවිදෙ**

**එතෙ අග්ගී අජානන්තා, සක්කාය අභිරතා පජා**

ආර්ය ධර්මයෙහි අදක්ෂ වූ අතිශයින් මූළා වූ සත්වයන් මෝහ ගින්නෙන් දවයි.
මේ තුන් ගිනි නොදන්නා වූ සත්වයෝ, දුක්ඛස්කන්ධය වූ පංච උපාදානස්කන්ධයෙහි සතුටින් ඇලුණාහු ය.

**තෙ වඩ්ඪයන්ති නිරයං, තිරච්ඡානඤ්ච යොනියො**

**අසුරං පෙත්ති විසයං, අමුත්තා මාර බන්ධනා**

ඒ සත්වයෝ අට මහ නිරයද, තිරිසන් යෝනියද, විනිපාතික අසුරයද, ප්‍රේත විෂයයද වඩත්. ඔව්හු මාර බන්ධනයෙන් නොමිදුණාහු ය.

**යෙ ච රත්තින්දිවා යුත්තා, සම්මාසම්බුද්ධ සාසනෙ**

**තෙ නිබ්බාපෙන්ති රාගග්ගිං, නිච්චං අසුභසඤ්ඤිනො**

යම් කෙනෙක් වනාහි රෑ දාවල් දෙක්හී සම්මා සම්බුද්ධ අනුසාසනය අනුව ධර්මානුධර්ම පටිපදාවේ යෙදුණාහුද, නිතර අශුභ සංඥාවෙන් යුක්ත වූ ඒ අරිය සාවකයා රාග ගින්දර නිවා දමන්නේ ය.

**දොසග්ගිං පන මෙත්තාය, නිබ්බාපෙන්ති නරුත්තමා**

**මොහග්ගිං පන පඤ්ඤාය, යායං නිබ්බෙධගාමිනී**

උතුම් මනුෂ්‍යයෝ මෛත්‍රිසහගත සිතින් වාසය කරමින්, ද්වේෂය නමැති ගින්දර නිවත්. නිවන් මාර්ගයේ ගමන් කරන්නා වූ අරිය සාවකයා, ප්‍රඥාවෙන් මෝහය නමැති ගින්දර ද නිවන්නේ ය.

**තෙ නිබ්බාපෙත්වා නිපකා, රත්තින්දිව මතන්දිතා**

**අසෙසං පරිනිබ්බන්ති, අසෙසං දුක්ඛ මච්චගුං**

සියලු ගිනි නිවූ, දිවා රෑ සිහියෙන් යුක්තව වාසය කරන්නා වූ ඒ දක්ෂ වූ අරිය සාවකයෝ, ස්කන්ධ ඉතිරි නොකොට සියලු දුකින් අතමිදී පිරිනිවනට පත්වෙති.

**අරියද්දසා වෙදගුනො, සම්මදඤ්ඤාය පණ්ඩිතා**

**ජාතික්ඛය මභිඤ්ඤාය, නාගච්ඡන්ති පුනබ්භවන්ති**

ආර්ය ධර්මය වූ චතුරාර්ය සත්‍යය දක්නා වූ සම්‍යක් ඥාණය ඇත්තා වූ පණ්ඩිතයෝ, ඉපදීම ක්ෂය වූ නිවන විශිෂ්ඨ ප්‍රඥාවෙන් අවබෝධ කොට, පුනර්භවයට නොපැමිණෙත්.

සසර තුළ සත්වයා දවන සියලු කායික මානසික දුක් පීඩාවලට හේතුව මනසේ හට ගන්නා වූ මේ තුන්විධ ගින්නයි. සියලු සසර දුක් ගිනි උපදවන හේතු බැවින්, **රාගය, ද්වේෂය, මෝහය** සසර **ගින්දර** ලෙසත්, ඒ ගිනි සහමුලින්ම අවසන් කිරීම **සදාතනික නිවීම** නොහොත් **නිවන** ලෙසත් ප්‍රඥාවෙන් දැකිය යුත්තේ ය. **නිවන යනු සියලු රාග, ද්වේෂ, මෝහ ගිනි නිවීමයි.**

මේ භයානක සසර පුරා නොයෙක් ලෝකවල නොයෙක් තලවල අනන්ත සත්වයෝ අනන්ත අප්‍රමාණ දුක් ගින්නෙන් දැවෙති. හඬති වැළපෙති. සත්වයෝ සිතින් සහ කයින් යන දෙකෙන්ම දැවෙති. එකසිය තිස් හයක් අති භයංකාර නිරවල සත්වයෝ අප්‍රමාණ භයංකාර ගිනිදැල් මැද්දේ කයින්ද දැවෙති. කල්ප ගණන් ඉහිලුම් නොදෙන තාපය මැද දැවෙති.

| | | |
|---|---|---|
| **සිතුවත් බිය කරවන අරතර** | | **යේ** |
| **වැටුණොත් එකසිය සතිසක්** | **නිර** | **යේ** |
| **බලවත් දුක් විඳිනෙය කරදර** | | **යේ** |
| **මඳකුත් පිනකට නැත අවසර** | | **යේ** |

නිරයේ බිහිසුණු බව ගැන ලෝවැඩ සඟරාවේ කවියක එසේ දැක්වෙයි. සතර අපාගත සත්වයෝ බොහෝ කොටම සිතින් සහ කයින් යන දෙකෙන්ම දුක් විඳිති. කය කටුක වේදනාවන්ගෙන් දැවෙති. සිත තියුණු මානසික පීඩාවන්ගෙන් දැවෙති. එබැවින් සතර අපායේ ඇත්තේ අප්‍රමාණ දුකකි. ඔවුන්ට මුළු ජීවිතයම ගිනි හුලකි.

මනුෂ්‍ය සුගතියේද, බොහෝ කායික දුක්ඛයන් ඇත. මිනිස් කයේ හට ගන්නා වූ අට අනූවක් රෝග, නව අනූවක් ව්‍යාධි, දෙසිය තුනක් අන්තරා ඇත. මිනිස් කය බොහෝ ආබාධයන්ගෙන් පීඩා විඳියි. එසේම සිතටද අප්‍රමාණ පීඩා දාහයන් ඇති කරන්නා වූ සිදුවීම් මිනිස් ජීවිත තුළ යෙදේ. එබැවින් මිනිස් ලෝකය තුළද බොහෝ කර්‍කශ කායික සහ මානසික දාහයන් පවතී.

දිව්‍ය සහ බ්‍රහ්ම අත්භවවල කායික දාහයින් බොහෝ අවම වෙයි. දෙවියෝ කයින් බොහෝ සැප විඳිති. එසේම සිතින්ද බොහෝ සොම්නස විඳිති. නමුත් ස්වකීය කාමයන් නිසා දෙවියන් සිතින් බොහෝ දුක් දොම්නස්ද උසුලති. එබැවින් දෙවියන්ට කායික පීඩාවන් එතරම් නැතත්, මානසික දාහය බහුල වශයෙන් පවතී.

බ්‍රහ්මයන්ට කායික වශයෙන් කිසිදු දාහයක් හට නොගනයි. ඊට හේතුව බ්‍රහ්මයන් තුළ කාය විඤ්ඤාණයක් හට නොගැනීමයි. නමුත් බ්‍රහ්මයන්ටද මානසික වශයෙන් නොයෙක් දාහයන් හට ගනියි. බ්‍රහ්ම ලෝකය තුළද මානය වැනි සියුම් කෙළෙස් නිසා හට ගන්නා සියුම් මානසික දාහයක් පවතී. ජරා, මරණ දුක පවතී. විපරිණාම දුක පවතී.

එබැවින් තිස් එක් තලයේ කොතැන අත්භවයක් ලැබුවත් එහි ඇත්තේ දුක් ගින්දරයි. එකොළොස් ගින්නයි. ඒ එකොළොස් ගින්න සදහටම නිමා කළ හැකි මගක් වේද, ඒ රාගය, ද්වේෂය, මෝහය ක්ෂය කරන නිර්වාණ මාර්ගයයි. ඒ එකොළොස් ගින්න සදහටම නිවුණු යම් තැනක් වේද, ඒ අමෘතය නම් වූ ශාන්ත ප්‍රණීත සදාතනික නිවනයි. **අසංඛත නිර්වාණ ධාතුවයි.**

# ගින්න සහ නිවන තමා තුළින්ම දැකගත හැක්කේය

ස්වකීය මනසේ හට ගන්නා දැවීම සහ නිවීම තමාටම අත් දැකිය හැක්කේ ය. මනස දැවෙන බව දන්නේද තමන් ය. මනස නිවුණ බව දන්නේද තමන් ය. නිවන තමන්ට අත්දැකිය හැකි වන්නේ ය.

අංගුත්තර නිකායේ, තිකනිපාතපාළියේ, බ්‍රාහ්මණවග්ගයේ එන සන්දිට්ඨික නිබ්බාන සූත්‍රයේ, මනසේ හටගන්නා කෙළෙස් ගින්දර නිසා සිත දැවෙන ආකාරය හා ඒ කෙළෙස් ගින්දර නිවුණු පසු සිත නිවෙන ආකාරය තමන්ටම ප්‍රත්‍යක්ෂයෙන් දැනගත හැකි ආකාරය, ජාණුස්සෝණි බ්‍රාහ්මණයාගේ ප්‍රශ්නයකට පිළිතුරු දෙමින් භාග්‍යවතුන් පෙන්වා දෙති.

**සන්දිට්ඨිකං නිබ්බානං, සන්දිට්ඨිකං නිබ්බානන්ති, භො ගොතම, වුච්චති. කිත්තාවතා නු ඛො, භො ගොතම, සන්දිට්ඨිකං නිබ්බානං හොති අකාලිකං එහිපස්සිකං ඔපනයිකං පච්චත්තං වෙදිතබ්බං විඤ්ඤූහී ති ?**

භවත් ගෞතමයන් වහන්ස, නිර්වාණය තමා තුළින් දැකිය යුතු ය, නිර්වාණය තමන් තුළින් දැකිය යුත්තක් යැයි කියනු ලැබේ. භවත් ගෞතමයන් වහන්ස, කොපමණකින් වනාහි නිර්වාණය සන්දිට්ඨික වේද ? ආකලික වේද ? ඒහිපස්සික වේද ? ඕපනයික වේද ? පච්චත්තං වේදතබ්බෝ විඤ්ඤූහී වේද ? යි ඇසූයේ ය.

**රත්තො ඛො, බ්‍රාහ්මණ, රාගෙන අභිභූතො පරියාදින්නචිත්තො අත්තබ්‍යාබාධායපි චෙතෙති, පරබ්‍යාබාධායපි චෙතෙති, උභයබ්‍යාබාධායපි චෙතෙති, චෙතසිකම්පි දුක්ඛං දොමනස්සං පටිසංවෙදෙති. රාගෙ පහීනෙ නෙවත්තබ්‍යාබාධායපි චෙතෙති, න පරබ්‍යාබාධායපි චෙතෙති, න උභයබ්‍යාබාධායපි චෙතෙති, න චෙතසිකම්පි දුක්ඛං දොමනස්සං පටිසංවෙදෙති. එවම්පි ඛො, බ්‍රාහ්මණ, සන්දිට්ඨිකං නිබ්බානං හොති.**

බ්‍රාහ්මණය, රාගයෙන් යටපත් කළා වූ, රාගයෙන් හාත්පසින් මඬනා ලද්දා වූ සිත් ඇත්තා වූ තෙමේ, තමන්ටද දුක් පිණිස සිතයි. අනුන්ටද දුක් පිණිස සිතයි. තමන්ටද අනුන්ටද දුක් පිණිස සිතයි. මනසින් දුක්ඛ දෝමනස්සයන්ද විඳියි. රාගය ප්‍රහීණ වූ කල්හි තමන්ටද දුක් පිණිස නොසිතයි. අනුන්ටද දුක් පිණිස නොසිතයි. තමන්ට හා අනුන්ට දුක් පිණිස නොසිතයි. මනසින්ද දුක් දොම්නස් නොවිඳී. බ්‍රාහ්මණය, මෙසේ නිවන තමා තුළින්ම ප්‍රත්‍යක්ෂයෙන් දැකිය හැකි ගුණ ඇත්තේ ය.

**දුට්ඨො ඛො, බ්‍රාහ්මණ, දොසෙන අභිභූතො පරියාදින්නචිත්තො අත්තබ්‍යාබාධායපි චෙතෙති, පරබ්‍යාබාධායපි චෙතෙති, උභයබ්‍යාබාධායපි චෙතෙති, චෙතසිකම්පි දුක්ඛං දොමනස්සං පටිසංවෙදෙති. දොසෙ පහීනෙ නෙවත්තබ්‍යාබාධායපි චෙතෙති, න පරබ්‍යාබාධායපි චෙතෙති, න උභයබ්‍යාබාධායපි චෙතෙති, න චෙතසිකං දුක්ඛං දොමනස්සං පටිසංවෙදෙති. එවම්පි ඛො, බ්‍රාහ්මණ, සන්දිට්ඨිකං නිබ්බානං හොති.**

බ්‍රාහ්මණය, ද්වේෂයෙන් යටපත් කළා වූ, ද්වේෂයෙන් හාත්පසින් මඬනා ලද්දා වූ සිත් ඇත්තා වූ තෙමේ, තමන්ටද දුක් පිණිස සිතයි. අනුන්ටද දුක් පිණිස සිතයි. තමන්ටද අනුන්ටද දුක් පිණිස සිතයි. මනසින් දුක්ඛ දෝමනස්සනයන්ද විඳියි. ද්වේෂය ප්‍රහීණ වූ

කල්හි තමන්ටද දුක් පිණිස නොසිතයි. අනුන්ටද දුක් පිණිස නොසිතයි. තමන්ට හා අනුන්ට දුක් පිණිස නොසිතයි. මනසින්ද දුක් දොම්නස් නොවිඳී. බ්‍රාහ්මණය, මෙසේ නිවන තමා තුළින්ම ප්‍රත්‍යක්ෂයෙන් දැකිය හැකි ගුණ ඇත්තේ ය.

**මූළ්හො බො, බ්‍රාහ්මණ, මොහෙන අභිභූතො පරියාදින්නචිත්තො අත්තබ්‍යාබාධායපි චෙතෙති, පරබ්‍යාබාධායපි චෙතෙති, උභයබ්‍යාබාධායපි චෙතෙති, චෙතසිකම්පි දුක්ඛං දොමනස්සං පටිසංවෙදෙති. මොහෙ පහීනෙ නෙවත්තබ්‍යාබාධායපි චෙතෙති, න පරබ්‍යාබාධායපි චෙතෙති, න උභයබ්‍යාබාධායපි චෙතෙති, න චෙතසිකං දුක්ඛං දොමනස්සං පටිසංවෙදෙති. එවම්පි බො, බ්‍රාහ්මණ, සන්දිට්ඨිකං නිබ්බානං හොති.**

බ්‍රාහ්මණය, මෝහයෙන් යටපත් කළා වූ, මෝහයෙන් හාත්පසින් මඩනා ලද්දා වූ සිත් ඇත්තා වූ තෙමේ, තමන්ටද දුක් පිණිස සිතයි. අනුන්ටද දුක් පිණිස සිතයි. තමන්ටද අනුන්ටද දුක් පිණිස සිතයි. මනසින් දුක්ඛ දෝමනස්සයන්ද විඳියි. මෝහය ප්‍රහීණ වූ කල්හි තමන්ටද දුක් පිණිස නොසිතයි. අනුන්ටද දුක් පිණිස නොසිතයි. තමන්ට හා අනුන්ට දුක් පිණිස නොසිතයි. මනසින්ද දුක් දොම්නස් නොවිඳී. බ්‍රාහ්මණය, මෙසේ නිවන තමා තුළින්ම ප්‍රත්‍යක්ෂයෙන් දැකිය හැකි ගුණ ඇත්තේ ය.

රාගය, ද්වේෂය, මෝහය තමන්ටද දුක් ගින්දර උරුම කරදෙයි. අනුන්ටද දුක් ගින්දර උරුම කරදෙයි. තමන්ටද අනුන්දට දුක් ගින්දර, විනාසය උරුම කරදෙයි. ලෝකය තුළ තුන් කාලයේම දක්නට ඇත්තේ මේ රාග, ද්වේෂ, මෝහ ගින්දරයි.

එසේ නම් ඒ රාගය, ද්වේෂය, මෝහය මනසින් දුරු වී යාමෙන් තමන්ටද නිවීම උරුමවෙයි. අනුන්ටද නිවීම උරුමවෙයි. තමන්ටද අනුන්ටද නිවීම, සැනසීම උරුමවෙයි. එම නිවන තමාටම තම නැණ පමණට එසේ අත්දැකිය හැකි වෙයි. රාගය, ද්වේෂය, මෝහය නිවා දැමීමෙන් ලෝකයේ සියලු ගින්දර නිවා දැමිය හැකි වෙයි. නමුත් අමා මැණි බුදු පියාණන් වහන්සේගේ අමා ධර්මය නොදන්නා කිසිවෙකුට සිය සිත්හී රාගය, ද්වේෂය, මෝහය සදහටම නිවා දැමිය හැකි නොවෙයි. බුදු සසුනින් පිට අන්‍යයන් දන්නේ තාවකාලිකව රාගය, ද්වේෂය, මෝහය යටපත් කරගන්නා ක්‍රම පමණි. නිවන උදෙසාම සසරේ අප්‍රමාණ පින් රැස් කරමින්, පාරමිතා පුරමින් පැමිණි මහා පිනැතියන්ට පමණක් බුදු පියාණන් වහන්සේගේ අමා ධර්මය අසන්නට ලැබෙයි. ඒ උතුම් ධර්මය අප්‍රමාදීව අවබෝධ කර ගන්නා ප්‍රඥාවන්තයන්ට, මනසේ රාගය, ද්වේෂය, මෝහය දුරු කරගන්නා නිර්වාණ මාර්ගයට පිවිසීමට අමරණීය වරම් හිමිවෙයි. උතුම් මාර්ගඵල නිවන් අවබෝධය උරුම වෙයි.

එබැවින් ධර්මය, සන්දිට්ඨික නොහොත් තමා තුළින් දැකි වෙයි. අකාලික නොහොත් ප්‍රතිඵලය ඒ මොහොතේම අත්දැකිය හැකිවෙයි. ඒහි පස්සික නොහොත් තමා විසින්ම පරික්ෂා කළ යුතු වෙයි. ඕපනයික නොහොත් තම තුළින්ම අනුගමනය කළ යුත්තක් වෙයි. පච්චත්තංවේදිතබ්බෝ විඤ්ඤූහී නොහොත් තම තම නැණ පමණට නුවණැත්තන් විසින් ප්‍රත්‍යක්ෂයෙන් අත්දැකිය යුත්තක් වෙයි.

# සියල්ල ඇවිළ ගත්තේය

සිත කය සහ බාහිර අරමුණුවලින් සැදි ලෝකය සහමුලින්ම මහා දුක්ඛස්කන්ධයකි. සිත කය සහ බාහිර ආරම්මණ එක්ව සකස් කරන ලෝකය තුළ සියල්ල ඇතුළත් වෙයි.

සංයුත්තනිකායේ, සළායතන වග්ගපාළියේ, සළායතන සංයුත්තයේ, ඡන්නවග්ගයේ එන, පලොකධම්ම සූත්‍රයට අනුව, ලෝකය යනු කුමක්ද ?

දිනක් ආනන්ද හිමියන් තථාගත බුදු පියාණන් වහන්සේ වෙතින් මෙබඳු ප්‍රශ්නයක් විමසයි.

**ලොකො, ලොකොති, භන්තෙ, වුච්චති. කිත්තාවතා නු ඛො, භන්තෙ, ලොකොති වුච්චතී?**

භාග්‍යවතුන් වහන්ස, ලෝකය, ලෝකය යැයි කියනු ලැබේ. භාග්‍යවතුන් වහන්ස, කොපමණකින් ලෝකය පැණවේද ?

**යං ඛො, ආනන්ද, පලොකධම්මං, අයං වුච්චති අරියස්ස විනයෙ ලොකො.**

ආනන්ද, යම් විනාස ධර්මයක් වේද, ආර්ය විනයේ ඊට ලෝකය කියයි.

සත්වයාට විනාශයක්ම අත් කරදෙමින් විනාශ වී යන බැවින්, ලෝකයට විනාස ධර්ම යන නාමය යෙදෙයි.

**කිඤ්ච, ආනන්ද, පලොකධම්මං? චක්ඛු ඛො, ආනන්ද, පලොකධම්මං, රූපා පලොකධම්මා, චක්ඛුවිඤ්ඤාණං පලොකධම්මං, චක්ඛුසම්ඵස්සො පලොකධම්මො, යම්පිදං චක්ඛුසම්ඵස්සපච්චයා උප්පජ්ජති වෙදයිතං සුඛං වා දුක්ඛං වා අදුක්ඛමසුඛං වා තම්පි පලොකධම්මං.**

ආනන්ද, විනාස ධර්ම මොනවාද? ආනන්ද,

ඇස විනාස ධර්මයකි.

රූපය විනාස ධර්මයකි.

චක්ඛු විඤ්ඤාණය විනාස ධර්මයකි.

චක්ඛු සම්ඵස්සය විනාස ධර්මයකි.

චක්ඛු සම්ඵස්සය නිසා උපදින යම් සුඛ වේදනාවක් හෝ දුක් වේදනාවක් හෝ දුක්ද සැපද නො වූ යම් වේදනාවක් ඇද්ද, එයද විනාස ධර්මයකි.

ඇස යනු කර්ම රැස් කරන ආයතනයකි. ඇසින් ප්‍රිය අප්‍රිය රූප ස්පර්ශ කිරීම හේතුවෙන් කර්ම රැස්වෙයි. කර්ම රැස් වීමෙන් පුනර්භවයක් සකස් වෙයි. පුනර්භවය යනු නැවත ජරා මරණ සහිත දුක්ඛස්කන්ධය උරුම වීමයි. ඇස හේතුවෙන් එසේ නැවත දුක්ඛස්කන්ධය උරුම වෙයි. එසේ ඇස විනාශය අත් කරදෙමින් විනාශ වී යන විනාශකාරි ධර්මයකි. එබැවින් ඇස යනු විනාස ධර්මයකි.

කන විනාස ධර්මයකි.

ශබ්දය විනාස ධර්මයකි.

සෝත විඤ්ඤාණය විනාස ධර්මයකි.

සෝත සම්ඵස්සය විනාස ධර්මයකි.

සෝත සම්ඵස්සය නිසා උපදින යම් සුඛ වේදනාවක් හෝ දුක් වේදනාවක් හෝ දුක්ද සැපද නො වූ යම් වේදනාවක් ඇද්ද, එයද විනාස ධර්මයකි.

නාසය විනාස ධර්මයකි.

ගන්ධය විනාස ධර්මයකි.

ඝාන විඤ්ඤාණය විනාස ධර්මයකි.

ඝාන සම්ඵස්සය විනාස ධර්මයකි.

ඝාන සම්ඵස්සය නිසා උපදින යම් සුඛ වේදනාවක් හෝ දුක් වේදනාවක් හෝ දුක්ද සැපද නො වූ යම් වේදනාවක් ඇද්ද, එයද විනාස ධර්මයකි.

දිව විනාස ධර්මයකි.

රසය විනාස ධර්මයකි.

ජිව්හා විඤ්ඤාණය විනාස ධර්මයකි.

ජිව්හා සම්ඵස්සය විනාස ධර්මයකි.

ජිව්හා සම්ඵස්සය නිසා උපදින යම් සුඛ වේදනාවක් හෝ දුක් වේදනාවක් හෝ දුක්ද සැපද නො වූ යම් වේදනාවක් ඇද්ද, එයද විනාස ධර්මයකි.

කය විනාස ධර්මයකි.

පහස විනාස ධර්මයකි.

කාය විඤ්ඤාණය විනාස ධර්මයකි.

කාය සම්ඵස්සය විනාස ධර්මයකි.

කාය සම්ඵස්සය නිසා උපදින යම් සුඛ වේදනාවක් හෝ දුක් වේදනාවක් හෝ දුක්ද සැපද නො වූ යම් වේදනාවක් ඇද්ද, එයද විනාස ධර්මයකි.

මනස විනාස ධර්මයකි.

අදහස් විනාස ධර්මයකි.

මනෝ විඤ්ඤාණය විනාස ධර්මයකි.

මනෝ සම්ඵස්සය විනාස ධර්මයකි.

මනෝ සම්ඵස්සය නිසා උපදින යම් සුඛ වේදනාවක් හෝ දුක් වේදනාවක් හෝ දුක්ද සැපද නො වූ යම් වේදනාවක් ඇද්ද, එයද විනාස ධර්මයකි.

**එවං උපසංහරති** .......... පෙර සේම සැසඳිය යුතු ........

සත්වයාට මෙලොවත් පරලොවත් විනාශයක්ම අත් කරදෙමින් විනාශ වී යන ධර්ම වන, ඇස, කන, නාසය, දිව, ශරීරය, මනස යන අභ්‍යන්තර ආයතන හය සහ රූප, ශබ්ද, ගන්ධ, රස, ස්පර්ශ, ධර්ම (අදහස්) යන බාහිර ආයතන හය, හේතුඵල වශයෙන් එකට එකක් පෑහීමෙන් නොහොත් පටිච්ච වීමෙන් හට ගන්නා හැඟීම් දැනීම් සහිත චින්තන අවකාශය, ලෝකය යනුවෙන් ධර්මය තුළ හඳුන්වයි. සත්වයාට විනාශයක්ම අත් කර දෙමින් විනාශ වී යන ස්වභාවයෙන් යුක්ත නිසා ලෝකයට පලෝක ධර්ම කියයි.

ලෝකය, සත්වයාගෙන් සත්වයාට වෙනස් වෙයි. එකිනෙකාගේ ලෝකය කෙබඳුදැයි තීරණය වන්නේ එකිනෙකාගේ සිත කය ක්‍රියාකාරීත්වය අනුව ය. සෑම සත්වයෙක්ම තම තමාගේ අවබෝධය හා අනවබෝධය අනුව නිර්මාණය වූ චින්තන ලෝකයක් තුළ ජීවත් වෙයි. එම චින්තන ලෝකය තුළ අප්‍රමාණ මානසික දාහයක් උසුලයි.

ලෝකය නම් වූ විනාස ධර්ම නැවත නැවත හට ගන්නා ආකාරයත්, එම ලෝකය නම් වූ විනාස ධර්ම සදහටම නූපදින ආකාරයට අවසන් කරන ආකාරයත්, ප්‍රඥාවෙන් අවබෝධ කොටගෙන එම මාර්ගය අනුගමනය කිරීමෙන්, සියලු ආශා ක්ෂය වී, ලෝකය නම් වූ විනාස ධර්මයන්ගෙන් සදහටම මිදී **අවිනාස** නම් වූ අමෘත මහ නිර්වාණයට පත්වෙයි. නොහොත් විඤ්ඤාණය සදාතනික වශයෙන්ම නිවී යයි.

**සංයුත්තනිකායේ, සළායතන වග්ගයේ, සළායතන සංයුත්තයේ, යොගක්ඛෙමීවග්ගයේ** එන, ලොක සමුදය සූත්‍රය තුළ ලෝකය හට ගන්නා ආකරයත්, ලෝකය අවසන් වන ආකාරයත් පටිච්ච සමුප්පාදය තුළින් විග්‍රහ වෙයි.

**ලොකස්ස, භික්ඛවෙ, සමුදයඤ්ච අත්ථඞ්ගමඤ්ච දෙසෙස්සාමි. තං සුණාථ.**

මහණෙනි, ලෝකය හට ගන්නා ආකාරයද, හට නොගන්නා ආකාරයද දේශනා කරන්නෙමි. එය අසව්.

**කතමො ච, භික්ඛවෙ, ලොකස්ස සමුදයො? චක්ඛුඤ්ච පටිච්ච රූපෙ ච උප්පජ්ජති චක්ඛුවිඤ්ඤාණං. තිණ්ණං සඞ්ගති ඵස්සො. ඵස්සපච්චයා වෙදනා, වෙදනාපච්චයා තණ්හා, තණ්හාපච්චයා උපාදානං, උපාදානපච්චයා භවො, භවපච්චයා ජාති, ජාතිපච්චයා ජරාමරණං සොකපරිදෙවදුක්ඛදොමනස්සුපායාසා සම්භවන්ති. අයං ඛො, භික්ඛවෙ, ලොකස්ස සමුදයො.**

මහණෙනි, ලෝකයාගේ හටගැනීම කවරේද ? ඇසද රූපයද එකිනෙක පැහීම හේතුවෙන් චක්ඛු විඤ්ඤාණය උපදියි. ඒ තිදෙනාගේ එක්වීම ඵස්සය (ස්පර්ශය) වේ. ඒ ඵස්සය හේතුවෙන් වේදනාව පවතී. වේදනාව (සැප වේදනාව) හේතුවෙන් තණ්හාව (ඇල්ම) පවතී. තණ්හාව හේතුවෙන් උපාදාන (ගති ස්වභාව) පවතී. උපාදාන හේතුවෙන් භවය (කර්ම රැස්වීම) වේ. භවය හේතුවෙන් ජාතිය (උපත) වේ. ජාතිය (උපත) හේතුවෙන් ජරා මරණ සෝක පරිදේව දුක්ඛ දෝමනස්ස උපායාස යන දුක්ඛස්කන්ධය ජනිත වෙත්. මහණෙනි, මේ වනාහි ලෝකයේ හටගැනීම වේ.

**එවං උපසංහරති ............**

කන

නාසය

දිව

ශරීරය

මනස

යන ඉතිරි ආයතන තුළින්ද පටිච්ච සමුප්පාද සමුදයට අනුව ලෝකය හට ගන්නා ආකාරය එසේම නුවණින් දැකිය යුතු.

විශ්වයේ අසමසම මහා ශාස්තෘවර ලොව්තුරු සම්මා සම්බුදු පියාණන් වහන්සේ පටිච්ච සමුප්පාද නිරෝධය තුළින් ලෝකයේ නිරෝධය නොහොත් සදාතනික නිවීම නම් වූ උතුම් නිර්වාණය පෙන්වා දුන් සේක.

**කතමො ච, භික්ඛවෙ, ලොකස්ස අත්ථඞ්ගමො? චක්ඛුඤ්ච පටිච්ච රූපෙ ච උප්පජ්ජති චක්ඛුවිඤ්ඤාණං. තිණ්ණං සඞ්ගති ඵස්සො. ඵස්සපච්චයා වෙදනා, වෙදනාපච්චයා තණ්හා. තස්සායෙව තණ්හාය අසෙසවිරාගනිරොධා උපාදානනිරොධො, උපාදානනිරොධා භවනිරොධො, භවනිරොධා ජාතිනිරොධො, ජාතිනිරොධා ජරාමරණං සොකපරිදෙවදුක්ඛදොමනස්සුපායාසා නිරුජ්ඣන්ති. එවමෙතස්ස කෙවලස්ස දුක්ඛක්ඛන්ධස්ස නිරොධො හොති. අයං ඛො, භික්ඛවෙ, ලොකස්ස අත්ථඞ්ගමො.**

මහණෙනි, ලෝකයේ අවසානය කවරේද? ඇසද රූපද එකිනෙක පැහීම හේතුවෙන් චක්ඛු විඤ්ඤාණය හටගනී. ඒ තිදෙනාගේ එක්වීම ඵස්සය වේ. ඵස්සය හේතුවෙන් වේදනාව පවතී. වේදනාව හේතුවෙන් තණ්හාව පවතී. ඒ තණ්හාව ඉතිරි නොකොට මාර්ග ඤාණයෙන් නිරෝධ කිරීමෙන් උපාදාන නිරෝධ වේ. උපාදන නිරෝධ වීමෙන් භවය (කර්ම රැස්වීම) නිරෝධ වෙයි. භව නිරෝධ වීමෙන් (කර්ම රැස්වීම අවසන්වීමෙන්) ජාතිය නිරෝධ වෙයි. ජාති නිරෝධ වීමෙන් (උපත අවසන් වීමෙන්) ජරා, මරණ, සෝක, පරිදේව, දුක්ඛ, දෝමනස්ස, උපායාස යන සම්පූර්ණ දුක්ඛස්කන්ධය නිරෝධ වෙත්. මහණෙනි, මේ වනාහි ලෝකයේ හට නොගැනීමයි. ලෝකයේ නිමාවයි.

**එවං උපසංහරති ............**

කන

නාසය

දිව

ශරීරය

මනස

යන ඉතිරි ආයතන තුළින්ද පටිච්ච සමුප්පාද නිරෝධයට අනුව ලෝකය අවසන් වන ආකාරය එසේම නුවණින් දැකිය යුතු.

ලෝකය අභ්‍යන්තර සහ බාහිර වශයෙන් ආයතන හයකට බෙදෙයි. ධර්මය තුළ ඒවා අභ්‍යන්තර සළායතන සහ බාහිර සළායතන ලෙස හැඳින්වෙයි. ඇස, කන, නාසය, දිව, ශරීරය, මනස අභ්‍යන්තර සළායතන වෙයි. රූප, ශබ්ද, ගන්ධ, රස, ස්පර්ශ, ධර්ම බාහිර සළායතන වෙයි. සළායතන තුළින් අප්‍රමාණ දුක් ගින්දර උපවදයි. සියලු ලෝක සත්වයෝ සළායතන හේතුවෙන් අනේක දුක් ගින්දර උසුලති.

**සංයුත්තනිකායේ, ඛන්ධවග්ගපාළියේ, ඛන්ධසංයුත්තයේ, සබ්බවග්ගයේ** එන ආදිත්ත සූත්‍රයේ දැක්වෙන ආකාරයට, සළායතන හේතුවෙන් සත්වයාට උරුම වන සංසාර දුක් ගින්දර ප්‍රධාන වශයෙන් එකොළොස් ආකාරයකි. සළායතන තුළින් හටගන්නා වූ පංච උපාදානස්කන්ධ ලෝකය, එම එකොළොස් ආකාර වූ දුක් ගින්නෙන් දැවෙයි.

## අභ්‍යන්තර ආයතන ඇවිළ ගත්තේය

**චක්ඛුං භික්ඛවෙ, ආදිත්තං** - ඇස ඇවිළ ගත්තේ ය.

**සොතා ආදිත්තා** - කන ඇවිළ ගත්තේ ය.

**ඝාණා ආදිත්තා** - නාසය ඇවිළ ගත්තේ ය.

**ජිව්හා ආදිත්තා** - දිව ඇවිළ ගත්තේ ය.

**කායො ආදිත්තා** - සිරුර ඇවිළ ගත්තේ ය.

**මනො ආදිත්තා** - මනස ඇවිළ ගත්තේ ය.

## බාහිර ආයතන ඇවිළ ගත්තේ ය

**රූපං භික්ඛවෙ, ආදිත්තං** - රූපය ඇවිළ ගත්තේ ය.

**සද්දා ආදිත්තා** - ශබ්දය ඇවිළ ගත්තේ ය.

**ගන්ධා ආදිත්තා** - ගන්ධය ඇවිළ ගත්තේ ය.

**රසා ආදිත්තා** - රසය ඇවිළ ගත්තේ ය.

**ඵොට්ඨබ්බා ආදිත්තා** - පහස ඇවිළ ගත්තේ ය.

**ධම්මං ආදිත්තං** - අදහස් ඇවිළ ගත්තේ ය.

විඤ්ඤාණය ඇවිළ ගත්තේ ය

**චක්ඛු විඤ්ඤාණං භික්ඛවෙ, ආදිත්තං** - චක්ඛු විඤ්ඤාණය (ඇසින් රූප දැනගැනීම) ඇවිළ ගත්තේ ය.

**සොත විඤ්ඤාණං ආදිත්තං** - සෝත විඤ්ඤාණය (කනින් ශබ්ද දැනගැනීම) ඇවිළ ගත්තේ ය.

**ඝාන විඤ්ඤාණං ආදිත්තං** - ඝාන විඤ්ඤාණය (නාසයෙන් ගන්ධ දැනගැනීම) ඇවිළ ගත්තේ ය.

**ජිව්හා විඤ්ඤාණං ආදිත්තං** - ජිව්හා විඤ්ඤාණය (දිවෙන් රස දැනගැනීම) ඇවිළ ගත්තේ ය.

**කාය විඤ්ඤාණං ආදිත්තං** - කාය විඤ්ඤාණය (සිරුරින් පහස දැනගැනීම) ඇවිළ ගත්තේ ය.

**මනො විඤ්ඤාණං ආදිත්තං** - මනෝ විඤ්ඤාණය (මනසින් අදහස් දැනගැනීම) ඇවිළ ගත්තේ ය.

සම්ඵස්සය ඇවිළ ගත්තේ ය

**චක්ඛු සම්ඵස්සො භික්ඛවෙ, ආදිත්තං** - චක්ඛු සම්ඵස්සය (ඇසින් අඛණ්ඩව රූප ස්පර්ශ කිරීම) ඇවිළ ගත්තේ ය.

**සොත සම්ඵස්සො ආදිත්තං** - සෝත සම්ඵස්සය (කනින් අඛණ්ඩව ශබ්ද ස්පර්ශ කිරීම) ඇවිළ ගත්තේ ය.

**ඝාන සම්ඵස්සො ආදිත්තං** - ඝාන සම්ඵස්සය (නාසයෙන් අඛණ්ඩව ගන්ධ ස්පර්ශ කිරීම) ඇවිළ ගත්තේ ය.

**ජිව්හා සම්ඵස්සො ආදිත්තං** - ජිව්හා සම්ඵස්සය (දිවෙන් අඛණ්ඩව රස ස්පර්ශ කිරීම) ඇවිළ ගත්තේ ය.

**කාය සම්ඵස්සො ආදිත්තං** - කාය සම්ඵස්සය (සිරුරින් අඛණ්ඩව පහස ස්පර්ශ කිරීම) ඇවිළ ගත්තේ ය.

**මනො සම්ඵස්සො ආදිත්තං** - මනෝ සම්ඵස්සය (මනසින් අඛණ්ඩව අදහස් ස්පර්ශ කිරීම) ඇවිළ ගත්තේ ය.

වේදනාව ඇවිළ ගත්තේ ය

**යම්පිදං චක්ඛුසම්ඵස්සපච්චයා උප්පජ්ජති වෙදයිතං සුඛං වා දුක්ඛං වා අදුක්ඛමසුඛං වා තම්පි ආදිත්තං** - චක්ඛු සම්ඵස්සය නිසා යම් සැප වේදනාවක් හෝ දුක් වේදනාවක් හෝ අදුක්ඛමසුඛ මධ්‍යස්ථ වේදනාවක් උපදිද, එයද ඇවිළ ගත්තේ ය.

**යම්පිදං සොතසම්ඵස්සපච්චයා උප්පජ්ජති වෙදයිතං සුඛං වා දුක්ඛං වා අදුක්ඛමසුඛං වා තම්පි ආදිත්තං** - සෝත සම්ඵස්සය නිසා යම් සැප වේදනාවක් හෝ දුක් වේදනාවක් හෝ අදුක්ඛමසුඛ මධ්‍යස්ථ වේදනාවක් උපදිද, එයද ඇවිළ ගත්තේ ය.

**යම්පිදං ඝානසම්ඵස්සපච්චයා උප්පජ්ජති වෙදයිතං සුඛං වා දුක්ඛං වා අදුක්ඛමසුඛං වා තම්පි ආදිත්තං** - ඝාන සම්ඵස්සය නිසා යම් සැප වේදනාවක් හෝ දුක් වේදනාවක් හෝ අදුක්ඛමසුඛ මධ්‍යස්ථ වේදනාවක් උපදිද, එයද ඇවිළ ගත්තේ ය.

**යම්පිදං ජිව්හාසම්ඵස්සපච්චයා උප්පජ්ජති වෙදයිතං සුඛං වා දුක්ඛං වා අදුක්ඛමසුඛං වා තම්පි ආදිත්තං** - ජිව්හා සම්ඵස්සය නිසා යම් සැප වේදනාවක් හෝ දුක් වේදනාවක් හෝ අදුක්ඛමසුඛ මධ්‍යස්ථ වේදනාවක් උපදිද, එයද ඇවිළ ගත්තේ ය.

**යම්පිදං කායසම්ඵස්සපච්චයා උප්පජ්ජති වෙදයිතං සුඛං වා දුක්ඛං වා අදුක්ඛමසුඛං වා තම්පි ආදිත්තං** - කාය සම්ඵස්සය නිසා යම් සැප වේදනාවක් හෝ දුක් වේදනාවක් හෝ අදුක්ඛමසුඛ මධ්‍යස්ථ වේදනාවක් උපදිද, එයද ඇවිළ ගත්තේ ය.

**යම්පිදං මනොසම්ඵස්සපච්චයා උප්පජ්ජති වෙදයිතං සුඛං වා දුක්ඛං වා අදුක්ඛමසුඛං වා තම්පි ආදිත්තං** - මනෝ සම්ඵස්සය නිසා යම් සැප වේදනාවක් හෝ දුක් වේදනාවක් හෝ අදුක්ඛමසුඛ මධ්‍යස්ථ වේදනාවක් උපදිද, එයද ඇවිළ ගත්තේ ය.

ආදිත්ත සූත්‍ර යේ විග්‍රහ වන ආකාරයට මෙසේ.........,

- ඇස, කන, නාසය, දිව, කය, මනස යන අභ්‍යන්තර සළායතනත්,
- රූප, ශබ්ද, ගන්ධ, රස, පහස, අදහස් යන බාහිර සළායතනත්,
- චක්ඛු විඤ්ඤාණය, සෝත විඤ්ඤාණය, ඝාන විඤ්ඤාණය, ජිව්හා විඤ්ඤාණය, කාය විඤ්ඤාණය, මනෝ විඤ්ඤාණය යන විඤ්ඤාණ ආයතන හයත්,
- චක්ඛු සම්ඵස්සය, සෝත සම්ඵස්සය, ඝාන සම්ඵස්සය, ජිව්හා සම්ඵස්සය, කාය සම්ඵස්සය, මනෝ සම්ඵස්සය යන ස්පර්ශ ආයතන හයත්,
- චක්ඛු සම්ඵස්සජා වේදනා, සෝත සම්ඵස්සජා වේදනා, ඝාන සම්ඵස්සජා වේදනා, ජිව්හා සම්ඵස්සජා වේදනා, කාය සම්ඵස්සජා වේදනා, මනෝ සම්ඵස්සජා වේදනා යන වේදනා ආයතන හයත්, යන සියල්ල සියලු ආකාරයෙන් ඇවිළ ගත්තේ ය.

**කෙන ආදිත්තං ?** කුමකින් ඇවිළ ගත්තේද ?

**රාගග්ගිනා, දොසග්ගිනා, මොහග්ගිනා ආදිත්තං, ජාතියා, ජරාය, මරණෙන, සොකෙහි, පරිදෙවෙහි, දුක්ඛෙහි, දොමනස්සෙහි, උපායාසෙහි ආදිත්තන්ති වදාමි.**

රාග ගින්න, ද්වේෂ ගින්න, මෝහ ගින්න, ජාති, ජරා, මරණ, සෝක, පරිදේව, දුක්ඛ, දෝමනස්ස, උපායාස යන ගින්නෙන් ඇවිළගත්තේ යැයි වදාරමි.

# සකල ලෝක සත්වයා දවන එකොළොස් මහා දුක් ගින්න

1. **රාග ගින්න**
2. **ද්වේෂ ගින්න**
3. **මෝහ ගින්න**
4. **ජාති ගින්න**
5. **ජරා ගින්න**
6. **මරණ ගින්න**
7. **සෝක ගින්න**
8. **පරිදේව ගින්න**
9. **දුක්ඛ ගින්න**
10. **දෝමනස්ස ගින්න**
11. **උපායාස ගින්න**

මෙසේ එකොළොස් ආකාර වූ සංසාර දුක් ගින්නෙන් සියල්ල දැවෙයි. සුගති දුගති යන භේදයකින් තොරව සසර උපදින සියලු සත්වයෝ හාත්පස මේ එකොළොස් ගින්නෙන් නිරතුරු දැවෙති. සසර ගැන ආශාව පවතිනතුරු කිසිවෙකුට මේ මහා දුක් ගින්නෙන් මිදිය නොහැක. බියකරු සසරේ යථා ස්වභාවය මනාකොට අවබෝධ කර ගැනීමෙන් මනසේ සියලු ආශාවන් හා බැඳීම් දුරු වී යයි. එවිට මේ මහා සංසාර එකොළොස් ගින්න සදහටම නිවී යයි. **ඒ සදාතනික නිවීම, පරම ශාන්ත අජරාමර නිවනයි.**

# තමන් සතු සියල්ල එකොළොස් ගින්නෙන් දැවෙන්නේය

1. ඇස රාග ගින්නෙන් දැවෙයි. ඇස නිසා ප්‍රිය රූප දකියි. ප්‍රිය රූප සමග ඇලෙයි. ප්‍රියරූප නිසා කාමය (ආශාවන්) හා ප්‍රේමය (බැඳීම්) හටගනියි. කාමය හා ප්‍රේමය හේතුවෙන් නොයෙක් දුක්ඛ දෝමනස්ස සෝක සංතාප හටගනියි. මානසික දාහය හටගනියි. එයින් සත්වයා තුළ දුක උපදියි. එබැවින් ඇස රාග ගින්නෙන් දැවෙන බව නුවණින් දැකිය යුතු ය.

2. ඇස ද්වේෂ ගින්නෙන් දැවෙයි. ඇස නිසා අප්‍රිය රූප දකියි. අප්‍රිය රූප සමග ගැටෙයි. ගැටීම් අරගල අඩදබර හට ගනියි. ගැටීම් නිසා කෝලාහල හේතුවෙන් නොයෙක් දුක්ඛ දෝමනස්ස සෝක සංතාප හටගනියි. මානසික දාහය හටගනියි. එයින් සත්වයා තුළ දුක උපදියි. එබැවින් ඇස ද්වේෂ ගින්නෙන් දැවෙන බව නුවණින් දැකිය යුතු ය.

3. ඇස මෝහ ගින්නෙන් දැවෙයි. ඇස නිසා මුළාසහගත රූප දකියි. මුළාසහගත රූපයන්ට රැවටෙයි. රැවටීම නිසා භය, සැක සංකා, මානය, අංහකාරය උපදියි. මුළාව හේතුවෙන් නොයෙක් දුක්ඛ දෝමනස්ස සෝක සංතාප හටගනියි. මානසික දාහය හටගනියි. එයින් සත්වයා තුළ දුක උපදියි. එබැවින් ඇස මෝහ ගින්නෙන් දැවෙන බව නුවණින් දැකිය යුතු ය.

4. ඇස ජාති ගින්නෙන් දැවෙයි. ඇස පෙර නොතිබීම, හේතුඵල වශයෙන් කර්මානුරූපව හටගනු ලැබූවකි. ඇසෙහි හට ගැනීම සියලු දුක්ඛයන්ගේ හට ගැනීමයි. සෑම ඇසක්ම උපතේ සිට මරණය තෙක්ම කර්ම රැස් කිරීමට දායක වෙයි. මෙලොව සෑම ඇසක්ම පරලොව ඇසට අවශ්‍ය කර්ම ශක්තිය රැස් කරයි. මේ භවයේ ඇස මගින් මතු භවයේ ඇස සකස්වෙයි. එයින් සත්වයා තුළ දුක උපදියි. එබැවින් ඇස ජාති ගින්නෙන් දැවෙන බව නුවණින් දැකිය යුතු ය.

5. ඇස ජරා ගින්නෙන් දැවෙයි. ඇස හටගත් මොහොතේ සිට ක්ෂණයක් ක්ෂණයක් පාසා අභාවය කරා ගමන් කරයි. ඇස මොහොතින් මොහොතම දිරාපත් වෙයි. වියපත් වෙයි. සෑම ඇසක්ම ජරාවට පත්වෙයි, මහලු වෙයි. ඇසේ පෙනීම දුර්වල වෙයි. එයින් සත්වයා තුළ දුක උපදියි. එබැවින් ඇස ජරා ගින්නෙන් දැවෙන බව නුවණින් දැකිය යුතු ය.

6. ඇස මරණ ගින්නෙන් දැවෙයි. ඇස හටගත් මොහොතේ සිට ක්ෂණයක් පාසා මරණය කරා ගමන් කරයි. සෛලයක් සෛලයක් පාසා කායිකවද ඇස මරණයට පත් වෙයි. චිත්තයක් චිත්තයක් පාසා විඤ්ඤාණිකවද ඇස  මරණයට පත් වෙයි. සෑම ඇසක්ම මරණයෙන් කෙළවර වෙයි. ඇසේ පෙනීම නොමැතිව යයි. එයින් සත්වයා තුළ දුක උපදියි. එබැවින් ඇස මරණ ගින්නෙන් දැවෙන බව නුවණින් දැකිය යුතු ය.

7. ඇස සෝක ගින්නෙන් දැවෙයි.  ඇස නිසා උරුම වන සෝකයන් අපමණ ය. ප්‍රිය වස්තූන් අභිමිවනු දැකීම,  ප්‍රියයන් වෙන්වන අයුරු දැකීම, ස්වකීය ප්‍රියයන්

නොදැකීම යනාදි නොයෙක් හේතු නිසා සෝකය හට ගනියි. එයින් සත්වයා තුළ දුක උපදියි. එබැවින් ඇස සෝක ගින්නෙන් දැවෙන බව නුවණින් දැකිය යුතු ය.

8. ඇස පරිදේව ගින්නෙන් දැවෙයි. ඇස නිසා උරුම වන හැඬීම් වැළපීම් අපමණ ය. ප්‍රියයන් වෙන්වන අයුරු දැකීම, ස්වකීය ප්‍රියයන් දක්නට නොලැබීම, ප්‍රිය වස්තූන් අහිමිවනු දැකීම, අප්‍රියයන් දැකීම යනාදි නොයෙක් හේතු නිසා හැඬීම් වැළපීම් හට ගනියි. එයින් සත්වයා තුළ දුක උපදියි. එබැවින් ඇස පරිදේව ගින්නෙන් දැවෙන බව නුවණින් දැකිය යුතු ය.

9. ඇස දුක්ඛ ගින්නෙන් දැවෙයි. ඇස මසින් නහරින් සැදි ඉතා සියුම් ඉන්ද්‍රියකි. ඇසටද නොයෙක් නොයෙක් ලෙඩරෝග වැළඳෙයි. ඇසෙහි නොයෙක් ආබාධ හට ගනියි. ඇසෙහි තුවාල හට ගනියි. ඇසෙහි නොයෙක් කටුක වේදනා ඇතිවෙයි. එයින් සත්වයා තුළ දුක උපදියි. එබැවින් ඇස දුක්ඛ ගින්නෙන් දැවෙන බව නුවණින් දැකිය යුතු ය.

10. ඇස දෝමනස්ස ගින්නෙන් දැවෙයි. ඇසින් අප්‍රිය රූප දැකීම නිසා අමනාපකම්, විරසකකම් ඇතිවෙයි. එම අමනාපකම්, විරසකකම් හේතුවෙන් ගැටුම් ඇතිවෙයි. එම ගැටුම් හේතුවෙන් මනසේ දෝමනස්සය හට ගනියි. දෝමනස්සය යනු ගැටුම් නිසා ඇතිවන කෝපය මුසු මානසික දාහයයි. එයින් සත්වයා තුළ දුක උපදියි. එබැවින් ඇස දෝමනස්ස ගින්නෙන් දැවෙන බව නුවණින් දැකිය යුතු ය.

11. ඇස උපායාස ගින්නෙන් දැවෙයි. ඇස නිසා උරුම වන උපායාසයන් අපමණ ය. බොහෝ ප්‍රියයන් වෙන්වන අයුරු දැකීම, බොහෝ ප්‍රිය වස්තූන් අහිමිවනු දැකීම, බොහෝ අප්‍රිය දේ දැකීම යනාදි නොයෙක් හේතු නිසා උපායාසය හට ගනියි. උපායාසය යනු දරා ගැනීමට, ඉවසා ගැනීමට අපහසු තරමේ මහා බලවත් දුකක් හෝ මහා පීඩාවක් යනුයි. එයින් සත්වයා තුළ දුක උපදියි. එබැවින් ඇස උපායාස ගින්නෙන් දැවෙන බව නුවණින් දැකිය යුතු ය.

**එවං උපසංහරති ............**

**කන**

**නාසය**

**දිව**

**ශරීරය**

**මනස**

යන ඉතිරි ආයතන අනුවද සියල්ල එකොළොස් ගින්නෙන් දැවෙන ආකාරය එසේම නුවණින් දැකිය යුතු.

# ඇස නිසා උරුම වූ එකොළොස් ගින්දර

## ඇසේ රාගය නිසා උරුම වූ ගින්දර

ඇස කෙරෙහි ඇති ආශාව නිසා, රූප කෙරෙහි ඇති ආශාව නිසා, රූප දැකීමට ඇති ආශාව නිසා, ලෝකයේ ප්‍රිය රූප හා ඇලෙමින්, ආශාවන්ගෙන් කාම දාහයෙන් යුක්තව කටයුතු කිරීම කරණ කොටගෙන, සිතේ අසහනය පීඩාව උසුලන්නට සිදු වූ වාර කොතරම්ද ...... ඇස නිසා මනසට උරුම වූ දාහය කොපමණද ....

## ඇසේ ද්වේෂය නිසා උරුම වූ ගින්දර

ඇස කෙරෙහි ඇති ආශාව නිසා, රූප කෙරෙහි ඇති ආශාව නිසා, රූප දැකීමට ඇති ආශාව නිසා, ලෝකයේ අප්‍රිය රූප හා ගැටෙමින් ද්වේෂයෙන් ක්‍රෝධයෙන් යුක්තව කටයුතු කිරීම කරණ කොටගෙන, සිතේ අසහනය පීඩාව උසුලන්නට සිදු වූ වාර කොතරම්ද...... ඇස නිසා මනසට උරුම වූ දාහය කොපමණද ....

## ඇසේ මෝහය නිසා උරුම වූ ගින්දර

ඇස කෙරෙහි ඇති ආශාව නිසා, රූප කෙරෙහි ඇති ආශාව නිසා, රූප දැකීමට ඇති ආශාව නිසා, ලෝකයේ මුළාසහගත රූප හා මුළාවෙමින් මෝහයෙන් මානයෙන් භයෙන් යුක්තව කටයුතු කිරීම කරණ කොටගෙන, සිතේ අසහනය පීඩාව උසුලන්නට සිදු වූ වාර කොතරම්ද...... ඇස නිසා මනසට උරුම වූ දාහය කොපමණද ....

## ඇසේ ජාතිය නිසා උරුම වූ ගින්දර

ඇස කෙරෙහි ඇති ආශාව නිසා, රූප කෙරෙහි ඇති ආශාව නිසා, රූප දැකීමට ඇති ආශාව නිසා, භවයෙන් භවයට කර්මයෙන් සකසා දුන් නොයෙක් ප්‍රකාර මනාප අමනාප දුක්ඛිත සුඛිත ඇස් කරණ කොටගෙන, සිතේ අසහනය පීඩාව උසුලන්නට සිදු වූ වාර කොතරම්ද...... ඇස නිසා මනසට උරුම වූ දාහය කොපමණද ....

## ඇසේ ජරාව නිසා උරුම වූ ගින්දර

ඇස කෙරෙහි ඇති ආශාව නිසා, රූප කෙරෙහි ඇති ආශාව නිසා, රූප දැකීමට ඇති ආශාව නිසා, ඇස ක්‍රම ක්‍රමයෙන් වියපත්භාවයට, මහළුභාවයට, දුර්වලභාවයට ජරාවට පත්වීම කරණ කොටගෙන, සිතේ අසහනය පීඩාව උසුලන්නට සිදු වූ වාර කොතරම්ද ...... ඇස නිසා මනසට උරුම වූ දාහය කොපමණද ....

### ඇසේ මරණය නිසා උරුම වූ ගින්දර

ඇස කෙරෙහි ඇති ආශාව නිසා, රූප කෙරෙහි ඇති ආශාව නිසා, රූප දැකීමට ඇති ආශාව නිසා, ඇස මොහොතින් මොහොත අභාවයට පත්වීම, පෙනීම ක්‍රම ක්‍රමයෙන් අවසන් වීම, ඇස ක්‍රම ක්‍රමයෙන් මරණයට පත්වීම කරණ කොටගෙන සිතේ අසහනය පීඩාව උසුලන්නට සිදු වූ වාර කොතරම්ද ...... ඇස නිසා මනසට උරුම වූ දාහය කොපමණද ....

### ඇසේ සෝකය නිසා උරුම වූ ගින්දර

ඇස කෙරෙහි ඇති ආශාව නිසා, රූප කෙරෙහි ඇති ආශාව නිසා, රූප දැකීමට ඇති ආශාව නිසා, නොයෙක් නොයෙක් ප්‍රිය රූපයන්ට ඇලුම් කළද, එම සියලු ප්‍රිය රූප අන්‍යභාවයන්ට පෙරළී විපරිණාමයට පත්වීම නිසා ඇති වූ සෝකයන් කරණ කොටගෙන, සිතේ අසහනය පීඩාව උසුලන්නට සිදු වූ වාර කොතරම්ද ...... ඇස නිසා මනසට උරුම වූ දාහය කොපමණද ....

### ඇසේ පරිදේවය නිසා උරුම වූ ගින්දර

ඇස කෙරෙහි ඇති ආශාව නිසා, රූප කෙරෙහි ඇති ආශාව නිසා, රූප දැකීමට ඇති ආශාව නිසා, නොයෙක් නොයෙක් ප්‍රිය රූපයන්ට ඇලුම් කළද, එම ප්‍රිය රූප අහිමි වීම, ප්‍රිය රූප වෙන්වීම නිසා ඇති වූ හැඬීම් වැළපීම් කරණ කොටගෙන, සිතේ අසහනය පීඩාව උසුලන්නට සිදු වූ වාර කොතරම්ද ...... ඇස නිසා මනසට උරුම වූ දාහය කොපමණද ....

### ඇසේ දුක්ඛය නිසා උරුම වූ ගින්දර

ඇස කෙරෙහි ඇති ආශාව නිසා, රූප කෙරෙහි ඇති ආශාව නිසා, රූප දැකීමට ඇති ආශාව නිසා, ඇසේ හට ගන්නා නොයෙක් දෘෂ්‍යාබාධ, අක්ෂි රෝග, අක්ෂි ආබාධ, අක්ෂි වේදනා වැනි දුක්ඛයන්ට මුහුණ පෑමට සිදුවීම කරණ කොටගෙන සිතේ අසහනය පීඩාව උසුලන්නට සිදු වූ වාර කොතරම්ද ...... ඇස නිසා මනසට උරුම වූ දාහය කොපමණද ....

### ඇසේ දෝමනස්සය නිසා උරුම වූ ගින්දර

ඇස කෙරෙහි ඇති ආශාව නිසා, රූප කෙරෙහි ඇති ආශාව නිසා, රූප දැකීමට ඇති ආශාව නිසා, ඇසින් දුටු අප්‍රිය රූප හා ගැටෙමින්, ඇති කරගන්නා නොයෙක් වාදවිවාද, අඩබදර, විරසකකම්, වචන හුවමාරු, බහින්බස්වීම්, කලකෝලාහළ, අරගල නිසා ඇතිවන ද්වේෂය මුසු දුක නොහොත් දෝමනස්සය කරණ කොටගෙන, සිතේ අසහනය පීඩාව උසුලන්නට සිදු වූ වාර කොතරම්ද ...... ඇස නිසා මනසට උරුම වූ දාහය කොපමණද ....

**ඇසේ උපායාසය නිසා උරුම වූ ගින්දර**

ඇස කෙරෙහි ඇති ආශාව නිසා, රූප කෙරෙහි ඇති ආශාව නිසා, රූප දැකීමට ඇති ආශාව නිසා, ප්‍රිය රූප හා දැඩිව ඇලෙමින් බැඳෙමින් කටයුතු කරමින් බලවත් ලෙස ප්‍රිය භාවයෙන් ළං කරගත් රූපද, වස්තූන්ද, අහිමි වී යාම, වෙන් වී යාම, විනාශ වී යාම, අනපේක්ෂිත බලවත් උපද්‍රවයන්ට මුහුණපෑමට සිදුවීම යනාදි අවස්ථා නිසා ඇති වූ දරාගත නොහැකි මට්ටමේ බලවත් මානසික පීඩාව නොහොත් උපායාසය කරණ කොටගෙන, සිතේ අසහනය පීඩාව උසුලන්නට සිදු වූ වාර කොතරම්ද ...... ඇස නිසා මනසට උරුම වූ දාහය කොපමණද ....

**ඒවං උපසංහරති ............** සෙසු ධර්මයන්ද එසේ සසඳනු .....

- **කන නිසා හට ගන්නා එකොළොස් ගින්දර .............**
- **නාසය නිසා හට ගන්නා එකොළොස්ගින්දර .............**
- **දිව නිසා හට ගන්නා එකොළොස් ගින්දර .............**
- **කය නිසා හට ගන්නා එකොළොස් ගින්දර .............**
- **මනස නිසා හට ගන්නා එකොළොස් ගින්දර .............**

මෙසේ එක් ආයතනයක් මුල් කරගෙන ගිනි එකොළහක් උපදියි. එවිට ආයතන හයක් මුල් කරගෙන උපදිනා ගින්න හැට හය ආකාරයකි. සෑම සත්වයෙකුගේම අත්භවය පුරා, ජීවිතය පුරා මෙසේ හැට හය ආකාරයකට ගිනි ඇවිළෙයි. නුවණින් විමසූ විට සත්වයාගේ අත්භවය යනු හාත්පසම ඇවිළෙන මහා ගිනි ජාලාවක් බව වැටහෙයි. නොනිවී වැඩෙන අග්නි දාහයක් බව පෙනෙයි. සත්වයා සසර වසනතුරු කිසිදා මේ එකොළොස් ගින්න නොනිවෙයි. සසර පැවැත්ම යනු මේ එකොළොස් ගින්නයි. ඒ බව ප්‍රඥාවෙන් අවබෝධ කර ගන්නා බුද්ධ ශ්‍රාවකයෝ පංච උපාදානස්කන්ධය කෙරෙහි කලකිරී මනසේ සියලු රාග ගිනි නිවා සදාතනික නිවීම උරුම කර ගනිති.

# ඇවිළගත් වනයේ ගිනි තැපීම

හාත්පසම මහා ලැව් ගින්නක් ඇවිළුණු මහ වනයකි. මේ වනය මැද ගින්නට කොටු වූ එක්තරා කුෂ්ඨ රෝගීහු පිරිසක් වෙති. ඔවුනට හතර අතින්ම දක්නට ලැබෙන්නේ බුර බුරා අහස උසට නැගෙන මහ ගිනිදැල් ය. පරිසරය පුරා දැනෙන්නේ මහා ගිනි දාහයකි, තාපයකි. නමුත් සිය ශරීරයන්හී පවතින කුෂ්ඨ රෝගය නිසාම එම ගිනි තාපය ඔවුනට මහා සැපයකි. ගින්නෙහි තාපය දරාගත නොහැකිව වණමුඛවල පණුවෝ කුෂ්ඨයෙන් ඉවතට යති. එය කුෂ්ඨ රෝගියාට මොහොතකට හෝ මහත් අස්වැසිල්ලකි. එබැවින් සියලු කුෂ්ඨ රෝගිහු ගින්න සැපයක් යැයි සිතාගෙන ගිනි අසළම ගැවසෙති. හාත්පස ඇවිළෙන මේ මහා ලැව් ගින්න තව නොබෝ කලකින් සියල්ලද, සියලු දෙනාවද දවා හළු කරමින් පැතිරෙන බව කිසිවෙක් නොදනිති. එයින් ගැලවිය හැකි මගක් ගැන වගක් හෝ නොසිතති.

කාලය මෙසේ ගතවෙද්දී, මේ මහා ලැව් ගින්න ගැනත්, එම ගින්න නිසා අත්වන විනාශය ගැනත්, එම විනාශයෙන් ගැලවී යා හැකි මාර්ගය ගැනත් මනාකොට දන්නා එක් කරුණාවන්ත පුරුෂයෙක් මෙම කුෂ්ඨ රෝගීන් කෙරෙහි අනුකම්පාවෙන් ඔවුන් අසළට පැමිණ මෙසේ කියයි.

පින්වත් පුරුෂය, නුදුරේදී මේ සෑම දෙයම, සියලු දෙනාවම දවා හළු කරන මේ භයානක ගින්නෙන් ගැලවී, මේ මහ වනයෙන්ද පිට වී යා හැකි ආරක්ෂිත මාර්ගයක් ගැන මම දනිමි. එසේම එම මාර්ගයෙන් ළඟා විය හැකි, සියලු ගිනි නිවුණු, සියලු භය සංසිඳුණු සදාතනික ආරක්ෂිත නගරයක් ගැනද දනිමි. ඥාණවන්තයෝ වීර්යවන්තයෝ අප්‍රමාදීව එම නගරයට පිවිස සියලු කායික මානසික දුකින් සදහටම අත මිදෙත්වා !

එම කරුණාවන්ත පුරුෂයාගේ මෙම ප්‍රකාශයට කෙනෙක් වුවමනාවෙන් කන් දෙති. තව කෙනෙක් නොසැලකිල්ලෙන් කන් දෙති. ඇතැමෙක් කිසිදු විචාරයකින් තොරව සවන් දීගෙන සිටිති. සමහරෙක් කිසිදු අයුරකින් ඊට කන් නොදෙති. කන් දෙන ඇතැමෙක් දැනගත් කරුණු වුවමනාවෙන් විමසා බලති. තවෙකෙක් ඇසූවද ඒ ගැන වැඩිදුරට නොසිතති. නුවණින් සිතා නොබැලූ වැඩි දෙනාගේ මතය වන්නේ තමන්ට කුෂ්ඨ රෝගය ඇති නිසා ගින්න සැපයක් බවත්, නොදන්නා නිවුණු නගරය විශ්වාස කළ නොහැකි බවත් ය.

නමුත් නුවණ ඇති මිනිසුන් කල්පනා කරන්නේ ගින්නෙන් කුෂ්ඨය තවමින් ජීවත්වීම තාවකාලික සැපයක් බවත්, අවාසනයේ මේ ගින්නටම හසු වී මියා යාමත් ඒකාන්ත නිසා, සියලු ගිනි නිවුණු, සියලු භය සංසිඳුණු සදාතනික ආරක්ෂිත නගරයක් ඇත්නම් එබඳු නගරයක් කරා යාම ඥාණාන්විත බවයි. ඒ අනුව ඥාණවන්ත පුරුෂයෝ කරුණු විමසා බලා අප්‍රමාදීව එම ක්ෂේම නගරය කරා ගමන් කර සියලු භයින් දුකින් අත මිදෙති. සිදුවන කිසිවක් ගැන ඥාණයෙන් නොදුටු නොසිතු අඥාණ ජනයා කුෂ්ඨය තවමින් සිට අවසානයේ ඒ ගින්නටම හසු වී මිය යති. දැවි දැවී බොහෝ දුක සේ මරණය වැළඳ ගනිති.

මේ විශ්වයේ අනන්ත ලෝක තලයන්හී උපදින්නා වූ අනන්ත ලෝක සත්වයා, නිමක් නැත්තා වූ එකොළොස් ගින්නෙන් සසර පුරා දැවෙති. අපමණ ගිනි උසුලති. ඇස, කන, නාසය, දිව, ශරීරය, මනස යන ආයතන හාත්පසම රාග, ද්වේෂ, මෝහ, ජාති, ජරා, මරණ, සෝක, පරිදේව, දුක්ඛ, දෝමනස්ස, උපායාස යන එකොළොස් ගිනි ඇවිළෙයි. මොහොතක් පාසා ලෝක සත්වයෝ මේ එකොළොස් ගින්නෙන් දැවි දැවී නොහිම් සෝ සුසුම් හෙළති. කඳුළු වගුරුවති. පපුවේ අත් ගසමින් වැළපෙති. ක්ලාන්තව ඇද වැටෙති. සිහි මුර්ඡාවෙති.

කර්මයෙන් දායද වූ ජීවිතයට අනුව සියලු සත්වයෝ තම තමන්ට අදාළ ජීවන අත්භවය තුළ, එකිනෙකාට සාපේක්ෂ මට්ටමින් මේ එකොළොස් ගින්නෙන් දැවෙති. රහතන් වහන්සේගෙන් මෙපිට සෑම සත්වයෙක්ගේම මනසේ සෑම විටම කිසියම් දාහයක් (දැවීමක් / ගින්දරක්) පවතී. කුමන හෝ අසහනයකින් මනස පෙළෙයි. කුමන හෝ දාහයකින් මනස දැවෙයි. මනසේ ඇති මෙම අසහනකාරි ස්වභාවයෙන් මිදීමට සත්වයෝ නොයෙක් ක්‍රම අනුගමනය කරති. නමුත් කිසිවෙක් කිසිවකින් සර්ව සම්පූර්ණ, සංතෘප්තිකර සහනයක් නිවීමක් නොලබති. නිසි සතුටක් සංසිඳීමක් නොලබති.

ඇවිළෙන ගින්නට පිදුරු දැමීම වැනි යැයි හෙළ පිරුළක් පවතී. ඇවිළෙන ගින්නට පිදුරු දැමීමෙන් තව තවත් ගින්න වර්ධනය වෙයි. ලෝක සත්වයෝ සිය මනසේ රාගය, ද්වේෂය, මෝහය හේතුවෙන් ඇතිවන මානසික දාහය නිවා ගැනීම උදෙසාද කුමන හෝ රාග, ද්වේෂ, මෝහ ක්‍රියාකාරකමකම යෙදෙති. ඒ මොහොතට දාහය සංසිඳුණත් එයින් සිදුවන්නේ ඇවිළෙන ගින්නට තව තවත් පිදුරු දැමීමකි. ඒ මොහොතට අසහනය දුරු වුවත්, දාහය නිවී ගියත්, ඒ සඳහා අනුගමනය කරන උපක්‍රම නිසා තව තවත් ප්‍රශ්න හට ගනියි. දාහයන් අසහනයන් උපදියි. කර්ම රැස්වෙයි.

මනසේ හට ගන්නා මේ රාග, ද්වේෂ, මෝහ දාහය නොහොත් ගින්දර සදහටම නිවා ගත හැකි මග කුමක්ද ? විශ්වයේ ඥාණය ඇති බොහෝ ලෝ සතුන් සොයන්නේ මෙම ප්‍රශ්නයට පිළිතුරයි. අනවරත සංසාර චක්‍රය තුළ සැගවී ඇති මෙම පිළිතුර අනාවරණය කර ගත හැක්කේ විශ්වයේ අසමසම මහා ප්‍රාඥ, මහා ඥාණවන්ත උත්තමයෙකුට පමණි.

තුන් ලෝකාග්‍ර අමාමෑණි ශාන්තිනායක සම්මා සම්බුදු පියාණන් වහන්සේ නම් වූ ඒ අසමසම මහා ප්‍රාඥ උතුමාණන් වහන්සේ, තමන් වහන්සේගේ අසමසම ලොව්තුරු සම්බුද්ධ ඥාණයෙන්, සම්බුද්ධ ප්‍රඥාවෙන් අවබෝධ කොටගෙන දේශනා කරන්නා වූ එම නිර්වාණ මාර්ගය වූ කලී, මනසේ හට ගන්නා සියලු ගිනි සදහටම නිවා දැමිය හැකි ඒකායන මාර්ගයයි. එකොළොස්විධ වූ සංසාර ගින්නෙන් සදහටම මිදිය හැකි උත්තරීතර ඥාණ ප්‍රතිපදාවයි.

සියලු ගිනි පවතින්නේ ඇස, කන, නාසය, දිව, ශරීරය, මනස පවතින තැනයි. සද්ධර්මය නොදන්නා අඥ්ඥාණ ලෝක සත්වයා සැපයකැයි රැවටී පරිහරණය කරන්නේ ඒ මහා දුක්ඛස්කන්ධයයි. සැපය වශයෙන් දකින්නේ මෙලොව පරලොව එකොළොස් මහා ගින්නෙන් නිරතුරු දැවෙන පංච උපාදානස්කන්ධයයි. සිත කය තුළ ගොඩ නැගුණු අසාර විඥ්ඥාණ මායා ලෝකයයි.

කොතරම් දැවුණද පළගැටියා ගමන් කරන්නේ පහන් දැල්ල දෙසටම ය. තටු පිළිස්සී ගියද, අත පය දැවුණද, නැවත නැවතත් ඇදි ඇදී යන්නේ ගින්දර දෙසටම ය. සද්ධර්මය නොදන්නා වූ කාමය පසුපස ගොස් වැනසී යන්නා වූ පෘථග්ජන ලෝක සත්වයාව, ධර්මයේ උපමා කරනු ලබන්නේ, ගින්නටම පෙම් බැඳ වැනසී යන අඥානඥාණ පළගැටියාට ය.

# අපමණ කාලයක සිට සසර එකොළොස් ගින්නෙන් දැවෙයි

අත්භවයෙන් අත්භවයට වසර කෝටි සත සහස්‍ර අසංඛ්‍ය කල්ප ගණන් සසර පුරා මෙසේ සළායතන හේතුවෙන් උසුලන ලද සංසාර දුක් ගින්න මෙපමණයැයි කිව හැකි නොවේ.

**සංයුත්තනිකායේ, අනමතග්ග සංයුත්තයේ, පබ්බත සූත්‍රයේ**, සසර ගමනේ දීර්ඝභාවය පිළිබඳ මෙවැනි උපමාවක් දැක්වෙයි.

**අනමතග්ගොයං භික්ඛවෙ, සංසාරො. පුබ්බා කොටි න පඤ්ඤායති අවිජ්ජානීවරණානං සත්තානං තණ්හාසංයොජනානං සන්ධාවතං සංසරතං.**

**දීඝො ඛො, භික්ඛු, කප්පො. සො න සුකරො සඞ්ඛාතුං එත්තකානි වස්සානි ඉති වා, එත්තකානි වස්සසතානි ඉති වා, එත්තකානි වස්සසහස්සානි ඉති වා, එත්තකානි වස්සසතසහස්සානි ඉති වාති.**

මහණෙනි, කල්පය වනාහි දීර්ඝ ය. එය මෙතෙක් අවුරුදු ය කියා හෝ මෙතෙක් අවුරුදු සියයක් ය කියා හෝ මෙතෙක් අවුරුදු දහසක් ය කියා හෝ මෙතෙක් අවුරුදු ලක්ෂයක් ය කියා හෝ ගණන් කිරීමට පහසු නොවේ.

**සෙය්‍යථාපි, භික්ඛු, මහාසෙලො පබ්බතො යොජනං ආයාමෙන යොජනං විත්ථාරෙන යොජනං උබ්බෙධෙන අච්ඡින්නො අසුසිරො එකග්ඝනො. තමෙනං පුරිසො වස්සසතස්ස වස්සසතස්ස අච්චයෙන කාසිකෙන වත්ථෙන සකිං සකිං පරිමජ්ජෙය්‍ය. ඛිප්පතරං ඛො සො, භික්ඛු, මහාසෙලො පබ්බතො ඉමිනා උපක්කමෙන පරික්ඛයං පරියාදානං ගච්ඡෙය්‍ය, න ත්වෙව කප්පො.**

මහණ, යම්සේ වනාහි දිගින් යොදුනක් ඇති, පළලින් යොදුනක් ඇති, උසින් යොදුනක් ඇති, පළුදු රහිත වූ, සිදුරු රහිත වූ, සමමිතික වූ, මහා ගල් පර්වතයක් වේද, ඒ ගල් පර්වතය පුරුෂයෙක් අවුරුදු සියයකට සියයකට වරක් කසී සලුවකින් පිරිමදින්නේ වේද, මහණ, මේ ආකාරයෙන් ඒ මහා ගල් පර්වතය ගෙවීමට කෙළවරවීමට යන්නේ ය. කල්පය කෙළවර නොවන්නේ ය.

**එවං දීඝො, භික්ඛු, කප්පො. එවං දීඝානං ඛො, භික්ඛු, කප්පානං නෙකො කප්පො සංසිතො, නෙකං කප්පසතං සංසිතං, නෙකං කප්පසහස්සං සංසිතං, නෙකං කප්පසතසහස්සං සංසිතං. තං කිස්ස හෙතු? අනමතග්ගොයං, භික්ඛු, සංසාරො.**

මහණෙනි, කල්පය වනාහි මෙසේ දීර්ඝ ය. මහණෙනි, මෙසේ දීර්ඝ වූ කල්පයන්ගෙන් නොයෙක් කල්ප සැරිසරන ලද්දේ ය. නොයෙක් කල්ප සියගණන් සැරිසරන ලද්දේය. නොයෙක් කල්ප දහස්ගණන් සැරිසරන ලද්දේය. නොයෙක් කල්ප ලක්ෂගණන් සැරිසරන ලද්දේය. ඊට හේතුව කවරේද? මහණෙනි, මේ සංසාරයේ මුලක් අගක් දැකගත නොහැකි වීම ය.

අනමතග්ග සංයුත්තයේම එන සාසප සූත්‍රයේ කල්පයේ දීර්ඝ බව ගැන තවත් විශේෂ උපමාවක් දැක්වෙයි.

**සෙය්‍යථාපි, භික්ඛු, ආයසං නගරං යොජනං ආයාමෙන යොජනං විත්ථාරෙන යොජනං උබ්බෙධෙන, පුණ්ණං සාසපානං ගුළිකාබද්ධං. තතො පුරිසො වස්සසතස්ස වස්සසතස්ස අච්චයෙන එකමෙකං සාසපං උද්ධරෙය්‍ය. ඛිප්පතරං ඛො සො, භික්ඛු මහාසාසපරාසි ඉමිනා උපක්කමෙන පරික්ඛයං පරියාදානං ගච්ඡෙය්‍ය, න ත්වෙව කප්පො.**

මහණ, යම්සේ වනාහි දිගින් යොදුනක් ඇත්තා වූ, පළලින් යොදුනක් ඇත්තා වූ, උසින් යොදුනක් ඇත්තා වූ, කොත ගසන ලද්දා වූ, යකඩින් කරන ලද ප්‍රාකාරයෙන් ඇති, එහි මුළුමනින්ම අබ පුරවන ලද නගරයක් වෙයි. ඉනික්බිති එක්තරා පුරුෂයෙක් වසර සියයකට සියයකට වරක් එක් අබ ඇටය, එක් අබ ඇටය ගෙන නගරයෙන් පිටට විසි කරන්නේ වේද, මහණ මේ ක්‍රමයෙන් නගරයේ ඒ මහා අබ ගොඩ වහා කෙළවරවීමට, අවසාන වීමට යන්නේ ය. කල්පය කෙළවර නොවන්නේ ය.

කල්පයක් යනු වර්ෂවලින් මෙපමණ යැයි දැක්විය නොහැකි අති දීර්ඝ කාල පරාසයකි. ඉහත උපමා වලට අනුව කල්පය යනු පෘථිවි වර්ෂවලින් සංඛ්‍යාත්මකව කිව හැකි තරමේ කාල සීමාවක් නොවේ. නිර්වාණ අවබෝධය නොලද ලෝක සත්වයෝ වසර කල්ප කෝටි සත සහස්‍ර අනන්ත කාලයක සිට සසර සැරිසරමින් අප්‍රමාණ දුක් උසුලති. අගක් මුලක් නොදන්නා නිසරු භයංකාර සංසාර ජීවන ගමනක අනන්ත කාලයක සිට සැරිසරති. හිස් අතින් මෙලොවට එති. හිස් අතින් මෙලොවින් යති. නිර්වාණ අවබෝධය නොලබන සත්වයාට මතුවටත් උරුම වන්නේ, මෙතෙක් සසර ඉසිලූ එම දුක්ඛස්කන්ධයම ය. එම එකොළොස් ගින්දරම ය.

මේ සසර පුරා සත්වයෙකු ඉපිද මියගිය වාර ගණන කොපමණද ? මේ ප්‍රශ්නයට භාග්‍යවතුන් වහන්සේ පවා පිළිතුරක් නොදුන් සේක. ඊට හේතුව සත්වයෙකු එසේ සසර තුළ ඉපිද මියගිය වාර ගණන සංඛ්‍යාත්මකව දැක්වීම කළ හැක්කක් නොවීමයි. එසේම එබඳු අති සංකීර්ණ සංඛ්‍යාවක් සාමාන්‍ය ලෝකයාගේ ඥාණයට ගෝචරද නොවීමයි. එක් කල්පයකදි පමණක්, එක් සත්වයෙකු, එක් මහ පොළවක ඉපිද මිය යන වාර ගණන කොපමණදැයි යම් දුරකට වටහාගත හැකි උපමාවක් අනමතග්ග සංයුක්තයේම එන පුග්ගල සූත්‍රයේ විස්තර වෙයි. දඹදිව පිහිටි සුවිසල් වේපුල්ල පර්වතය එහි උපමාවට ගැනෙයි.

**එකපුග්ගලස්ස, භික්ඛවෙ, කප්පං සන්ධාවතො සංසරතො සියා එවං මහා අට්ඨිකඞ්කලො අට්ඨිපුඤ්ජො අට්ඨිරාසි යථායං වෙපුල්ලො පබ්බතො, සචෙ සංහාරකො අස්ස, සම්භතඤ්ච න විනස්සෙය්‍ය. තං කිස්ස හෙතු? අනමතග්ගොයං, භික්ඛවෙ, සංසාරො. පුබ්බා කොටි න පඤ්ඤායති.**

මහණෙනි, මෙසේ කල්පයක් ඇවිදින්නා වූ, හැසිරෙන්නා වූ, එක් පුද්ගලයෙකුගේ මහත් වූ ඇටසැකිලි ගොඩ, අස්ථි ගොඩ, අස්ථි රාශිය, ඉදින් එකතු කරන්නේ නම්, එකතු කරන ලද්දේ විනාශ නොකරන්නේ නම්, මේ වේපුල්ල පර්වතය යම් පමණද එපමණ වන්නේ ය. ඊට හේතු කවරේද ? මහණෙනි, මේ සංසාරයේ මුලක් අගක් දැකගත නොහැකි වීම ය.

**අවිජ්ජානීවරණානං සත්තානං තණ්හාසංයොජනානං සන්ධාවතං සංසරතං. එවං දීඝරත්තං වො, භික්ඛවෙ, දුක්ඛං පච්චනුභූතං තිබ්බං පච්චනුභූතං බ්‍යාසනං පච්චනුභූතං, කටසී වඩ්ඪිතා. යාවඤ්චිදං, භික්ඛවෙ, අලමෙව සබ්බසඞ්ඛාරෙසු නිබ්බින්දිතුං අලං විරජ්ජිතුං අලං විමුච්චිතුන්ති.**

අවිජ්ජාවෙන් වැසුණු, තණ්හාවෙන් ගැට ගැසුණු සත්වයා මේ සසරෙහි දිව යයි, සැරිසරයි. මහණෙනි, එසේ සත්වයා සසර සැරිසරමින් දීර්ඝ කාලයක් පුරා, දීර්ඝ රාත්‍රීන් පුරා, දුකක්ම වැළඳුවේ ය. තියුණු දුකක්ම වැළඳුවේ ය. ව්‍යසනවලටම මුහුණ දුන්නේ ය. අවසානයේ සොහොන් බිමම තර කළේ ය. එහෙයින් මහණෙනි, මේ සියලු සංඛාර කෙරෙහි (රාග, ද්වේෂ, මෝහ චේතනා කෙරෙහි) කලකිරීමට සුදුසුම ය. නොඇලීමට සුදුසුම ය. සියලු සංඛාර කෙරෙන් මිදීමට සුදුසුම ය. සියලු සංඛාර අප්‍රමාදීව ක්ෂය කළ යුත්තේ ය. සියලු සංඛාර නිරෝධ වූ තැන නිවන ඇත්තේ ය. **ඒ උතුම් නිවනම ශාන්ත ය. නිවනම ප්‍රණීත ය.**

## ආස්වාදය යට සැඟවුණු බිහිසුණු ගින්දර

දුගතියේ ප්‍රධාන අපාය වන නිරය, කොටස් වශයෙන් 136 කි. සංජීවය, සංඝාතය, කාල සූත්‍රය, රෞරවය, මහා රෞරවය, තාපය, ප්‍රතාපය, අවීචිය යනුවෙන් මහ නිර 08 කි. එක් නිරයක් වටා ඔසුපත් නිර 16 බැගින් අනු නිර 128 කි. මෙයින් බොහෝ නිර මහා ගිනි අපායන් ය. අවීචි මහ නිරය යනු උපරිම තාපය ඇති නිරයයි. මේ සැම නිරයකටම හිමි තාපය තීරණය වී ඇත්තේ, ගිනිදැල් හට ගෙන ඇත්තේ ඒවායෙහි දඬුවම් ලබන නිර සත්වයින්ගේ කර්ම ශක්තිය අනුව ය. කාමය නොහොත් ආශාවන් කරණ කොටගෙන, බැඳීම් නොහොත් ප්‍රේමය කරණ කොටගෙන බොහෝ සත්වයෝ දස අකුසලයේ යෙදී, පංච දුශ්චරිතයේ නියැලී පව්කම් කොට මරණින් පසු නිරගත වෙති.

**අප්පකා තෙ භික්ඛවෙ, සත්තා යෙ මනුස්සා චුතා මනුස්සෙසු පච්චාජායන්ති. අථ ඛො එතෙව බහුතරා සත්තා යෙ මනුස්සා චුතා නිරයෙ පච්චාජායන්ති. තං කිස්ස හෙතු? අදිට්ඨත්තා, භික්ඛවෙ, චතුන්නං අරියසච්චානං.**

මහණෙනි, යම් පමණ සත්වයෝ මිනිස් ලොවින් චුතව නැවත මිනිස් ලොව උපදින්නාහුද, ඒ සත්වයෝ ඉතා ස්වල්ප වෙති. යම් පමණ සත්වයෝ මිනිස් ලොවින් චුතව නිරයෙහි උපදිත්ද, එබඳු සත්වයෝම බොහෝ වෙත්. ඊට හේතු කවරේද ? මහණෙනි, චතුරාර්ය සත්‍යය නොදක්නා ලද බව ය.

චතුරාර්ය සත්‍යය අවබෝධ කර නොගැනීම නිසා, සිය මනසේ සිදුවන ක්‍රියාදාමය කෙබඳුදැයි පෘථග්ජනයා නොදනියි. කර්ම රැස් කර ගැනීම උදෙසා සිය මනසේම ක්‍රියාත්මක වන මාර උගුල වන කාමය, ආස්වාදය, සැපයක් යැයි පෘථග්ජනයා කල්පනා කරයි. කාමය, ආස්වාදය සැපයකි යන අනවබෝධය සහ කාමය, ආස්වාදය කෙරෙහි ඇති ඇල්ම හේතුවෙන් කර්ම රැස් වන බව ඔහු නොදනියි. එනිසාම කර්ම රැස්වීමට හේතුවන කාමය, ප්‍රේමය සැපයකැයි පෘථග්ජනයා සිතයි. කාමය සැපයකැයි සිතමින් ආශාවන් පසුපස ලුහුබඳියි. ප්‍රේමය සැපයකැයි සිතමින් බැඳීම් උදෙසා ජීවිතය කැප කරයි. මෙසේ කාමය සහ ප්‍රේමය හේතු කරගෙන ඔහුගේ මනසේ අප්‍රමාණ රාග, ද්වේෂ, මෝහ චේතනා උපදියි. නැතහොත් කර්ම රැස් වෙයි. **(චෙතනාහං භික්ඛවෙ, කම්මං වදාමි)**. මෙලොව පරලොව ගැන නිසි වැටහීමක් නැති පෘථග්ජනයා ස්වභාවයෙන්ම ග්‍රහණය වන්නේ පාපී සිතේ ග්‍රහණයට ය. කාමය සහ ප්‍රේමය උදෙසා, ආස්වාදය සතුට උදෙසා ඕනෑම පාප කර්මයක් කිරීමට, ඕනෑම අකුසලයක යෙදීමට ධර්මය ගැන නොදන්නා අඥානයා පසුබට නොවෙයි. ලෝකයේ වැඩි වශයෙන්ම ඉන්නේ ධර්මය ගැන වැටහීමක් නැති එබඳු අඥාන සත්වයන් ය. එබැවින් මරණින් පසු, ලොව වැඩිම දෙනෙකු ගමන් කරන්නේ අති බිහිසුණු නිරයට බව බුදු පියාණන් වහන්සේ පෙන්වා දෙන සත්‍යයයි.

සත්වයා තුළ සියලු පාපි අදහස් හට ගන්නේ ආස්වාදය කරණ කොටගෙන ය. ආස්වාදය සැපයකැයි යන වැරැදි වැටහීම මුල්කොට ගෙන ය. ඇස, කන, නාසය, දිව, ශරීරය, මනස පිනවීම සැපයකැයි පෘථග්ජනික ලෝක සත්වයා අනවබෝධයෙන් විශ්වාස කරති. ඇස, කන, නාසය, දිව, ශරීරය, මනස පිනවීම තුළින් ලබන ආස්වාදය හැර අන් සතුටක් ගැන ඔව්හු නොදනිති. එබැවින් ආස්වාදය යනු ජීවිතයේ ලද හැකි එකම සැපය යැයි

මුළාවෙන් විශ්වාස කරති. එම ආස්වාදය උදෙසා ඕනෑම ආකාරයක කැප කිරීමක් සිදු කිරීමට මැළි නොවෙති. රාගයෙන් රත් වූ කාමයෙන් තෙත් වූ ප්‍රේමයෙන් මත් වූ මනසකින් යුක්ත අඥාණ ලෝක සත්වයා, ධර්මය අධර්මය තෝරා ගත නොහැකිව අන්ධව, අධර්මයම අතට ගෙන කෙසේ හෝ ආස්වාදය විඳ ගැනීමට වැර දරති. ඒ නිසාම බොහෝ පව්කම්වල යෙදෙති. අනවබෝධයෙන් ගෙවෙන එබඳු ජීවිතයක් තුළ මරණය තෙක්ම රැස්වන බලවත් පාප කර්ම නිසා, බොහෝ සත්වයෝ මරණින් පසු නිරගත වෙති. නිරයේ අති බිහිසුණු නිර ගිනිදැල් අතර අනන්ත අප්‍රමාණ දුක් ගිනි උසුලති.

නිරයේ නිර සතුන් උසුලන අප්‍රමාණ දුක් ගැන කලකිරෙන යම රජු පවා උතුම් සම්බුද්ධ සාසනයක උපත ලැබ නිවන් දකින්නට ප්‍රාර්ථනා කරන බව මජ්ඣිම නිකායේ, උපරිපණ්ණාසකයේ, සුඤ්ඤතවග්ගයේ එන දේවදූත සූත්‍රයේ දැක්වෙයි.

**භූතපුබ්බං, භික්ඛවෙ, යමස්ස රඤ්ඤො එතදහොසි, යෙ කිර , භො, ලොකෙ පාපකානි අකුසලානි කම්මානි කරොන්ති තෙ එවරූපා විවිධා කම්මකාරණා කරීයන්ති. අහො වතාහං මනුස්සත්තං ලභෙයාං. තථාගතො ච ලොකෙ උප්පජ්ජෙය්‍ය අරහං සම්මාසම්බුද්ධො. තඤ්චාහං භගවන්තං පයිරුපාසෙය්‍යං. සො ච මෙ භගවා ධම්මං දෙසෙය්‍ය. තස්ස චාහං භගවතො ධම්මං ආජානෙය්‍යන්ති.**

**තං ඛො පනාහං, භික්ඛවෙ, නාඤ්ඤස්ස සමණස්ස වා බ්‍රාහ්මණස්ස වා සුත්වා වදාමි, අපි ච යදෙව සාමං ඤාතං සාමං දිට්ඨං සාමං විදිතං තදෙවාහං වදාමී ති.**

මහණෙනි, පෙරවූ දෙයක් කියමි. යම් කලෙක යම රජුට මෙබඳු සිතක් විය. පින්වත්නි, ලෝකයෙහි යම් කෙනෙක් පාප කර්ම කෙරෙත්ද, ඔවුන්ගේ කර්ම අනුව මෙබඳු නානාප්‍රකාර දුක් කම්කටොළු ලබත්. අහෝ ! අරිහත් වූ, සම්මා සම්බුද්ධ වූ සර්වඥ රාජයාණන් වහන්සේ ලොව උපන් කලෙක මනුෂ්‍ය අත් භවයක් ලැබේ නම් කොපමණ ලාභයක්ද ! එසේ නම් මමත් ඒ භාග්‍යවතුන් වහන්සේගේ ආශ්‍රය ලබමි, එවිට භාග්‍යවතුන් වහන්සේ මටත් ධර්ම දේශනා කරත්. භාග්‍යවතුන් වහන්සේ මට ධර්මය දේශනා කරන්නේ නම්, මම ඒ උතුම් ධර්මය අප්‍රමාදීව දැන ගනිමි, කියායි.

මහණෙනි, මම ඒ කාරණය අන් ශ්‍රමණයකුගෙන් හෝ බමුණකුගෙන් හෝ අසා නොකියමි. වැලිදු කෙසේද යම් පමණ නරකයෝ වෙත්ද, ඒ සියල්ල තමන් විසින්ම දැනගන්නා ලද්දේද, තමන් විසින්ම දක්නා ලද්දේද, තමන් විසින්ම ප්‍රත්‍යක්ෂ කරන ලද්දේද, එයම මම කියමි.

ලොව්තුරා සම්බුදු පියාණන් වහන්සේගේ අසමසම බුදු නුවණින් බුද්ධ දිවැසින් දුටු ආකාරයට, නිරයේ බිහිසුණුකම සිය දැසින්ම දකින යම රජු පවා, බුද්ධෝත්පාද කාලයක ලබන උතුම් මනුෂ්‍ය අත්භවයක මහාර්ඝ වටිනාකම වටහා ගනියි. එබඳු කාලයක ඉපිද අප්‍රමාදිව සද්ධර්මය අසා අවබෝධ කරගෙන මේ මහා බිහිසුණු නිරය ප්‍රමුඛ සතර අපාය සහිත ඝෝර කටුක සංසාර දුකින් මිදී නිවන් දැකීමේ අපරිමෙය්‍ය වටිනාකම දකියි.

එසේ නම් මෙබඳු අත්‍යන්ත උතුම් බුද්ධෝත්පාද කාලයක උපන් නුවණැති මිනිසුන් අප්‍රමාදීව කළ යුතු යමක් ඇත්නම් ඒ එකම කර්තව්‍යය, අමා මෑණි බුදු පියාණන් වහන්සේ දේශනා කොට වදාළ පරම උත්තරීතර නිර්වාණ මාර්ගය, බුදු බණ අසා අවබෝධ කර ගැනීමයි.

ධර්මයට අනුව විමසා බැලූ විට සත්වයෙකුට නිරය පවා උරුම වන්නේ ආස්වාදය කරණ කොට ගෙන ය. ඇස, කන, නාසය, දිව, ශරීරය, මනස පිනවමින් සතුට සොයන්නට යාම තුළ ය. නිරයේ පමණක් නොව, සියලු ලෝක පුරා සියලු ලෝ සතුන් කායිකව සහ මානසිකව නොයෙක් ගිනි උසුලන්නේ ආස්වාදය මුල් කරගෙන ය. සසරේ සියලු දුක් ගිනිවලට මූල හේතු දෙකකි. ආස්වාදය පිළිබඳ නොයෙක් ආශාවන් නොහොත් කාමයන් වෙයි. කාමය යනු අවිජ්ජාවයි. එම අවිජ්ජාව හේතුවෙන් ඇල්ම නොහොත් ආලය හට ගනියි. ආලය යනු තණ්හාවයි. අවිජ්ජාව සහ තණ්හාව සංසාර දුක්ඛස්කන්ධයේ මූල හේතු දෙකයි.

**මාතරං පිතරං හන්ත්වා, රාජානො ද්වෙ ච ඛත්තියෙ**

**රට්ඨං සානුචරං හන්ත්වා, අනීඝො යාති බ්‍රාහ්මණො**

අවිජ්ජා තණ්හා නම් මවද පියාද නසා, පින සහ පව් නම් ක්ෂත්‍රිය රජවරු දෙදෙනාද වනසා, පංච උපාදානස්කන්ධය නම් රටද, සළායතන නම් වැසියන්ද නසා වනසා, පණ්ඩිතයෝ විපතින් මිදී යන්නාහ.

## ආස්වාදය අතිශයින් බිහිසුණුය

**සංයුත්තනිකායේ, සළායතනවග්ගපාළියේ, සළායතනසංයුත්තයේ, සමුද්දවග්ගයේ, ආදිත්ත පරියාය සූත්‍රය** තුළ, භාග්‍යවතුන් වහන්සේ ආස්වාදයේ බිහිසුණුභාවය ගැන මෙබඳු දහම් පරියායක් පෙන්වා දෙන සේක.

**ආදිත්තපරියායං වො, භික්ඛවෙ, ධම්මපරියායං දෙසෙස්සාමි. තං සුණාථ. කතමො ච, භික්ඛවෙ, ආදිත්තපරියායො, ධම්මපරියායො ?**

මහණෙනි, තොපට ආදිත්තපරියාය (ඇවිළෙන ආකාරය) නම් වූ දහම් පරියායක් දේශනා කරන්නෙමි. එය අසව් ! කුමක්ද මහණෙනි, ඇවිළෙන ආකාරය නම් වූ දහම් පරියාය ?

### ආස්වාදය විඳීමට වඩා තමා විසින් තමාව නසා දැමීම උතුම්

**දෙඇස හාරා දැමීම උතුම්**

**වරං, භික්ඛවෙ, තත්තාය අයොසලාකාය ආදිත්තාය සම්පජ්ජලිතාය සජොතිභූතාය චක්ඛුන්ද්‍රියං සම්පලිමට්ඨං, න ත්වෙව චක්ඛුවිඤ්ඤෙය්‍යෙසු රූපෙසු අනුබ්‍යඤ්ජනසො නිමිත්තග්ගාහො.**

මහණෙනි, ඇවිළ ගත්තා වූ දිලිසෙන්නා වූ ගිනිදැල් සහිත වූ තියුණු වූ යකඩ කූරකින් දෙඇස හාරා දැමීම උතුම්, ඇසින් දැනගත යුතු ප්‍රිය රූප දැක නිමිති, අනුනිමිති (රූප ලක්ෂණ / අනු ලක්ෂණ) ග්‍රහණය කර ගැනීමට වඩා.

**නිමිත්තස්සාදගථිතං වා, භික්ඛවෙ, විඤ්ඤාණං තිට්ඨමානං තිට්ඨෙය්‍ය, අනුබ්‍යඤ්ජනස්සාදගථිතං වා. තස්මිඤ්චෙ සමයෙ කාලං කරෙය්‍ය, ඨානමෙතං විජ්ජති, යං ද්වින්නං ගතීනං අඤ්ඤතරං ගතිං ගච්ඡෙය්‍ය, නිරයං වා, තිරච්ඡානයොනිං වා. ඉමං ඛ්වාහං, භික්ඛවෙ, ආදීනවං දිස්වා එවං වදාමි.**

මහණෙනි, රූපයන්හී නිමිති ලක්ෂණ, අනු ලක්ෂණ ආස්වාදනය කිරීමෙහි ඉතා ඇලුණු බැඳුණු කල, මනසේ කර්ම විඤ්ඤාණයක් බැස ගනියි. එම කර්ම විඤ්ඤාණය විද්‍යාමාන සමයේ හෙතෙම කාලක්‍රියා කළහොත් නිරය හෝ තිරිසන් යෝනිය හෝ යන ගති දෙකෙන් එකක උපදියි. ඇසින් රූප ආස්වාදනය කිරීමේ මේ බිහිසුණු ආදීනවය දැක, මම එසේ වදාරමි.

**දෙකන් පසාරු කිරීම උතුම්**

**වරං, භික්ඛවෙ, තිණ්හෙන අයොසඞ්කුනා ආදිත්තෙන සම්පජ්ජලිතෙන සජොතිභූතෙන සොතින්ද්‍රියං සම්පලිමට්ඨං, න ත්වෙව සොතවිඤ්ඤෙය්‍යෙසු සද්දෙසු අනුබ්‍යඤ්ජනසො නිමිත්තග්ගාහො.**

මහණෙනි, ඇවිළ ගත්තා වූ දිලිසෙන්නා වූ ගිනිදැල් සහිත වූ තියුණු වූ යකඩ හුලකින් දෙකන් පසාරු කිරීම උතුම්, කනින් දැනගත යුතු ප්‍රිය ශබ්ද ආසා නිමිති, අනුනිමිති (ශබ්ද ලක්ෂණ / අනු ලක්ෂණ) ග්‍රහණය කර ගැනීමට වඩා.

**නිමිත්තස්සාදගථිතං වා, භික්ඛවෙ, විඤ්ඤාණං තිට්ඨමානං තිට්ඨෙය්‍ය, අනුබ්‍යඤ්ජනස්සාදගථිතං වා තස්මිඤ්චෙ සමයෙ කාලඞ්කරෙය්‍ය, ඨානමෙතං විජ්ජති, යං ද්වින්නං ගතීනං අඤ්ඤතරං ගතිං ගච්ඡෙය්‍ය, නිරයං වා තිරච්ඡානයොනිං වා. ඉමං ඛ්වාහං, භික්ඛවෙ, ආදීනවං දිස්වා එවං වදාමි.**

මහණෙනි, ශබ්දයන්හී නිමිති ලක්ෂණ, අනු ලක්ෂණ ආස්වාදනය කිරීමෙහි ඉතා ඇලුණු බැඳුණු කල, මනසේ කර්ම විඤ්ඤාණයක් බැස ගනියි. එම කර්ම විඤ්ඤාණය විද්‍යාමාන සමයේ හෙතෙම කාලක්‍රියා කළහොත් නිරය හෝ තිරිසන් යෝනිය යන ගති දෙකෙන් එකක උපදියි. කනින් ශබ්ද ආස්වාදනය කිරීමේ මේ බිහිසුණු ආදීනවය දැක, මෙසේ වදාරමි.

### නාසය උපුටා දැමීම උතුම්

**වරං, භික්ඛවෙ, තිණ්හෙන නඛච්ඡෙදනෙන ආදිත්තෙන සම්පජ්ජලිතෙන සජොතිභූතෙන ඝානින්ද්‍රියං සම්පලිමට්ඨං, න ත්වෙව ඝානවිඤ්ඤෙය්‍යෙසු ගන්ධෙසු අනුබ්‍යඤ්ජනසො නිමිත්තග්ගාහො.**

මහණෙනි, ඇවිළ ගත්තා වූ දිලිසෙන්නා වූ ගිනිදැල් සහිත වූ තියුණු වූ යකඩ නියනකින් නාසය උපුටා දැමීම උතුම්. නාසයෙන් දැනගත යුතු ප්‍රිය ගන්ධ විඳ නිමිති, අනුනිමිති (ගන්ධ ලක්ෂණ / අනු ලක්ෂණ) ග්‍රහණය කර ගැනීමට වඩා.

**නිමිත්තස්සාදගථිතං වා, භික්ඛවෙ, විඤ්ඤාණං තිට්ඨමානං තිට්ඨෙය්‍ය, අනුබ්‍යඤ්ජනස්සාදගථිතං වා තස්මිඤ්චෙ සමයෙ කාලං කරෙය්‍ය. ඨානමෙතං විජ්ජති, යං ද්වින්නං ගතීනං අඤ්ඤතරං ගතිං ගච්ඡෙය්‍ය, නිරයං වා තිරච්ඡානයොනිං වා. ඉමං ඛ්වාහං, භික්ඛවෙ, ආදීනවං දිස්වා එවං වදාමි.**

මහණෙනි, ගන්ධයන්හී නිමිති ලක්ෂණ, අනු ලක්ෂණ ආස්වාදනය කිරීමෙහි ඉතා ඇලුණු බැඳුණු කල, මනසේ කර්ම විඤ්ඤාණයක් බැස ගනියි. එම කර්ම විඤ්ඤාණය විද්‍යාමාන සමයේ හෙතෙම කාලක්‍රියා කළහොත් නිරය හෝ තිරිසන් යෝනිය යන ගති දෙකෙන් එකක උපදියි. නාසයෙන් ගන්ධ ආස්වාදනය කිරීමේ මේ බිහිසුණු ආදීනවය දැක, මෙසේ වදාරමි.

### දිව කපා දැමීම උතුම්

**වරං භික්ඛවෙ, තිණ්හෙන ඛුරෙන ආදිත්තෙන සම්පජ්ජලිතෙන සජොතිභූතෙන ජිව්හින්ද්‍රියං සම්පලිමට්ඨං, න ත්වෙව ජිව්හාවිඤ්ඤෙය්‍යෙසු රසෙසු අනුබ්‍යඤ්ජනසො නිමිත්තග්ගාහො.**

මහණෙනි, ඇවිළ ගත්තා වූ දිලිසෙන්නා වූ ගිනිදැල් සහිත වූ තියුණු වූ යකඩ පිහියකින් දිව කපා දැමීම උතුම්, දිවෙන් දැනගත යුතු ප්‍රිය රස විඳ නිමිති, අනුනිමිති (රස ලක්ෂණ / අනු ලක්ෂණ) ග්‍රහණය කර ගැනීමට වඩා.

**නිමිත්තස්සාදගථිතං වා, භික්ඛවෙ, විඤ්ඤාණං තිට්ඨමානං තිට්ඨෙය්‍ය, අනුබ්‍යඤ්ජනස්සාදගථිතං වා තස්මිඤ්චෙ සමයෙ කාලං කරෙය්‍ය. ඨානමෙතං විජ්ජති, යං ද්වින්නං ගතීනං අඤ්ඤතරං ගතිං ගච්ඡෙය්‍ය, නිරයං වා තිරච්ඡානයොනිං වා. ඉමං ඛ්වාහං, භික්ඛවෙ, ආදීනවං දිස්වා එවං වදාමි.**

මහණෙනි, රසයන්හී නිමිති ලක්ෂණ, අනු ලක්ෂණ ආස්වාදනය කිරීමෙහි ඉතා ඇලුණු බැඳුණු කල, මනසේ කර්ම විඤ්ඤාණයක් බැස ගනියි. එම කර්ම විඤ්ඤාණය විද්‍යාමාන සමයේ හෙතෙම කාලක්‍රියා කළහොත් නිරය හෝ තිරිසන් යෝනිය යන ගති දෙකෙන් එකක උපදියි. දිවෙන් රස ආස්වාදනය කිරීමේ මේ බිහිසුණු ආදීනවය දැක, මෙසේ වදාරමි.

**සිරුර සැහැ දැමීම උතුම්**

**වරං, භික්ඛවෙ, තිණ්හාය සත්තියා ආදිත්තාය සම්පජ්ජලිතාය සජොතිභූතාය කායින්ද්‍රියං සම්පලිමට්ඨං, න ත්වෙව කායවිඤ්ඤෙය්‍යෙසු ඵොට්ඨබ්බෙසු අනුබ්‍යඤ්ජනසො නිමිත්තග්ගාහො.**

මහණෙනි, ඇවිළ ගත්තා වූ දිලිසෙන්නා වූ ගිනිදැල් සහිත වූ තියුණු වූ යකඩ වැයකින් සිරුර සැහැ දැමීම උතුම්, සිරුරෙන් දැනගත යුතු ප්‍රිය පහස විද නිමිති, අනුනිමිති (පහස ලක්ෂණ / අනු ලක්ෂණ) ග්‍රහණය කර ගැනීමට වඩා.

**නිමිත්තස්සාදගථිතං වා, භික්ඛවෙ, විඤ්ඤාණං තිට්ඨමානං තිට්ඨෙය්‍ය, අනුබ්‍යඤ්ජනස්සාදගථිතං වා තස්මිඤ්චෙ සමයෙ කාලං කරෙය්‍ය. ඨානමෙතං විජ්ජති, යං ද්වින්නං ගතීනං අඤ්ඤතරං ගතිං ගච්ඡෙය්‍ය, නිරයං වා තිරච්ඡානයොනිං වා. ඉමං ඛ්වාහං, භික්ඛවෙ, ආදීනවං දිස්වා එවං වදාමි.**

මහණෙනි, සපර්ශයන්හී ප්‍රධාන ලක්ෂණ, අනු ලක්ෂණ ආස්වාදනය කිරීමෙහි ඉතා ඇලුණු බැඳුණු කල, මනසේ කර්ම විඤ්ඤාණයක් බැස ගනියි. එම කර්ම විඤ්ඤාණය විද්‍යාමාන සමයේ හෙතෙම කාලක්‍රියා කළහොත් නිරය හෝ තිරිසන් යෝනිය යන ගති දෙකෙන් එකක උපදියි. සිරුරෙන් පහස ආස්වාදනය කිරීමේ මේ බිහිසුණු ආදිනවය දැක, මෙසේ වදාරමි.

## නිදීම උතුම්

**වරං, භික්ඛවෙ, සොත්තං. සොත්තං බො පනාහං, භික්ඛවෙ, වඤ්ඣං ජීවිතානං වදාමි, අඵලං ජීවිතානං වදාමි, මොමූහං ජීවිතානං වදාමි, න ත්වෙව තථාරූපෙ විතක්කෙ විතක්කෙය්‍ය යථාරූපානං විතක්කානං වසං ගතො සඞ්ඝං භින්දෙය්‍ය. ඉමං ඛ්වාහං, භික්ඛවෙ, වඤ්ඣං ජීවිතානං ආදීනවං දිස්වා එවං වදාමි.**

මහණෙනි, නිදීම උතුම්. මහණෙනි, නිදීම වනාහි ජීවිතයේ වඳභාවය යැයි වදාරමි, ජීවිතයේ නිශ්ඵලභාව යැයි වදාරමි, ජීවිතයාගේ මුළාවීම යැයි වදාරමි. අවදියෙන් සිටියදී යම්බඳු වූ අදහස්වල වසඟයට ගියේ සංඝභේදය වැනි අකුසල සිතිවිලි පවා සිතයි. මහණෙනි, අදහස් ආස්වාදනය කිරීමේ මේ බිහිසුණු ආදීනවය දැක, ජීවිතයේ වඳභාවය වුවද, නිදීම උතුම් යැයි වදාරමි.

# අවබෝධයෙන් රැකෙන අරියකන්ත සීලය යනු සළායතනයන්ගේ සංවරයයි

**ඇස හාරා දැමීම තිබේවා, ඇස සංවර කරමි**

**තත්ථ, භික්ඛවෙ, සුතවා අරියසාවකො ඉති පටිසඤ්චික්ඛති, තිට්ඨතු තාව තත්තාය අයොසලාකාය ආදිත්තාය සම්පජ්ජලිතාය සජොතිභූතාය චක්ඛුන්ද්‍රියං සම්පලිමට්ඨං. හන්දාහං ඉදමෙව මනසි කරොමි, ඉති චක්ඛු අනිච්චං, රූපා අනිච්චා, චක්ඛුවිඤ්ඤාණං අනිච්චං, චක්ඛුසම්ඵස්සො අනිච්චො, යම්පිදං චක්ඛුසම්ඵස්සපච්චයා උප්පජ්ජති වෙදයිතං සුඛං වා දුක්ඛං වා අදුක්ඛමසුඛං වා තම්පි අනිච්චං.**

මහණෙනි, එහි සුතවත් අරියසාවක තෙම මෙසේ සලකයි. ඇවිළ ගත්තා වූ දිලිසෙන්නා වූ ගිනිදැල් සහිත වූ තියුණු වූ යකඩ කූරකින් ඇස හාරා දැමීම තිබේවා, මම එයම මෙනෙහි කරමි. මෙසේ ඇස අනිච්ච ය. රූපයෝද අනිච්ච ය. චක්ඛු විඤ්ඤාණයද අනිච්ච ය. චක්ඛු සම්ඵස්සයද අනිච්ච ය. චක්ඛු සම්ඵස්සය නිසා සැප වූ හෝ දුක් වූ හෝ දුක්ද නොවූ සැපද නොවූ හෝ යම් මේ වේදනාවක් උපදීද, එයද අනිච්චයි.

**කන පසාරු කිරීම තිබේවා, කන සංවර කරමි**

**තිට්ඨතු තාව තිණ්හෙන අයොසඞ්කුනා ආදිත්තෙන සම්පජ්ජලිතෙන සජොතිභූතෙන සොතින්ද්‍රියං සම්පලිමට්ඨං. හන්දාහං ඉදමෙව මනසි කරොමි, ඉති සොතං අනිච්චං, සද්දා අනිච්චා, සොතවිඤ්ඤාණං අනිච්චං, සොතසම්ඵස්සො අනිච්චො, යම්පිදං සොතසම්ඵස්සපච්චයා උප්පජ්ජති වෙදයිතං සුඛං වා දුක්ඛං වා අදුක්ඛමසුඛං වා තම්පි අනිච්චං.**

ඇවිළ ගත්තා වූ දිලිසෙන්නා වූ ගිනිදැල් සහිත වූ තියුණු වූ යකඩ හුලකින් කන පසාරු කිරීම තිබේවා, මම එයම මෙනෙහි කරමි. කන මෙසේ අනිච්ච ය. ශබ්දයෝද අනිච්ච ය. සෝත විඤ්ඤාණයද අනිච්ච ය. සෝත සම්ඵස්සයද අනිච්ච ය. සෝත සම්ඵස්සය නිසා සැපවූ හෝ දුක් වූ හෝ දුක්ද නොවූ සැපද නොවූ හෝ යම් මේ වේදනාවක් උපදීද, එයද අනිච්චයි.

**නාසය උපුටා දැමීම තිබේවා, නාසය සංවර කරමි**

**තිට්ඨතු තාව තිණ්හෙන නඛච්ඡෙදනෙන ආදිත්තෙන සම්පජ්ජලිතෙන සජොතිභූතෙන ඝානින්ද්‍රියං සම්පලිමට්ඨං. හන්දාහං ඉදමෙව මනසි කරොමි, ඉති ඝානං අනිච්චං, ගන්ධා අනිච්චා, ඝානවිඤ්ඤාණං අනිච්චං, ඝානසම්ඵස්සො අනිච්චො, යම්පිදං ඝානසම්ඵස්සපච්චයා උප්පජ්ජති වෙදයිතං සුඛං වා දුක්ඛං වා අදුක්ඛමසුඛං වා තම්පි අනිච්චං.**

ඇවිළගත්තා වූ දිලිසෙන්නා වූ ගිනිදැල් සහිත වූ තියුණු වූ යකඩ නියනකින් නාසය උපුටා දැමීම තිබේවා, මම මෙයම මෙනෙහි කරමි. මෙසේ නාසය අනිච්ච ය. ගන්ධයෝද අනිච්ච ය. ඝාණ විඤ්ඤාණයද අනිච්ච ය. ඝාණ සම්ඵස්සයද අනිච්ච ය. ඝාණ සම්ඵස්සයද නිසා සැපවූ හෝ දුක් වූ හෝ දුක්ද නොවූ සැපද නොවූ හෝ යම් මේ වේදනාවක් උපදීද, එයද අනිච්චයි.

**දිව කපා දැමීම තිබේවා, දිව සංවර කරමි**

**තිට්ඨතු තාව තිණ්හෙන ඛුරෙන ආදිත්තෙන සම්පජ්ජලිතෙන සජොතිභූතෙන ජිව්හින්ද්‍රියං සම්පලිමට්ඨං. හන්දාහං ඉදමෙව මනසි කරොමි, ඉති ජිව්හා අනිච්චා, රසා අනිච්චා, ජිව්හාවිඤ්ඤාණං අනිච්චං, ජිව්හාසම්ඵස්සො අනිච්චො, යම්පිදං ජිව්හාසම්ඵස්සපච්චයා උප්පජ්ජති වෙදයිතං සුඛං වා දුක්ඛං වා අදුක්ඛමසුඛං වා තම්පි අනිච්චං.**

ඇවිළගත්තා වූ දිලිසෙන්නා වූ ගිනිදැල් සහිත වූ තියුණු වූ යකඩ පිහියකින් දිව කපා දැමීම තිබේවා, මම මෙයම මෙනෙහි කරමි. මෙසේ දිව අනිච්ච ය. රසයෝද අනිච්ච ය. ජිව්හා විඤ්ඤාණයද අනිච්ච ය. ජිව්හා සම්ඵස්සයද අනිච්ච ය. ජිව්හා සම්ඵස්සය නිසා සැපවූ හෝ දුක් වූ හෝ දුක්ද නොවූ සැපද නොවූ හෝ යම් මේ වේදනාවක් උපදීද, එයද අනිච්චයි.

**කය සැහැ දැමීම තිබේවා, කය සංවර කරමි**

**තිට්ඨතු තාව තිණ්හාය සත්තියා ආදිත්තාය සම්පජ්ජලිතාය සජොතිභූතාය කායින්ද්‍රියං සම්පලිමට්ඨං. හන්දාහං ඉදමෙව මනසි කරොමි, ඉති කායො අනිච්චො, ඵොට්ඨබ්බා අනිච්චා, කායවිඤ්ඤාණං අනිච්චං, කායසම්ඵස්සො අනිච්චො, යම්පිදං කායසම්ඵස්සපච්චයා උප්පජ්ජති වෙදයිතං සුඛං වා දුක්ඛං වා අදුක්ඛමසුඛං වා තම්පි අනිච්චං.**

ඇවිළගත්තා වූ දිලිසෙන්නා වූ ගිනිදැල් සහිත වූ තියුණුවූ මහත් යකඩ වැයකින් කය සැහැ දැමීම තිබේවා, මම මෙයම මෙනෙහි කරමි. මෙසේ කය අනිච්ච ය. ඵොට්ඨබ්බයෝ (කාය පහස) අනිච්ච ය. කාය විඤ්ඤාණය අනිච්ච ය. කාය සම්ඵස්සය අනිච්ච ය. කාය සම්ඵස්සය නිසා සැපවූ හෝ දුක් වූ හෝ දුක්ද නොවූ සැපද නොවූ හෝ යම් වේදනාවක් උපදීද, එයද අනිච්චයි.

**නිදීම තිබේවා, මනස සංවර කරමි**

**තිට්ඨතු තාව සොත්තං. හන්දාහං ඉදමෙව මනසි කරොමි, ඉති මනො අනිච්චො, ධම්මා අනිච්චා, මනොවිඤ්ඤාණං අනිච්චං, මනොසම්ඵස්සො අනිච්චො, යම්පිදං මනොසම්ඵස්සපච්චයා උප්පජ්ජති වෙදයිතං සුඛං වා දුක්ඛං වා අදුක්ඛමසුඛං වා තම්පි අනිච්චං.**

වැදහෙව නිදීම තිබේවා, මම මෙයම මෙනෙහි කරමි. මෙසේ සිත අනිච්ච ය. ධර්මයෝ අනිච්ච ය. මනෝ විඤ්ඤාණය අනිච්ච ය. මනෝ සම්ඵස්සය අනිච්ච ය. මනෝ සම්ඵස්සය නිසා සැපවූ හෝ දුක් වූ හෝ දුක්ද නොවූ සැපද නොවූ හෝ යම් වේදනාවක් උපදීද, එයද අනිච්චයි.

# සුතවත් අරිය සාවකයා ප්‍රඥාවෙන් කලකිරෙයි

**ඇස ගැන ප්‍රඥාවෙන් කලකිරෙයි**

**එවං පස්සං, භික්ඛවෙ, සුතවා අරියසාවකො චක්ඛුස්මිම්පි නිබ්බින්දති, රූපෙසුපි නිබ්බින්දති, චක්ඛුවිඤ්ඤාණෙපි නිබ්බින්දති, චක්ඛුසම්ඵස්සෙපි නිබ්බින්දති, යම්පිදං මනොසම්ඵස්සපච්චයා උප්පජ්ජති වෙදයිතං සුඛං වා දුක්ඛං වා අදුක්ඛමසුඛං වා තස්මිම්පි නිබ්බින්දති.**

මහණෙනි, මෙසේ දක්නා වූ සුතවත් අරියසාවක තෙම ඇස කෙරෙහිද කලකිරෙයි. රූපයන් කෙරෙහිද කලකිරෙයි. චක්ඛුවිඤ්ඤාණය කෙරෙහිද කලකිරෙයි. චකඛුසම්ඵස්සය කෙරෙහිද කලකිරෙයි. චක්ඛු සම්ඵස්සය නිසා සැප වූ හෝ දුක් වූ හෝ දුක්ද නොවූ සැපද නොවූ හෝ යම් වේදනාවක් උපදීද, එහිද කලකිරෙයි.

**කන ගැන ප්‍රඥාවෙන් කලකිරෙයි**

**සොතස්මිම්පි නිබ්බින්දති, සද්දෙසුපි නිබ්බින්දති, සොතවිඤ්ඤාණෙපි නිබ්බින්දති, සොතසම්ඵස්සෙපි නිබ්බින්දති, යම්පිදං සොතසම්ඵස්සපච්චයා උප්පජ්ජති වෙදයිතං සුඛං වා දුක්ඛං වා අදුක්ඛමසුඛං වා තස්මිම්පි නිබ්බින්දති.**

කන කෙරෙහිද කලකිරෙයි. ශබ්දයන් කෙරෙහිද කලකිරෙයි. සෝත විඤ්ඤාණය කෙරෙහිද කලකිරෙයි. සෝතසම්ඵස්සය කෙරෙහිද කලකිරෙයි. සෝත සම්ඵස්සය නිසා සැප වූ හෝ දුක් වූ හෝ දුක්ද නොවූ සැපද නොවූ හෝ යම් වේදනාවක් උපදීද, එහිද කලකිරෙයි.

**නාසය ගැන ප්‍රඥාවෙන් කලකිරෙයි**

**ඝානස්මිම්පි නිබ්බින්දති, ගන්ධෙසුපි නිබ්බින්දති, ඝානවිඤ්ඤාණෙපි නිබ්බින්දති, ඝානසම්ඵස්සෙපි නිබ්බින්දති, යම්පිදං ඝානසම්ඵස්සපච්චයා උප්පජ්ජති වෙදයිතං සුඛං වා දුක්ඛං වා අදුක්ඛමසුඛං වා තස්මිම්පි නිබ්බින්දති.**

නාසය කෙරෙහිද කලකිරෙයි. ගන්ධයන් කෙරෙහිද කලකිරෙයි. ඝාන විඤ්ඤාණය කෙරෙහිද කලකිරෙයි. ඝානසම්ඵස්සය කෙරෙහිද කලකිරෙයි. ඝාන සම්ඵස්සය නිසා සැප වූ හෝ දුක් වූ හෝ දුක්ද නොවූ සැපද නොවූ හෝ යම් වේදනාවක් උපදීද, එහිද කලකිරෙයි.

දිව ගැන ප්‍රඥාවෙන් කලකිරෙයි

**ජිව්හායම්පි නිබ්බින්දති, රසෙසුපි නිබ්බින්දති, ජිව්හාවිඤ්ඤාණෙපි නිබ්බින්දති, ජිව්හාසම්ඵස්සෙපි නිබ්බින්දති, යම්පිදං ජිව්හාසම්ඵස්සපච්චයා උප්පජ්ජති වෙදයිතං සුඛං වා දුක්ඛං වා අදුක්ඛමසුඛං වා තස්මිම්පි නිබ්බින්දති.**

දිව කෙරෙහිද කලකිරෙයි. රසයන් කෙරෙහිද කලකිරෙයි. ජිව්හා විඤ්ඤාණය කෙරෙහිද කලකිරෙයි. ජිව්හා සම්ඵස්සය කෙරෙහිද කලකිරෙයි. ජිව්හාසම්ඵස්සය නිසා සැප වූ හෝ දුක් වූ හෝ දුක්ද නොවූ සැපද නොවූ හෝ යම් වේදනාවක් උපදීද, එහිද කලකිරෙයි.

කය ගැන ප්‍රඥාවෙන් කලකිරෙයි

**කායස්මිම්පි නිබ්බින්දති, ඵොට්ඨබ්බෙසුපි නිබ්බින්දති, කායවිඤ්ඤාණෙපි නිබ්බින්දති, කායසම්ඵස්සෙපි නිබ්බින්දති, යම්පිදං කායසම්ඵස්සපච්චයා උප්පජ්ජති වෙදයිතං සුඛං වා දුක්ඛං වා අදුක්ඛමසුඛං වා තස්මිම්පි නිබ්බින්දති.**

කය කෙරෙහිද කලකිරෙයි. පහස කෙරෙහිද කලකිරෙයි. කාය විඤ්ඤාණය කෙරෙහිද කලකිරෙයි. කාය සම්ඵස්සය කෙරෙහිද කලකිරෙයි. කායසම්ඵස්සය නිසා සැප වූ හෝ දුක් වූ හෝ දුක්ද නොවූ සැපද නොවූ හෝ යම් මේ වේදනාවක් උපදීද, එහිද කලකිරෙයි.

මනස ගැන ප්‍රඥාවෙන් කලකිරෙයි

**මනස්මිම්පි නිබ්බින්දති, ධම්මෙසුපි නිබ්බින්දති, මනොවිඤ්ඤාණෙපි නිබ්බින්දති, මනොසම්ඵස්සෙපි නිබ්බින්දති, යම්පිදං මනොසම්ඵස්සපච්චයා උප්පජ්ජති වෙදයිතං සුඛං වා දුක්ඛං වා අදුක්ඛමසුඛං වා තස්මිම්පි නිබ්බින්දති.**

මනස කෙරෙහිද කලකිරෙයි. අදහස් කෙරෙහිද කලකිරෙයි. මනෝ විඤ්ඤාණය කෙරෙහිද කලකිරෙයි. මනෝ සම්ඵස්සය කෙරෙහිද කලකිරෙයි. මනෝසම්ඵස්සය නිසා සැප වූ හෝ දුක් වූ හෝ දුක්ද නොවූ සැපද නොවූ හෝ යම් වේදනාවක් උපදීද, එහිද කලකිරෙයි.

**නිබ්බින්දං විරජ්ජති, විරාගා විමුච්චති, විමුත්තස්මිං විමුත්තමිති ඤාණං හොති. ඛීණා ජාති, වුසිතං බ්‍රහ්මචරියං, කතං කරණීයං, නාපරං ඉත්ථත්තායාති පජානාති.**

**අයං ඛො, භික්ඛවෙ, ආදිත්තපරියායො, ධම්මපරියායොති.**

කලකිරෙන්නේ නොඇලෙයි. නොඇලෙන්නේ මිදෙයි. මිදුණු කල්හි මිදුණේ ය යන දැනගැනීම වේ. ජාතිය ක්ෂය විය. බ්‍රහ්මචරියාව වැස නිමවන ලද්දේ ය. අත්භවය තුළ මින් මතුවට කළ යුත්තක් නැතැයි දැනගනියි.

මහණෙනි, මේ වනාහි ආදිත්තපරියාය නම් වූ ධම්ම පරියාය යි.

**නත්ථි රාගසමො අග්ගි, නත්ථි දොසසමො කලි**

**නත්ථි ඛන්ධසමා දුක්ඛා, නත්ථි සන්තිපරං සුඛං**

රාගය හා සමාන ගින්නක් නැත. ද්වේෂය හා සමාන දෝෂයක් නැත.

පඤ්චස්කන්ධයන් හා සමාන දුක්ඛයක් නැත. නිවන හා සමාන සැපයක් නැත.

# එකොළොස් ගින්න යන අර්ථයෙන්ද අනිච්ච වෙයි

අනිච්ච යන ප්‍රධාන බුද්ධ වචනය තුළ අප්‍රමාණ ගැඹුරු අර්ථයක් ගැබ්ව පවතී.

**කෙනට්ඨේන අනිච්චා ? උප්පාද වයට්ඨේන අනිච්චා** යනුවෙන් ධර්මයේ ප්‍රධාන වශයෙන් විග්‍රහ වෙයි. ධර්මයේ තවත් තැනක, **අනිච්චං ඛයට්ඨේන** යනුවෙන්ද අර්ථකථනය වෙයි. **අනිච්ච** යන ප්‍රධාන බුද්ධ වචනය අර්ථකථනය වන ආකාරය අනුව කෙනෙකුට නිවන් මග විවෘත වන්නටද, වැසී යන්නටද හැකි ය. එබැවින් තථාගත ලොව්තුරු බුදු පියාණන් වහන්සේ දේශනා කොට වදාළ **අනිච්ච** යන පදය, භාග්‍යවතුන් වහන්සේ විසින්ම නිර්වචනය කර ඇති ආකාරය විමසීමෙන්, උතුම් වූ සද්ධර්මය කෙනෙකුට පහසුවෙන් අවබෝධ කරගෙන මේ භයානක සසර දුක්ඛස්කන්ධයෙන් නිදහස් විය හැකි ය.

**නිර්වාණ ස්වර්ණ ද්වාරය විවර කර දෙන අනිච්ච යන පදයේ අර්ථය කුමක්ද ?**

**උප්පාද වයට්ඨේන අනිච්චා** යන පදයෙන් අර්ථකථනය වන්නේ, සියල්ල හේතුඵල ධර්ම බවයි. හේතු ඇති කල්හී සියල්ල හට ගන්නා බවද, හේතු නොමැති කල්හී සියල්ල නිරෝධ වන බවද, එයින් අදහස් වෙයි. ඒ අනුව **උප්පාද වය අර්ථයෙන්** පෙන්වා දෙනු ලබන්නේ **පටිච්ච සමුප්පාදයයි. සමුදය සහ නිරෝධයයි. සසර උදාවන සහ නිමාවන ආකාරයයි. හේතු නැසීමෙන් සසර උදාවීම සදහටම නිමා කළ හැකි ආකාරයයි.**

**අනිච්චං ඛයට්ඨේන** යන පදයෙන් අර්ථකථනය වන්නේ, සියල්ල ක්ෂය ධර්ම නොහොත් විනාස ධර්ම බවයි. සියල්ල සත්වයාට විනාසයක්ම අත් කර දෙමින් විනාසය කරා පෙරළෙයි. මෙලොවද පරලොවද ජරා මරණ සහිත දුක්ඛස්කන්ධයක්ම උරුම කරදෙයි. එබැවින් පංච උපාදානස්කන්ධය ක්ෂය ධර්මයෝ වෙති. ඒ අනුව **ඛය අර්ථයෙන්** පෙන්වා දෙනු ලබන්නේ මෙලොව පරලොව අත්වන පංච උපාදානස්කන්ධය නම් වූ **විනාස ධර්ම** ගැනයි. පංච උපාදානස්කන්ධය **විනාස ධර්ම බැවින් එය ක්ෂය කළ යුතු ධර්මයකි, ඛය ධර්මයකි. ඛය ධර්ම යනු විනාසය අත් කර දෙන, මොහොතක් පාසා විනාසයටම පත්වන ධර්මයෝ යන්නයි. පංච උපාදානස්කන්ධය යනු විනාසයයි. නිවන යනු අවිනාසයයි. එබැවින් නිවන අවිනාස නම් වෙයි.**

# සියල්ල තුළ පවතින හේතුඵල අනිච්ච ලක්ෂණය

මේ විශ්වයේ පවතින පණ ඇති පණ නැති සියලු ධර්ම ප්‍රධාන ස්කන්ධ පහකට බෙදා දැක්විය හැකි ය. රූප, වේදනා, සඤ්ඤා, සංඛාර, විඤ්ඤාණ යනුවෙන් එම ස්කන්ධ පහ නම් කෙරෙයි. ඊට පංචස්කන්ධයද, පංච උපාදානස්කන්ධයද කියයි.

මෙම පංච උපාදානස්කන්ධය හට ගන්නේ හේතුඵල ධර්මතාවලියකට අනුව ය. සත්වයාගේ සිත කය, බාහිර අරමුණු ඇතුළු සියල්ල පංච උපාදානස්කන්ධයට අයත් ය.

සත්වයාගේ මේ භවයේ ඇස, කන, නාසය, දිව, ශරීරය, මනස යන අභ්‍යන්තර සළායතනත්, රූප, ශබ්ද, ගන්ධ, රස, පහස, අදහස් යන බාහිර සළායතනත් පුරාණ කර්ම විපාක වශයෙන් උපදියි. වත්මන් අත්භවයේ සිත කය සහිත ලෝකය සකස් වී ඇත්තේ පුරාණ කර්මයන්හී විපාක වශයෙනි. එසේම වත්මන් භවයේද නැවත කර්ම රැස් වන්නේ නම්, එහි විපාක වශයෙන් මතු භවය නොහොත් පුනර්භවය සකස් වෙයි.

සංයුත්තනිකායේ, සළායතනවග්ගපාළියේ, සළායතනසංයුත්තයේ, නවපුරාණවග්ගයේ එන කම්ම නිරෝධ සූත්‍රයේ පුරාණ කර්මය සහ නව කර්මය කුමක්දැයි භාග්‍යවතුන් වහන්සේ පෙන්වා දෙන සේක.

**නවපුරාණානි භික්ඛවෙ, කම්මානි දෙසෙස්සාමි, කම්මනිරොධං, කම්මනිරොධගාමිනිඤ්ච පටිපදං. තං සුණාථ, සාධුකං මනසි කරොථ, භාසිස්සාමීති.**

මහණෙනි, නව පුරාණ කර්ම ද, කර්ම නිරෝධයද, කර්ම නිරෝධය පිණිස පිළිපැදිය යුතු ප්‍රතිපදාවද දේශනා කරන්නෙමි. එය අසව් !

**කතමඤ්ච භික්ඛවෙ, පුරාණකම්මං ?**

මහණෙනි, පුරාණ කර්මය කවරේද ?

## පුරාණ කර්මය

**චක්ඛු, භික්ඛවෙ, පුරාණකම්මං අභිසඞ්ඛතං අභිසඤ්චෙතයිතං වෙදනියං දට්ඨබ්බං**

**සොතා පුරාණකම්මා අභිසඞ්ඛතා අභිසඤ්චෙතයිතා වෙදනියා දට්ඨබ්බා**

**ඝානා පුරාණකම්මා අභිසඞ්ඛතා අභිසඤ්චෙතයිතා වෙදනියා දට්ඨබ්බා**

**ජිව්හා පුරාණකම්මා අභිසඞ්ඛතා අභිසඤ්චෙතයිතා වෙදනියා දට්ඨබ්බා**

**කායා පුරාණකම්මා අභිසඞ්ඛතා අභිසඤ්චෙතයිතා වෙදනියා දට්ඨබ්බා**

**මනො භික්ඛවෙ, පුරාණකම්මො අභිසඞ්ඛතො අභිසඤ්චෙතයිතො වෙදනියො දට්ඨබ්බො**

**ඉදං වුච්චති, භික්ඛවෙ, පුරාණකම්මං.**

මහණෙනි ඇස, පුරාණ කර්මය හේතුවෙන් නැවත නැවත සකස් වන (රාග, ද්වේෂ, මෝහ) චේතනා (කර්ම) තුළින් නිර්මාණය වන වේදනාවට ප්‍රස්ථුතයක් යැයි දැකිය යුතුය.

කන, පුරාණ කර්මය හේතුවෙන් නැවත නැවත සකස් වන (රාග, ද්වේෂ, මෝහ) චේතනා (කර්ම) තුළින් නිර්මාණය වන වේදනාවට ප්‍රස්ථුතයක් යැයි දැකිය යුතුය.

නාසය, පුරාණ කර්මය හේතුවෙන් නැවත නැවත සකස් වන (රාග, ද්වේෂ, මෝහ) චේතනා (කර්ම) තුළින් නිර්මාණය වන වේදනාවට ප්‍රස්ථුතයක් යැයි දැකිය යුතුය.

දිව, පුරාණ කර්මය හේතුවෙන් නැවත නැවත සකස් වන (රාග, ද්වේෂ, මෝහ) චේතනා (කර්ම) තුළින් නිර්මාණය වන වේදනාවට ප්‍රස්ථුතයක් යැයි දැකිය යුතුය.

කය, පුරාණ කර්මය හේතුවෙන් නැවත නැවත සකස් වන (රාග, ද්වේෂ, මෝහ) චේතනා (කර්ම) තුළින් නිර්මාණය වන වේදනාවට ප්‍රස්ථුතයක් යැයි දැකිය යුතුය.

මහණෙනි මනස, පුරාණ කර්මය හේතුවෙන් නැවත නැවත සකස් වන (රාග, ද්වේෂ, මෝහ) චේතනා (කර්ම) තුළින් නිර්මාණය වන වේදනාවට ප්‍රස්ථුතයක් යැයි දැකිය යුතුය.

මහණෙනි, මෙය පුරාණ කර්මය යැයි කියනු ලැබේ.

## නව කර්මය

**කතමඤ්ච, භික්ඛවෙ, නවකම්මං ? යං ඛො, භික්ඛවෙ, එතරහි කම්මං කරොති කායෙන වාචාය මනසා, ඉදං වුච්චති, භික්ඛවෙ, නවකම්මං.**

මහණෙනි, නව කර්මය කුමක්ද ? මහණෙනි, මේ වත්මන් කාලයෙහි කයින් වචනයෙන් මනසින් (රාග, ද්වේෂ, මෝහ චේතනාවෙන් යුක්තව) යම් කර්මයක් කෙරේද, මහණෙනි, මෙය නව කර්මය යැයි කියනු ලැබේ.

**කම්මා විපාකා වත්තන්ති**

**විපාකො කම්ම සම්භවො**

**තස්මා පුනබ්භවො හොති**

**එවං ලොකො පවත්තති**

පුරාණ කර්මයෙන් විපාක අත්භවය සැකසෙයි

විපාක අත්භවය තුළ නව කර්මය රැස්වෙයි

නව කර්මයෙන් පුනර්භවය සැකසෙයි

එය ලෝකය නම් සළායතනයන්ගේ පැවැත්මයි

මෙය අනවරත ක්‍රියාවලියකි. අඛණ්ඩ හේතුඵල ක්‍රියාවලියකි. පුරාණ කර්මයෙන් වේදනා දැනගත හැකි ඇස, කන, නාසය, දිව, ශරීරය, මනස යන සළායතන සකසයි. එම සළායතන තුළින් ඇතිවන වේදනා ඇසුරින් නව කර්ම ජනිත වෙයි. නව කර්ම තුළින් ජනිත වන කර්ම ශක්තිය පුනර්භවය පිණිස පුරාණ කර්මය වෙයි. වත්මන් භවයේ නව කර්මය හේතුවෙන් පුනර්භවය සැකසෙයි. පුනර්භවය නොහොත් පරලොව තුළදී නැවත රාග චේතනාවෙන්, ද්වේෂ චේතනාවෙන්, මෝහ චේතනාවෙන් මනස, වචනය, කය පරිහරණය කිරීම නිසා නව කර්ම උපදියි. එම නව කර්ම ඊළඟ පුනර්භවය සකසයි. මේ ආකාරයෙන් අත්භවයෙන් අත්භවය කර්මානුරූපව සැකසෙයි. මෙය හේතුඵල ක්‍රියාවලියකි.

මේ අත්භවයේ අවිජ්ජා, සංඛාර, තණ්හා, උපාදාන, භව හේතු පහ කරණ කොටගෙන, පුනර්භවයේ විඤ්ඤාණ, නාමරූප, සළායතන, ඵස්ස, වේදනා යන විපාක ඵල පහ සකස් වෙයි. එම විපාක භවයේ විඤ්ඤාණ, නාමරූප, සළායතන, ඵස්ස, වේදනා යන ඵල පහ නැවත අනවබෝධයෙන් පරිහරණය කිරීම කරණ කොටගෙන, නැවත අවිජ්ජා, සංඛාර, තණ්හා, උපාදාන, භව යන හේතු පහ උපදියි. නැවත එම අවිජ්ජා, සංඛාර, තණ්හා, උපාදාන, භව හේතු පහ කරණ කොටගෙන, නැවත විඤ්ඤාණ, නාමරූප, සළායතන, ඵස්ස, වේදනා යන විපාක ඵල පහ සකස් වෙයි. හේතු පවතින තුරු මේ ක්‍රියාවලියේ නිමාවක් දැකිය නොහැකි ය.

**ඉති ඉමස්මිං සති ඉදං හොති - ඉමස්සුපාදා ඉමං උප්පජ්ජති**

**ඉති ඉමස්මිං අසති ඉදං න හොති - ඉමස්ස නිරොධා ඉමං නිරුජ්ඣති**

මෙය ඇති කල්හී මෙසේ වෙයි - මෙය උපන් කල්හී මෙය උපදියි

මෙය නොමැති කල්හී මෙසේ නොවෙයි - මෙය නූපන් කල්හී මෙය නූපදියි

පටිච්ච සමුප්පාදය යනු මෙම හේතුඵල ධර්මතාවලියයි. මෙම පටිච්ච සමුප්පාදයට අනුව හේතුඵල වශයෙන් හට ගන්නා විඤ්ඤාණ, නාමරූප, සළායතන, ඵස්ස, වේදනා විපාකස්කන්ධය, දුක්ඛස්කන්ධයක්ම පමණක් බව ප්‍රඥාවෙන් දැකිය යුතු ය. එම දුක්ඛස්කන්ධය උදා කර දෙන අවිජ්ජා, සංඛාර, තණ්හා, උපාදාන, භව හේතු පහද සුඛ වශයෙන් නොව දුක්ඛ බව ප්‍රඥාවෙන් දැකිය යුතු ය.

## විපාක අත්භවයට අයත් ධර්ම

**විඤ්ඤාණ** - පුරාණ කර්මානුරූපව භවයට අංග වූ අරමුණු දැන ගැනීමේ හැකියාව නොහොත් සිත

**නාමරූප** - පුරාණ කර්මානුරූපව ඒ ඒ සත්වයාට උරුම වන පංච උපාදානස්කන්ධය නොහොත් සමස්තයක් වශයෙන් සිතෙහි සහ කයෙහි සහ එම සිත කය මගින් ලබන අරමුණුවල ස්වභාවය

**සළායතන** - පුරාණ කර්මානුරූපව උරුම වන ඇස, කන, නාසය, දිව, ශරීරය, මනස යන හයේ ස්වරූපය

**ඵස්ස** - පුරාණ කර්මානුරූපව විපාක වශයෙන් බාහිර ආයතන සහ අභ්‍යන්තර ආයතන ස්පර්ශ වීම

**වේදනා** - පුරාණ කර්මානුරූපව විපාක වශයෙන් ආයතන තුළින් වේදනා සකස්වීම

මෙම විපාකස්කන්ධය නොහොත් අත්භවය ජාති, ජරා, මරණ, සෝක, පරිදේව, දුක්ඛ, දෝමනස්ස, උපායාස, රාග, ද්වේෂ, මෝහ යන එකොළොස් ගින්නෙන් දැවෙන මහා දුක්ඛස්කන්ධයක් බව, ප්‍රඥාවෙන් දැකීමෙන් විපාකස්කන්ධය තුළින් නැවත නව කර්ම ජනිත නොවෙයි. විපාකස්කන්ධය හේතුවෙන් නැවත අවිජ්ජා, සංඛාර, තණ්හා, උපාදාන, භව හේතු පහ සකස් නොවෙයි. එබැවින් නැවත විඤ්ඤාණ, නාමරූප, සළායතන, ඵස්ස, වේදනා විපාකස්කන්ධය පහළ නොවෙයි. **එය දුක්ඛ නිරෝධයයි. දුක්ඛ නිරෝධය පිණිස ප්‍රථමයෙන් කර්ම නිරෝධ විය යුතුයි.**

**කතමො ච, භික්ඛවෙ, කම්මනිරොධො? යො බො, භික්ඛවෙ, කායකම්ම වචීකම්ම මනොකම්මස්ස නිරොධා විමුත්තිං ඵුසති, අයං වුච්චති, භික්ඛවෙ, කම්මනිරොධො, එතං සංඛාර නිරොධො.**

මහණෙනි, කර්ම නිරෝධය කවරේද? මහණෙනි, යමෙක් වනාහි කාය කර්මය, වචී කර්මය, මනෝ කර්මය යන ත්‍රිවිධ සංඛාර නිරෝධ කිරීමෙන් විමුක්තිය ස්පර්ශ කෙරේද, මහණෙනි, මෙය කර්ම නිරෝධයයි කියනු ලැබේ. එයටම සංඛාර නිරෝධයයි කියනු ලැබේ.

යමෙක් උතුම් සද්ධර්මය අසා අවබෝධයට පත්ව කාමය, ආස්වාදය දුක්ඛ වශයෙන් නුවණින් දකියිද, ඔහුගේ රාගය, ද්වේෂය, මෝහය ක්ෂය වීම ඇරඹෙයි. එවිට ක්‍රම ක්‍රමයෙන් රාග, ද්වේෂ, මෝහ චේතනා නොහොත් සංඛාර ක්‍රම ක්‍රමයෙන් නූපදින තත්වයට පත්වෙයි. **එය කර්ම නිරෝධයයි. එය සංඛාර නිරෝධයයි. එය මනසේ දාහය නිවී යාමයි. එය මනසේ සංසිඳීමයි. එය මනසේ ප්‍රණීතභාවයයි. එය විමුක්තිය ස්පර්ශ කිරීමයි. ඒ පරම සැපත වන නිවනයි.**

**එතං සන්තං එතං පණීතං යදිදං සබ්බ සංඛාර සමථො**

**සබ්භූපදි පටිනිස්සග්ගො තණ්හක්ඛයො විරාගො නිරොධො නිබ්බානන්ති**

සියලු සංඛාරයන්ගේ යම් සමථයක් වේද, එයම ශාන්ත වෙයි, එයම ප්‍රණීත වෙයි.

එය සියලු උපද්‍රවයන්ගේ අත්හැරීම වෙයි. එය ආලයේ නිමාව වෙයි. එය ආස්වාදයෙන් කාමයෙන් වෙන්වීම වෙයි. එය රාග, ද්වේෂ, මෝහ චේතනාවන්ගේ නූපදීම වෙයි. **එය පරම ශාන්ත අමා නිවන වෙයි.**

**කතමා ච, භික්ඛවෙ, කම්මනිරොධගාමිනී පටිපදා? අයමෙව අරියො අට්ඨඞ්ගිකො මග්ගො, සෙය්‍යථීදං, සම්මාදිට්ඨි, සම්මාසඞ්කප්පො, සම්මාවාචා, සම්මාකම්මන්තො, සම්මාආජීවො, සම්මාවායාමො, සම්මාසති, සම්මාසමාධි, අයං වුච්චති, භික්ඛවෙ, කම්මනිරොධගාමිනී පටිපදා.**

මහණෙනි, කර්ම නිරෝධය පිණිස පිළිපැදිය යුතු ප්‍රතිපදාව කවරේද ? මේ ආර්ය අෂ්ඨාංගික මාර්ගයම වේ. එනම් සම්මා දිට්ඨි, සම්මා සංකප්ප, සම්මා වාචා, සම්මා කම්මන්ත, සම්මා ආජීව, සම්මා වායාම, සම්මා සති, සම්මා සමාධි යන මෙය, මහණෙනි, කර්ම නිරෝධය පිණිස පිළිපැදිය යුතු ප්‍රතිපදාව යැයි කියනු ලැබේ.

**සම්මා දිට්ඨි**

**සම්මා සංකප්ප**

**සම්මා වාචා**

**සම්මා කම්මන්ත**

**සම්මා ආජීව**

**සම්මා වායාම**

**සම්මා සති**

**සම්මා සමාධි**

# නිවන් මග නොහොත් ආර්ය අෂ්ඨාංගික මාර්ගය වැඩෙන ආකාරය

කාමය, ආස්වාදය සහිත පංච උපාදානස්කන්ධය, දුක්ඛස්කන්ධය වශයෙන් අවබෝධ වීම හේතුවෙන් කාමය, පංච උපාදානස්කන්ධය සාර යැයි පැවැති සක්කායදිට්ඨිය සහමුලින්ම දුරු වී පැවැත්ම දුක්ඛය නොපැවත්ම සුඛය යන අවබෝධයෙන් යුක්තව පංච උපාදානස්කන්ධයේ නිරෝධය පිණිස ලෝකෝත්තර දහම් ඇස පහළ වීම **සම්මා දිට්ඨිය** වෙයි. සම්මා දිට්ඨියට පත්වීම යනු චතුරාර්ය සත්‍යය අවබෝධ වීමයි. නැතහොත් පටිච්ච සමුප්පාදයේ සමුදය සහ නිරෝධය අවබෝධ වීමයි. චතුරාර්ය සත්‍යය ස්කන්ධ, ආයතන, ධාතු, පටිච්ච සමුප්පාද ධර්ම වශයෙන් පිරිසිඳ දකින තරමට, අවබෝධය වැඩෙන තරමට සම්මා දිට්ඨිය වැඩෙයි. **ඒ සම්මාදිට්ඨි මාර්ග අංගය වැඩෙන ආකාරයයි.**

එසේ **සම්මා දිට්ඨිය** ට පත්ව, නිවන් මග වඩන සුතවත් අරිය සාවකයා, කාමයේ, ආස්වාදයේ, පංච උපාදානස්කන්ධයේ ආදිනව පටිච්ච සමුප්පාදයට අනුව නිරතුරු මෙනෙහි කිරීම තුළ කාම සංකල්පනා පහව යයි. කාම සංකල්පනා පහව යාමෙන් ඇලීම දුරුවෙයි. ඇලීම දුරුවීමෙන් ගැටීම දුරුවෙයි. ගැටීම දුරුවීමෙන් ව්‍යාපාද සංකල්පනා පහව යයි. ඇලීම ගැටීම දුරුවීමෙන් මුළාවද දුරුවෙයි. මුළාව දුරුවීමෙන් විහිංසා සංකල්පනාවන්ද පහව යයි. රාගය, කාමය දුරුවී නෙක්ඛම්ම සංකල්පනා (කාමයෙන් වෙන්වීමේ කල්පනා) වැඩෙයි. ද්වේෂය දුරුවී අව්‍යාපාද සංකල්පනා (මෛත්‍රී සහගත කල්පනා) වැඩෙයි. මෝහය දුරුවී අවිහිංසා සංකල්පනා (කරුණා සහගත කල්පනා) වැඩෙයි. **රාග, ද්වේෂ, මෝහ දුරු වී මනෝ සංඛාරය පිරිසිදු වෙයි. ඒ සම්මාසංකප්ප මාර්ග අංගය වැඩෙන ආකාරයයි.**

එසේ **සම්මා සංකප්ප** මාර්ග අංගය වැඩෙන විට නොහොත් මනසේ කුසලමය අදහස් බහුල වන විට එම සුතවත් අරිය සාවකයාගේ වචනයද සංවර වෙයි. මෙනෙහි කරන දෙයම, අදහස් බවට පත් වෙයි. නොහොත් විතර්ක විචාර (වචී සංඛාර) බවට පත්වෙයි. එම විතර්ක විචාර, වචන බවට පත්වෙයි. වචන මගින් මනසේ පවතින අදහස් ලෝකයට ප්‍රකාශ වෙයි. මනසේ කල්පනා සංවර වන විට වචනද ඒ අනුව සංවර වෙයි. වචනය මුසාවාද (අසත්‍ය වචන කීම), පිසුණාවාචා (කේලාම් කීම), පරුෂාවාචා (කෝප ගන්වන වචන කීම), සම්පප්පලාපා (නිසරු හිස් වචන කීම) යන වචනයෙන් කෙරෙන සිව් අකුසලයෙන් වෙන් වෙයි. **රාග, ද්වේෂ, මෝහ දුරු වී වචී සංඛාරය පිරිසිදු වෙයි. ඒ සම්මාවාචා මාර්ග අංගය වැඩෙන ආකාරයයි.**

එසේ **සම්මා වාචා** මාර්ග අංගය වැඩෙන විට වචනද අකුසලයෙන් වෙන් වන විට, සුතවත් අරිය සාවකයාගේ ක්‍රියාවද සංවර වෙයි. කතා කරන දෙයම, ක්‍රියාවටද හේතු වෙයි. නොහොත් කාය සංඛාර බවට පත්වෙයි. වචනය සංවර වන විට නිතැතින්ම කයද සංවර වෙයි. කිසියම් ක්‍රියාවකට හේතු වන්නේ කිසියම් අදහසකි. අකුසල ක්‍රියාවන්ට හේතු වන්නේ අකුසල අදහස් ය, අකුසල වචන ය. යම් අකුසල අදහසක් උපදින තැනම නසා දමන්නේ නම්, එම අදහස, වචනයක් දක්වා ක්‍රියාවක් දක්වා පැන නොනගී. එසේ වචනය සංවර කර වීමෙන් අකුසල ක්‍රියාද දුරු වී යයි. කයෙන් සිදුවන ප්‍රාණඝාතය (පරපණ නැසීම), අදත්තාදානය (නොදුන් දේ ගැනීම), කාම මිථ්‍යාචාරය යන අකුසල්

කෙරෙන් වෙන් වෙයි. **රාග, ද්වේෂ, මෝහ දුරු වී කාය සංඛාරය පිරිසිදු වෙයි. ඒ සම්මාකම්මන්ත මාර්ග අංගය වැඩෙන ආකාරයයි.**

එසේ **සම්මා දිට්ඨි, සම්මා සංකප්ප, සම්මා වාචා, සම්මා කම්මන්ත** යන මාර්ග අංග හතර වැඩෙන විට, ඒ හේතුවෙන් සුතවත් අරිය සාවකයාගේ දිවි පැවැත්ම ප්‍රසාදජනක වෙයි. ආස්වාදය උදෙසා මෙතෙක් තමන් අතින් සිදු වූ සුළු සුළු පාපයන් අකුසලයන් ඇත්නම් ඒවාද දුරු වී යයි. ජීවිකාව උදෙසා නුසුදුසු වෘත්තියක නියැළුණේ නම් ඒවාද අත්හැරෙයි. ධාර්මික ජීවනෝපායන්ට යොමුවෙයි. ධාර්මිකව ජීවත් වෙයි. එම සුතවත් අරිය සාවකයා තුළ ධාර්මික චින්තන ප්‍රතිපදාවක් දක්නට ලැබෙයි. සතර බ්‍රහ්ම විහරණයෙන් යුක්තව කල් ගෙවන ඔහු තුළින් පාරිශුද්ධ ජීවන චර්යාවක් ප්‍රකට වෙයි. **ඒ ජීවන පැවැත්ම ගෞරවාන්විත වෙයි. ඒ සම්මාආජීව මාර්ග අංගය වැඩෙන ආකාරයයි.**

එසේ **සම්මා ආජීව මාර්ග අංගය** වැඩෙන විට, ඒ හේතුවෙන් සුතවත් අරිය සාවකයාගේ වීර්යය වැඩෙන්නට පටන් ගනියි. වීර්යය සතර ආකාරයකි. ඊට සතර සම්‍යක්පධාන යන නාමයද ව්‍යවහාර වෙයි. උපන් අකුසල් දුරු කිරීම (පහාන පධාන), නූපන් අකුසල් නූපදවීම (සංවර පධාන), උපන් කුසල් ආරක්ෂා කිරීම (අනුරක්ඛණ පධාන), නූපන් කුසල් ඉපදවීම (භාවනා පධාන) යන සතර ආකාරයකට අරිය සාවකයා තුළ වීර්යය වැඩෙයි. එම සතර ආකාර වූ වීර්යය, **ආරද්ධ වීර්යය** ලෙසද ධර්මයේ නම් කෙරෙයි. **කුසලස්ස උපසම්පදා** යන උතුම් බුද්ධ වචනයට අනුකූලව කටයුතු කරන එම වීර්යවන්ත අරිය සාවකයා තුළ අකුසලය දුරු වී කුසලයම වර්ධනය වෙයි. **කුසලයටම නැඹුරු නිවනටම පියමනින ශ්‍රද්ධා බුද්ධිසම්පන්න උතුම් බුද්ධ ශ්‍රාවකයෙකු දක්නට ලැබෙයි. ඒ සම්මාවායාම මාර්ග අංගය වැඩෙන ආකාරයයි.**

එසේ **සම්මා වායාම** මාර්ග අංගය වැඩෙන විට, සුතවත් අරිය සාවකයාගේ සතිය නොහොත් ප්‍රඥාවෙන් ඇතිවන සිහි කල්පනාව බලවත් වෙයි. පංච උපාදානස්කන්ධය පිළිබඳ සතිය පිහිටන ආකාර සතරකි. ඊට සතර සතිපට්ඨානය කියයි. ඇස, කන, නාසය, දිව, ශරීරය යන ආයතනයන්ගේ කාය ක්‍රියාකාරීත්වයන් රාගයෙන් ද්වේෂයෙන් මෝහයෙන් තොරව පැවැත්වීම **කායානුපස්සනාවයි.** ස්පර්ශයන් නිසා ඇතිවන සුඛ වේදනා, දුක්ඛ වේදනා, අදුක්ඛමසුඛ වේදනා යන ත්‍රිවිධ වේදනා හට ගන්නා ආකාරය හේතුඵල දහමට අනුව දකිමින්, සෝමනස්සසහගත සුඛ වේදනා නොහොත් රාග සහගත ආස්වාදය නිරෝධ කිරීම **වේදනානුපස්සනාවයි.** ස්පර්ශයන් නිසා හට ගන්නා සිත් අනුව නුවණින් දකිමින්, ඒ ඒ මොහොතේදි ඇතිවන සරාග, සදෝස, සමෝහ සිත් දුරු කරමින් වීතරාග, වීතදෝස, වීතමෝහ සිත් පැවැත්වීම **චිත්තානුපස්සනාවයි.** මනසේ පවතින පංච නීවරණ නම් සමුදය ධර්ම පහකර සප්ත බොජ්ජංග ආදි නිරෝධ ධර්ම පැවැත්වීම **ධම්මානුපස්සනාවයි. මෙසේ සතර ආකාරයකට සතියේ පාරිශුද්ධභාවය ඇතිවෙයි. ඒ සම්මාසති මාර්ග අංගය වැඩන ආකාරයයි.**

එසේ **සම්මාසති** මාර්ග අංගය වැඩෙන විට, අරිය සාවකයා තුළ **සමථ විදර්ශනා** යන භාවනාද්වය වර්ධනය වෙයි. **සතර සතිපට්ඨානය** වැඩෙන මනසේ පංච නීවරණ සහමුලින්ම පහ වෙමින් ලෝකෝත්තර සමථය හට ගනියි. සමථයට පත් පිරිසිදු මනසේ විදර්ශනා ඥාණ උපදියි. ප්‍රත්‍යවේක්ෂා ඥාණ උපදියි. පටිසම්භිදා ආදි නොයෙක් බුද්ධ ඥාණ උපදියි. සමථ විදර්ශනා යුගනද්ධව වැඩෙන චිත්තය තුළ කෙළෙස් සමුච්ඡේද

ප්‍රහාණයෙන් යුක්තව ලෝකෝත්තර ධ්‍යාන වැඩෙයි. තිලක්ඛණ සංඥා, දස සංඥා, අසුභ සංඥා, අනුස්සති, අනුපස්සනා වැඩෙයි. එසේ සමථ විදර්ශනා වැඩෙන මනස, ඇතුළාන්තයෙන් සංසිඳෙයි, නිශ්චල වෙයි. **මනසේ අකම්පාභාවය, චිත්ත ඒකාග්‍රතාව නොහොත් ආර්ය සමාධිය වැඩෙයි. ඒ සම්මාසමාධි මාර්ග අංගය වැඩෙන ආකාරයයි.**

මෙසේ ලෝකෝත්තර ආර්ය අෂ්ඨාංගික මාර්ගය වැඩී පූර්ණ වීම යනු නිවන් මග මුදුන් ප්‍රාප්ත වීමයි. එසේ මාර්ග අංග අට පූර්ණවීමෙන් අවසානයේ ඵල දෙකක් හිමිවෙයි. ඒ සම්මා ඤාණ, සම්මා විමුක්ති යන ඵලද්වයයි. සම්මා ඤාණය යනු අරිහත් ඵල ඤාණයයි. සම්මා විමුක්තිය යනු අරිහත් ඵල සමාධියයි. **උතුම් නිවන් මග නොහොත් ලෝකෝත්තර ආර්ය අෂ්ඨාංගික මාර්ගය පූර්ණ කරන සප්පුරිස සුතවත් අරිය සාවකයා, අංග දහයක් සහිත දසඅංගෙහිසමන්නාගතො අරහාති වුච්චති, යනුවෙන් වූ උතුම් අරිහත් ඵලය ස්පර්ශ කරති. මේ අත්භවයේදීම නිවන් රසය වළඳති.**

**ඛීණං පුරාණ නවං නත්ථි සම්භවං - විරත්ත චිත්තා ආයතිකෙ භවස්මිං**

**තෙ ඛීණ බීජා අවිරුළ්හීඡන්දා - නිබ්බන්ති ධීරා යථා යං පදීපො**

අවිජ්ජා තණ්හා ආදි කෙලෙස් අනුසයන් දුරු කරන්නේ වේද - නැවත අත්භවය කෙරෙහි ඇල්මක් නොමැත්තේද

ඔහු ඡන්දරාගය නසා සියලු කර්ම බීජ ක්ෂය කරයි. ඒ ප්‍රාඥයාණෝ පහනක් නිවෙන්නා සේ පිරිනිවෙති.

# අනිච්ච ලක්ෂණයෙන් පෙන්වන ද්වතාව

කර්මානුරූපව මෙලොව පරලොව ගොඩ නගන පටිච්ච සමුප්පාදය නොහොත් මෙම හේතුඵල ධර්මතාවලිය තුළ ද්වතාවක් නුවණින් දැකිය හැකි වෙයි.

හේතු ඇති කල්හී රූප, වේදනා, සඤ්ඤා, සංඛාර, විඤ්ඤාණ පංච උපාදානස්කන්ධය හට ගන්නා බවත්, හේතු නොමැති කල්හී රූප, වේදනා, සංඥ්ඤා, සංඛාර, විඤ්ඤාණ පංච උපාදානස්කන්ධය හට නොගන්නා බව නොහොත් නිරෝධ වන බවත් යන ද්වතාව, පටිච්ච සමුප්පාදය තුළ නුවණින් දැකිය හැකි ය. මෙම උප්පාද (ඉපදීම) සහ වය (නූපදීම / නිරෝධය) ලක්ෂණය පටිච්ච සමුප්පාදයට අනුව ප්‍රඥාවෙන් දැකීම අනිච්ච ලක්ෂණය දැකීමයි. එයට උදයව්‍යය ඤාණය කියාද කියයි.

අනිච්ච ලක්ෂණය දැකීමෙන් හේතුන් නිසා හට ගන්නා මෙම පංච උපාදානස්කන්ධය තාවකාලික, ආත්මීය සාරයෙන් ශූන්‍ය, ජරා මරණ සහිත මහා දුක්ඛස්කන්ධයක් පමණක් බව අවබෝධ වෙයි. අත්භවයෙන් අත්භවයට සිදුවන්නේ කර්මය ගෙවීම හා කර්මය රැස්වීම පමණක් බවත්, හේතුඵල වශයෙන් හට ගන්නා වූ අසාර පංච උපාදානස්කන්ධය තුළ මම යනුවෙන් ගත හැකි කිසිදු සාරයක් නොමැති බවත්, පවත්නා සියල්ලද ජරාවෙන්, මරණයෙන් කෙළවර වන බවත්, පවතින කාලය තුළද සෝක, පරිදේව, දුක්ඛ, දෝමනස්ස, උපායාස වලින් පීඩිත ජීවිතයක්ම ගත කරන්නට සිදුවන බවත්, කාමය, ආස්වාදය මේ මහා දුක්ඛස්කන්ධයට ඇද දමන හේතු බවත්, එම කාමයෙන් වෙන් වීමෙන් කර්ම භවය නිරෝධ කර ජාතිය නම් සසර දුක්ඛය සදහටම අවසන් කළ හැකි බවත් අවබෝධ වෙයි. අනිච්ච ලක්ෂණය තුළින් දකින්නේ සත්වයා හේතුඵල වශයෙන් කර්මානුරූපව සසර ඉපිද දුක්විඳ මියයන ආකාරයයි. නැවත නැවත ඉපැදෙමින් ඒ දුකම වළඳන ආකාරයයි.

සියල්ල අනිච්ච වෙයි. කිසිවක් ගැන අපට පූර්ව නිගමනයකට එළැඹිය හැකි නොවේ. හෙට දවසේ ඔබේ ජීවිතයේ සිදු වන්නට නියමිත කෙබඳු සිදුවීමක්දැයි ඇසුවහොත් කිසිවෙකුටත් නිශ්චිත පිළිතුරක් දිය නොහැකි ය. මක්නිසාද යත්, සියල්ල හේතුඵල බැවිනි. හෙට දවස උදාවන්නේද හේතුවක ඵලයක් වශයෙනි. කෙනෙකුට හෙට දවස උදාවන්නේ කර්මයෙන් ආයුෂයෙන් ඊට අවසරයක් ලැබුණොත් පමණි. යම් හෙයකින් අද රාත්‍රියේදි කර්මයෙන් අත්භවය අවසන් කරන්නට නියමිත නම්, ඔහුට හෙට දිනක් උදා වන්නේ නැත. කර්මය යනු එක් හේතුවක් පමණි.

චතුරාර්ය සත්‍යය අනවබෝධය නොහොත් අවිජ්ජාව, කාමයන් කෙරෙහි ආලය, ප්‍රේමය නොහොත් තණ්හාව, මෙනෙහි කරන දෑ (මනෝ සංචේතනා ආහාර), ස්පර්ශය ලබන දෑ (ස්පර්ශ ආහාර), දැනගන්නා දෑ (විඤ්ඤාණ ආහාර), කන බොන දෑ (කන බොන ආහාර) යන සතර ආහාර, සහ වැඩෙන ලක්ෂණය, අත්භවය උදා කරවන ඉතිරි හේතු වේ. අත්භවය නොහොත් පංච උපාදානස්කන්ධය හට ගැනීමට මුල්වන හේතු පහකි.

1. අවිජ්ජාව

2. තණ්හාව

3. කර්මය

4. සතර ආහාර

5. නිබ්බත්ති ලක්ෂණය (වැඩෙන ලක්ෂණය)

මේ හේතු පහ මුල් වී, රූප, වේදනා, සංඥා, සංඛාර, විඤ්ඤාණ යන පංච උපාදානස්කන්ධය උපදියි. මේ හේතු පහ පවතින තුරු පංච උපාදානස්කන්ධය නැවත නැවත හට ගනියි. ජීවන අත්භවය මරණයෙන් කෙළවර වුවද පංච උපාදානස්කන්ධ ක්‍රියාවලිය අවසන් නොවෙයි. එමනිසා අඛණ්ඩව සත්වයාට මෙලොව සහ පරලොව ජීවිත උරුම වෙයි.

නොයෙක් නාමරූප අතර කල් හරින ලෝක සත්වයා මොහොතක් පාසා ස්වකීය සිතටම රැවටී සිදු කරනු ලබන්නේ කර්මය රැස්වන ආකාරයට ජීවත් වීමයි. මාරයා නොහොත් සිතට අවශ්‍ය ආකාරයට කටයුතු කිරීමයි. සිතට අවශ්‍ය ආකාරයට ජීවත් වීමයි. රාගයෙන් ද්වේෂයෙන් මෝහයෙන් යුත් සිතට අවශ්‍ය ආකාරයට ජීවත්වීම යනු අඛණ්ඩව කර්ම රැස්වීමයි.

සද්ධර්මය අසා අවබෝධ කර ගැනීමෙන්ම පමණක් දුක්ඛස්කන්ධයක්ම වූ සසර පැවැත්ම නිරෝධ කළ හැකි ය. ඊට අවශ්‍ය වන්නේ පටිච්ච සමුප්පාදය පිළිබඳ මනා අවබෝධයයි. මෙම හේතු පහ නැවත නැවත සකස්වන තුරු අත්භවය නොහොත් පංච උපාදානස්කන්ධයද නැවත නැවත සකස් වෙයි. එය සපුරාම හේතු ඵල ක්‍රියාවලියකි. හේතු පවතින තුරු ඵලය උපදියි, ඵලය සකස් වෙයි. අවිජ්ජා, සංඛාර, තණ්හා, උපාදාන, භව යන හේතු පහ සහමුලින්ම ක්ෂය කිරීමෙන් රූප, වේදනා, සංඥා, සංඛාර, විඤ්ඤාණ යන පංච උපාදානස්කන්ධය නම් වූ ඵලය නැවත සකස් නොවෙයි. එය පංච උපාදානස්කන්ධයේ නිරෝධය නොහොත් නිවනයි. සදාතනික විමුක්තියයි.

සද්ධර්මය අවබෝධ කර ගැනීමෙන් පසු සත්වයා රාගයෙන් ද්වේෂයෙන් මෝහයෙන් යුත් සිතට අවශ්‍ය ආකාරයට නොව, ප්‍රඥාවෙන් පෙන්වා දෙන දෙන ආකාරයට කටයුතු කරයි. එතුළින් උතුම් නිවනට ළඟාවෙයි.

## පංච උපාදානස්කන්ධයේ ඉපදීම නොහොත් උදය

පටිච්ච සමුප්පාදයේ සමුදය නොහොත් උදය ලක්ෂණය තුළින් පෙන්වා දෙන්නේ ඉහත හේතු පහට අනුව අත්භවය නම් වූ දුක්ඛස්කන්ධය උපදින ආකාරයයි.

**1. අවිජ්ජා සමුදයා රූප, වෙදනා, සඤ්ඤා, සංඛාරා, විඤ්ඤාණං සමුදයො**

**2. තණ්හා සමුදයා රූප, වෙදනා, සඤ්ඤා, සංඛාරා, විඤ්ඤාණං සමුදයො**

**3. කම්ම සමුදයා රූප, වෙදනා, සඤ්ඤා, සංඛාරා, විඤ්ඤාණං සමුදයො**

**4. ආහාර සමුදයා රූප, වෙදනා, සඤ්ඤා, සංඛාරා, විඤ්ඤාණං සමුදයො**

**5. නිබ්බත්ති ලක්ඛණා රූප, වෙදනා, සඤ්ඤා, සංඛාරා, විඤ්ඤාණං සමුදයො**

මේ අත්භවයේ නොහොත් පංච උපාදානස්කන්ධයේ හට ගැනීමයි.

පටිච්ච සමුප්පාදයට අනුව, අත්භවය හට ගැනීමට හේතු වන මේ මූලික හේතු පහ භංග කර දැමීමෙන්, අත්භවය නම් දුක්ඛස්කන්ධය උදාවීම නතර කළ හැකිය.

**හේතුං පටිච්ච සම්භූතං - හේතු භංගා නිරුජ්ඣති**

හේතුන්ගෙන් හටගන්නා ඵලය - හේතු බිඳ හැරීමෙන් නිරුද්ධ වේ

අත්භවය නොහොත් පංච උපාදානස්කන්ධය නම් දුක්ඛස්කන්ධය හට ගන්නේ, අවිජ්ජාව, තණ්හාව, කර්මය, සතර ආහාර, නිබ්බත්තිය යන හේතු පහ නිසා නම් ඒ හේතු පහ බිඳ හැරීමෙන් භවය අවසන් කළ හැකි ය. දුක්ඛස්කන්ධය කෙළවර කළ හැකි ය.

## පංච උපාදානස්කන්ධයේ නූපදීම නොහොත් වය

පටිච්ච සමුප්පාදයේ නිරෝධය නොහොත් වය ලක්ෂණය තුළින් පෙන්වා දෙන්නේ ඉහත හේතු පහ නිරෝධ කිරීම තුළින් අත්භවය නම් වූ දුක්ඛස්කන්ධය නූපදින ආකාරයයි.

**1. අවිජ්ජා නිරොධා රූප, වෙදනා, සඤ්ඤා, සංඛාරා, විඤ්ඤාණං නිරොධො**

**2. තණ්හා නිරොධා රූප, වෙදනා, සඤ්ඤා, සංඛාරා, විඤ්ඤාණං නිරොධො**

**3. කම්ම නිරොධා රූප, වෙදනා, සඤ්ඤා, සංඛාරා, විඤ්ඤාණං නිරොධො**

**4. ආහාර නිරොධා රූප, වෙදනා, සඤ්ඤා, සංඛාරා, විඤ්ඤාණං නිරොධො**

**5. විපරිණාම ලක්ඛණා රූප, වෙදනා, සඤ්ඤා, සංඛාරා, විඤ්ඤාණං නිරොධො**

මේ අත්භවයේ නොහොත් පංච උපාදානස්කන්ධයේ සදාතනික නිමාවයි. නිරෝධයයි.

මෙසේ හේතුන් නිසා අත්භවය හට ගන්නා බවත් විද්‍යමාන වන බවත් පවතින බවත්, හේතු බිඳ හැරීමෙන් අත්භවය හට නොගන්නා බවත් විද්‍යමාන නොවන බවත් නොපවතින බවත්, පටිච්ච සමුප්පාදයට අනුව නුවණින් දැකීම අනිච්ච ලක්ෂණය දැකීමයි.

අනිච්ච ලක්ෂණය දකින්නා වූ සුතවත් අරිය සාවකයා මේ අසාර භව කතරෙන් මුදවන සාර ක්ෂේම භූමිය දකියි. උතුම් නිර්වාණ මාර්ගය දකියි. අනිච්ච ලක්ෂණය දැකීම නිසා සිය ජීවිතය පිළිබඳ මනා අවබෝධයක් ඇති වෙයි. සියල්ල ක්‍රියාත්මක වන හේතුඵල ධර්මය නොහොත් පටිච්ච සමුප්පාදය එසේ නුවණින් දැකීම අනිච්ච ලක්ෂණය දැකීම වෙයි.

අනිච්ච ලක්ෂණය අවබෝධ වීම නිසා ජීවිතය පිළිබඳව මෙතෙක් පැවැති කම්පාව ක්‍රමයෙන් පහ වී යයි. අසාර සිත කය ගැන මම මගේ යනුවෙන් තැවෙමින් දැවෙමින් ගත කළ ජීවිතය, ක්‍රමයෙන් නිවෙන්නට පටන් ගනියි. අත්භවය ගොඩ නංවන හේතු නසමින්, වැළැක්විය හැකි හේතු වළක්වමින්, වැළැක්විය නොහැකි හේතු ගැන උපේක්ෂාවට පත්වෙමින්, දාහය දැවිල්ල සංසිඳුණු සිහිලැල් මනසකින්, අකම්පා්‍ය සිතකින් වාසය කරන්නට ධර්මාවබෝධයෙන් යුක්ත සුතවත් අරිය සාවකයාට අවස්ථාව හිමි වෙයි. ඒ අවබෝධය තුළින් සිතේ, රාගය, ද්වේෂය, මෝහය සහමුලින්ම සිතින් නිවා දමන්නටත් ඔහුට යම් දිනක හැකිවෙයි.

අනිච්ච නොහොත් හේතුඵල වශයෙන් හට ගන්නා සියල්ල තාවකාලික වූද, ජරා මරණ සහිත වූද, අභිමි වන්නා වූද, මොහොතක් පාසා අන්‍ය ස්වභාවයන්ට පත් වන්නා වූද, විනාසය කරාම පරිවර්තනය වන්නා වූද, විනාසයක්ම අත් කර දෙන්නා වූද, සෝක පරිදේව දුක්ඛ දෝමනස්ස උපායාස උරුම කර දෙන්නා වූද මහා දුක්ඛස්කන්ධයකි. එබැවින් ඒ සියල්ල දුක්ඛ ය. එසේම එම ජරා මරණ සහිත දුක්ඛස්කන්ධය තුළ මම මගේ යැයි ආත්මීය සාරයක් වශයෙන් ගත හැකි සහ ගත යුතු රූපයක්, වේදනාවක්, සංඥාවක්,

සංඛාරයක්, විඤ්ඤාණයක් නොමැත. එබැවින් එම දුක්ඛස්කන්ධය සාරයෙන් ශූන්‍ය ය. එබැවින් ඒ සියල්ල අනත්ත ය.

**යදනිච්චං තං දුක්ඛං යං දුක්ඛ තදනත්තා**

යමක් අනිච්ච වේද එය දුක්ඛ ය. යමක් දුක්ඛ වේද එය අනත්ත ය.

එකොළොස් ගින්නෙන් දැවෙන්නා වූ අසාර සිත කය සහිත මෙම පංච උපාදානස්කන්ධය වූ කලී මහා දුක්ඛ අග්නි ජාලාවකි. නොනිවීම ඇවිළෙන්නා වූ මහා යමහලකි. අනන්ත ලෝක සත්වයා මේ අප්‍රමාණ සසර ගිනිදැල් මැද දැවෙන ආකාරය අසමසම බුදු නුවණින් දුටු ලොව්තුරු සම්මා සම්බුදු පියාණන් වහන්සේ ලෝක සත්වයා කෙරෙහි මහා කරුණාවෙන් පෙන්වා වදාළේ, රාග ද්වේෂ මෝහ නම් මනසේ ගිනි නිවා, සසර නම් එකොළොස් ගින්නම නිවා දැමිය හැකි උතුම් ප්‍රඥා මාර්ගයයි. අනිච්ච ලක්ෂණයෙන් පෙන්වා දෙන්නේ, හේතුඵල වශයෙන් ඇවිළෙන ජාති, ජරා, මරණ, සෝක, පරිදේව, දුක්ඛ, දෝමනස්ස, උපායාස, රාගය, ද්වේෂය, මෝහය යන එකොළොස් ගින්න, හේතු නිරෝධ කිරීමෙන් අප්‍රමාදීව නිවා දැමිය යුතු බවයි. **අප්‍රමාදීව එකොළොස් ගින්න නිවා දැමිය යුතු මාර්ගයයි.**

# විශ්වයේ මහා දැවීම සහ මහා නිවීම

සිතෙහි පැවැත්ම යනු වේදනාවේ සහ සංඥාවේ පැවැත්මයි. වේදනාව යනු විඳීම් ය. සංඥාව යනු හැඟීම් ය. අගක් මුලක් නොපෙනෙන මේ අති දීර්ඝතර සසර ගමන තුළ සත්වයා අනේකවිධ වේදනා (විඳීම්) සහ සංඥා (හැඟීම්) වලට මුහුණ දෙයි. එම වේදනා සංඥා අතර අති බහුතර වශයෙන්ම ඇත්තේ දුක් වේදනා සහ දුක් සංඥා (දුක් හැඟීම්) ය.

ධර්මය නොදන්නා අන්ධ බාල අශ්‍රැතවත් පෘථග්ජන ලෝක සත්වයා කාමය, ප්‍රේමය සැපයක් යැයි වරදවා වටහාගෙන ආස්වාදය පතා සිය මනස, වචනය, කය දූෂිත අන්දමින් පරිහරණය කරමින් රැස් කර ගන්නා අකුසල කර්ම ශක්තිය නිසා බොහෝ විට මරණින් මතු උපදින්නේ යොදුන් ගණන් උස ගිනිදැල් ඇති මහා භයානක මහ නිරවල ය. එසේ ඉපිද කල්ප ගණන් අති බිහිසුණු නිර දුක් ගින්නේ පැසෙති. කායිකව සහ මානසිකව අප්‍රමාණ ගිනි මැද දැවෙති.

ආස්වාදය සැපයකැයි වරදවා වටහාගෙන සත්වයා සත්වයා සසර තුළ උහුලන දුක් ගින්න මෙපමණකැයි කිව නොහැකි ය. සසර කොපමණ කලක සිට සත්වයා මේ දුක් ගින්න උසුලනවාදැයි කිසිවෙකුට කිව නොහැකි ය. සසර උපදින තුරු තව කොපමණ කලක් මේ දුක් ගින්න උසුලන්නට සිදුවේදැයි කිසිවෙකුට කිව නොහැකි ය. ඒ සියල්ල හේතුඵල ධර්මයෝ ය. සසර උපදින හේතු පවතින තුරු කැමැත්තෙන් වුවද අකැමැත්තෙන් වුවද මේ දුක් ගින්න උසුලන්නට සත්වයාට සිදු වෙයි.

ආස්වාදය සැප ය. නමුත් ඒ නිසා හිමිවන විපාකස්කන්ධය දුක ය. හේතුව මිහිරි ය. ඵලය අමිහිරි ය. ඒ නිසා ඥාණවන්තයෝ මේ හේතුඵල දහම දැක, ඵලයේ අමිහිරි ආදීනව ගැන නුවණින් මෙනෙහි කර, මිහිරි හේතුව ගැන ඇති ආසාව සිතින් දුරු කරති. **ආසවක්ඛයා නිබ්බානං. සියලු ආසාවන් සිතින් දුරුවීම නිවනයි. සියලු ආසාවන් දුරුවුණු මනසේ ඇත්තේ සදාතනික විවේකයයි. සදාතනික විමුක්තියයි. සදාතනික ශාන්තියයි. සදාතනික සංසිඳීමයි. සදාතනික නිවීමයි.**

# මහාපරිළාහ නම් භයානක නිරයක් ඇත්තේය

**සංයුත්තනිකායේ, මහාවග්ගපාළියේ, සච්චසංයුත්තයේ, පපාතවග්ගයේ, මහා පරිළාහ සූත්‍රයේ** නිරයේ මහා දැවීම ගැනත්, නිරයටත් වඩා මහා භයානක දැවීම ගැනත් මෙසේ දැක්වෙයි.

**අත්ථි, භික්ඛවෙ, මහාපරිළාහො නාම නිරයො. තත්ථ යං කිඤ්චි චක්ඛුනා රූපං පස්සති, අනිට්ඨරූපඤ්ඤෙව පස්සති නො ඉට්ඨරූපං, අකන්තරූපඤ්ඤෙව පස්සති නො කන්තරූපං, අමනාපරූපඤ්ඤෙව පස්සති නො මනාපරූපං.**

මහණෙනි, මහාපරිළාහ, නම් නිරයක් ඇත්තේය. එහි ඇසින් යම්කිසි රූපයක් දකියිද, අනිෂ්ඨ රූපයක්ම දකියි. ඉෂ්ඨ රූපයක් නොදකියි. නොකැමති රූපයක්ම දකියි. කැමැති රූපයක් නොදකියි. අමනාප රූපයක්ම දකියි. මනාප රූපයක් නොදකියි.

**යං කිඤ්චි සොතෙන සද්දං සුණාති, අනිට්ඨසද්දඤ්ඤෙව පස්සති නො ඉට්ඨසද්දං, අකන්තසද්දඤ්ඤෙව පස්සති නො කන්තසද්දං, අමනාපසද්දඤ්ඤෙව පස්සති නො මනාපසද්දං.**

කනින් යම්කිසි ශබ්දයක් අසයිද, අනිෂ්ඨ ශබ්දයක්ම අසයි. ඉෂ්ඨ ශබ්දයක් නොඅසයි. නොකැමති ශබ්දයක්ම අසයි. කැමැති ශබ්දයක් නොඅසයි. අමනාප ශබ්දයක්ම අසයි. මනාප ශබ්දයක් නොඅසයි.

යං කිඤ්චි ඝානෙන ගන්ධං ඵුසති, **අනිට්ඨගන්ධඤ්ඤෙව පස්සති නො ඉට්ඨගන්ධං, අකන්තගන්ධඤ්ඤෙව පස්සති නො කන්තගන්ධං, අමනාපගන්ධඤ්ඤෙව පස්සති නො මනාපගන්ධං.**

නාසයෙන් යම්කිසි ගන්ධයක් ආඝ්‍රානය කරයිද, අනිෂ්ඨ ගන්ධයක්ම ආඝ්‍රානය කරයි. ඉෂ්ඨ ගන්ධයක් ආඝ්‍රානය නොකරයි. නොකැමති ගන්ධයක්ම ආඝ්‍රානය කරයි. කැමැති ගන්ධයක් ආඝ්‍රානය නොකරයි. අමනාප ගන්ධයක්ම ආඝ්‍රානය කරයි. මනාප ගන්ධයක් ආඝ්‍රානය නොකරයි.

යං කිඤ්චි ජිව්හාහෙන රසං ඵුසති, **අනිට්ඨරසඤ්ඤෙව පස්සති නො ඉට්ඨරසං, අකන්තරසඤ්ඤෙව පස්සති නො කන්තරසං, අමනාපරසඤ්ඤෙව පස්සති නො මනාපරසං.**

දිවෙන් යම්කිසි රසයක් විඳියිද, අනිෂ්ඨ රසයක්ම විඳියි. ඉෂ්ඨ රසයක් නොවිඳියි. නොකැමති රසයක්ම විඳියි. කැමැති රසයක් නොවිඳියි. අමනාප රසයක්ම විඳියි. මනාප රසයක් නොවිඳියි.

යං කිඤ්චි කායෙන ඵොට්ඨබ්බං ඵුසති, **අනිට්ඨඵොට්ඨබ්බඤ්ඤෙව පස්සති නො ඉට්ඨ**ඵොට්ඨබ්බං, **අකන්ත** ඵොට්ඨබ්බ**ඤ්ඤෙව පස්සති නො කන්ත**ඵොට්ඨබ්බං, **අමනාප**ඵොට්ඨබ්බ**ඤ්ඤෙව පස්සති නො මනාප**ඵොට්ඨබ්බං.

සිරුරින් යම්කිසි පහසක් ස්පර්ශ කරයිද, අනිෂ්ඨ පහසක්ම ස්පර්ශ කරයි. ඉෂ්ඨ පහසක් ස්පර්ශ නොකරයි. නොකැමති පහසක්ම ස්පර්ශ කරයි. කැමැති පහසක් ස්පර්ශ නොකරයි. අමනාප පහසක්ම ස්පර්ශ කරයි. මනාප පහසක් ස්පර්ශ නොකරයි.

යං කිඤ්චි මනසා ධම්මං විජානාති, **අනිට්ඨධම්මඤ්ඤෙව පස්සති නො ඉට්ඨධම්මං, අකන්තධම්මඤ්ඤෙව පස්සති නො කන්තධම්මං, අමනාපධම්මඤ්ඤෙව පස්සති නො මනාපධම්මං.**

මනසින් යම්කිසි ධර්මයක් (අදහසක්) දැන ගනියිද, අනිෂ්ඨ අදහසක්ම දැන ගනියි. ඉෂ්ඨ අදහසක් දැන නොගනියි. නොකැමති අදහසක්ම දැන ගනියි. කැමැති අදහසක් දැන නොගනියි. අමනාප අදහසක්ම දැන ගනියි. මනාප අදහසක් දැන නොගනියි.

**එවං වුත්තෙ අඤ්ඤතරො භික්ඛු භගවන්තං එතදවොච, මහා වත සො, භන්තෙ, පරිළාහො, සුමහා වත සො, භන්තෙ, පරිළාහො, අත්ථි නු ඛො, භන්තෙ, එතම්හා පරිළාහා අඤ්ඤො පරිළාහො මහන්තතරො චෙව භයානකතරො චාති ?**

මෙසේ කී කල්හී එක්තරා භික්ෂුවක් භාග්‍යවතුන් වහන්සේට මෙය කීයේය. ස්වාමීනි, ඒ දැවීම ඒකාන්තයෙන් අති මහත් ය. ස්වාමීනි, ඒ දැවීම අතිශයින් අති මහත් ය. ස්වාමීනි, ඒ දැවීමට වඩා මහත් වූද, භයානක වූද, අන්‍ය වූ දැවීමක් ඇත්තේ ද ?

**නිරයට වඩා මහා භයානක දැවීමක් ඇත්තේ ය**

**අත්ථි ඛො, භික්ඛු, එතම්හා පරිළාහා අඤ්ඤො පරිළාහො මහන්තතරො ච භයානකතරො චාති.**

මහණ, මේ දැවීමට වඩා, අති මහත් වූද, ඉතා භයානක වූද, අන්‍ය වූ දැවීමක් ඇත්තේ ය.

**කතමො පන, භන්තෙ, එතම්හා පරිළාහා අඤ්ඤො පරිළාහො මහන්තතරො ච භයානකතරො චාති ?**

ස්වාමීනි, මේ දැවීමට වඩා, අති මහත් වූද, ඉතා භයානක වූද, අන්‍ය වූ මහා දැවීම කුමක්ද ?

# විශ්වයේ මහා දැවීම

**යෙ හි කෙචි, භික්ඛවෙ, සමණා වා බ්‍රාහ්මණා වා ඉදං දුක්ඛන්ති යථාභූතං නප්පජානන්ති, අයං දුක්ඛසමුදයොති යථාභූතං නප්පජානන්ති, අයං දුක්ඛනිරොධොති යථාභූතං නප්පජානන්ති, අයං දුක්ඛනිරොධගාමිනී පටිපදාති යථාභූතං නප්පජානන්ති, තෙ ජාතිසංවත්තනිකෙසු සඞ්ඛාරෙසු අභිරමන්ති, ජරාසංවත්තනිකෙසු සඞ්ඛාරෙසු අභිරමන්ති, මරණසංවත්තනිකෙසු සඞ්ඛාරෙසු අභිරමන්ති, සොකපරිදෙවදුක්ඛදොමනස්සුපායාසසංවත්තනිකෙසු සඞ්ඛාරෙසු අභිරමන්ති.**

මහණෙනි, යම්කිසි ශ්‍රමණයෙක් හෝ බ්‍රාහ්මණයෙක් හෝ මේ දුක්ඛ යැයි තත්වූ පරිදි නොදනිත්ද, මේ දුක්ඛයන්ගේ හට ගැනීම යැයි තත්වූ පරිදි නොදනිත්ද, මේ දුක්ඛයන්ගේ නිමාව යැයි තත්වූ පරිදි නොදනිත්ද, මේ දුක්ඛයන් අවසන් කරන ප්‍රඥා පටිපදා මාර්ගය යැයි තත්වූ පරිදි නොදනිත්ද, ඔව්හු ජාතිය (උපත) පිණිස පවත්නා වූ සංඛාර කෙරෙහි ඇලෙත්. ජරාව (මහළුභාවය) පිණිස පවත්නා වූ සංඛාර කෙරෙහි ඇලෙත්. මරණය පිණිස පවතින්නා වූ සංඛාර කෙරෙහි ඇලෙත්. සෝක, පරිදේව, දුක්ඛ, දෝමනස්ස, උපායාස පිණිස පවත්නා වූ සංඛාර කෙරෙහිද ඇලෙත්.

**තෙ ජාතිසංවත්තනිකෙසු සඞ්ඛාරෙසු අභිරතා ජරාසංවත්තනිකෙසු සඞ්ඛාරෙසු අභිරතා මරණසංවත්තනිකෙසු සඞ්ඛාරෙසු අභිරතා සොකපරිදෙව දුක්ඛදොමනස්සුපායාසසංවත්තනිකෙසු සඞ්ඛාරෙසු අභිරතා ජාතිසංවත්තනිකෙපි සඞ්ඛාරෙ අභිසඞ්ඛරොන්ති, ජරා සංවත්තනිකෙපි සඞ්ඛාරෙ අභිසඞ්ඛරොන්ති, මරණ සංවත්තනිකෙපි සඞ්ඛාරෙ අභිසඞ්ඛරොන්ති, සොකපරිදෙව දුක්ඛදොමනස්සුපායාසසංවත්තනිකෙපි සඞ්ඛාරෙ අභිසඞ්ඛරොන්ති.**

ජාතිය පිණිස පවත්නා වූ සංඛාර කෙරෙහි ඇලුණා වූ, ජරාව පිණිස පවත්නා වූ සංඛාර කෙරෙහි ඇලුණා වූ, මරණය පිණිස පවත්නා වූ සංඛාර කෙරෙහි ඇලුණා වූ, ශෝක, පරිදේව, දුක්ඛ, දෝමනස්ස, උපායාස පිණිස පවත්නා වූ සංඛාර කෙරෙහි ඇලුණා වූ ඔව්හු, ජාතිය පිණිස පවත්නා වූ සංඛාරද රැස් කරත්. ජරාව පිණිස පවත්නා වූ සංඛාරද රැස් කරත්. මරණය පිණිස පවත්නා වූ සංඛාරද රැස් කරත්. සෝක, පරිදේව, දුක්ඛ, දෝමනස්ස, උපායාස පිණිස පවත්නා වූ සංඛාරද රැස් කරත්.

**තෙ ජාතිසංවත්තනිකෙපි සඞ්ඛාරෙ අභිසඞ්ඛරිත්වා ජරාසංවත්තනිකෙපි සඞ්ඛාරෙ අභිසඞ්ඛරිත්වා මරණසංවත්තනිකෙපි සඞ්ඛාරෙ අභිසඞ්ඛරිත්වා සොකපරිදෙවදුක්ඛදොමනස්සුපායාසසංවත්තනිකෙපි සඞ්ඛාරෙ අභිසඞ්ඛරිත්වා ජාතිපරිළාහෙනපි පරිඩය්හන්ති, ජරාපරිළාහෙනපි පරිඩය්හන්ති, මරණපරිළාහෙනපි පරිඩය්හන්ති, සොකපරිදෙව දුක්ඛදොමනස්සුපායාසපරිළාහෙනපි පරිඩය්හන්ති. තෙ න පරිමුච්චන්ති ජාතියා ජරාය මරණෙන සොකෙහි පරිදෙවෙහි දුක්ඛෙහි දොමනස්සෙහි උපායාසෙහි. න පරිමුච්චන්ති දුක්ඛස්මාති වදාමි.**

ජාතිය පිණිස පවත්නා වූ සංඛාරද රැස් කොට, ජරාව පිණිස පවත්නා වූ සංඛාරද රැස් කොට, මරණය පිණිස පවත්නා වූ සංඛාරද රැස් කොට, ශෝක, පරිදේව, දුක්ඛ, දෝමනස්ස, උපායාස පිණිස පවත්නා වූ සංඛාරද රැස් කොට, ජාතිය (උපත) නමැති

දාහයෙන් දැවෙත්. ජරාව (මහළුබව) නමැති දාහයෙන් දැවෙත්. මරණය නමැති දාහයෙන් දැවෙත්. ශෝක, පරිදේව, දුක්ඛ, දෝමනස්ස, උපායාස නැමැති දාහයන්ගෙන් දැවෙත්. ඔව්හු ජාති, ජරා, මරණ, සෝක, පරිදේව, දුක්ඛ, දෝමනස්ස, උපායාසයන්ගෙන් නොමිදෙත්. ඔව්හු දුකින් නොමිදෙත් යයි වදාරමි.

මේ භයානක සසර තුළ සත්වයා අනවබෝධය හා ආසාවන් නිසාද දුක් විඳියි. බැඳීම් හා ආදරය නිසාද දුක් විඳියි. චතුරාර්ය සත්‍යය අවබෝධ කර නොගැනීම නිසා, කාමය හා ප්‍රේමය සැපයකැයි වරදවා වටහාගෙන සත්වයා එහි ඇලී ගැලී කටයුතු කරයි. එම නිසාම රාග ද්වේෂ මෝහ චේතනා නොහොත් සංඛාර මනසේ උපදියි. නොහොත් කර්ම රැස්වෙයි. කර්ම රැස්වීම නිසා පුනර්භවය සකස්වෙයි. අත්භවය තුළ දැනටමත් උරුම ජාති, ජරා, මරණ, සෝක, පරිදේව, දුක්ඛ, දෝමනස්ස, උපායාස, රාග, ද්වේෂ, මෝහ යන දුක්ඛස්කන්ධය, පුනර්භවය තුළ නැවත ජනිත වෙයි. එමනිසා කාමය නොහොත් ආසාවන් හේතුවෙන්, ප්‍රේමය නොහොත් බැඳීම් හේතුවෙන්, සත්වයා නැවත නැවත ජාති, ජරා, මරණ, සෝක, පරිදේව, දුක්ඛ, දෝමනස්ස, උපායාස, රාග, ද්වේෂ, මෝහ යන එකොළොස් ගින්නෙන් දැවෙයි. අපමණ කලක සිට අඛණ්ඩව දැවෙයි.

සුගතිය සහ දුගතිය යනුවෙන් සසර උපත, දෙයාකාරයකි. දුගතිය, සතර අපාය ලෙසද හඳුන්වයි. අටමහ නරකය ඇතුළු එකසිය තිස්හයක් වූ නිරය, ලෝකාන්තරික සහ කාලකඤ්ජන යන දෙයාකාර වූ අසුර ලෝකය, දොළාස් ආකාර වූ ප්‍රේත ලෝකය, අපා දෙපා සිව්පා බහුපා යන සතර ආකාර සහ දිය ගොඩ ආකාස යන තුන් ආකාර වූ තිරිසන් ලෝකය, යන ලෝක සතර සතර අපාය නම් වෙයි. මනුෂ්‍ය ලෝකය සහ දෙව් ලොව සය සප්ත කාම ස්වර්ගය වෙයි. බ්‍රහ්ම පාරිසජ්ජයේ සිට අකනිඨාව දක්වා අරූපාවචර බ්‍රහ්ම ලෝක දහසයක් වෙයි. ආකාසානඤ්චායතනයේ සිට නේවසඤ්ඤානාසඤ්ඤායතනය දක්වා අරූපාවචර බ්‍රහ්ම ලෝක සතරකි. මෙසේ එක් සක්වලකට අයත් සමස්ත ලෝක සංඛ්‍යාව තිස් එකකි. මෙම තිස් එක් තලයේ කොතැනක උපන්නත්, ජාති, ජරා, මරණ, සෝක, පරිදේව, දුක්ඛ, දෝමනස්ස, උපායාස, රාග, ද්වේෂ, මෝහ යන දුක්ඛස්කන්ධයෙන් සත්වයාට අත මිදීමක් නැත. අනවරත ජරාවෙන් මරණයෙන් ගැලවීමක් නැත. එබැවින් සසර උපදින තුරු සත්වයාට කිසිදා නිවීමක් අත් නොවේ. මන්දයත්, තමන්ද ඇතුළුව තමන් වටා ඇති සියල්ල මෙම එකොළොස් දුක් ගින්නෙන් නිරන්තරයෙන් දැවෙන බැවිණි. සසර උපදින කිසිදු සත්වයෙකුට මෙම එකොළොස් ගින්නෙන් මිදිය නොහැකි ය. අත්භවයෙන් අත්භවයට රූපය, නාමය වෙනස් වුවත්, රූපය නාමය (නාමරූප) කුමක් වුවත්, සත්වයාට අත්වන්නේ එකම ඉරණමකි. එනම් ජාති, ජරා, මරණ, සෝක, පරිදේව, දුක්ඛ, දෝමනස්ස, උපායාස, රාග, ද්වේෂ, මෝහ යන එකොළාස් ගින්නෙන් දැවෙන්නට ය. ගින්නෙහිම දැවි දැවී උපදිමින් මිය යන්නට ය.

# විශ්වයේ මහා නිවීම

**යෙ ච ඛො කෙචි, භික්ඛවෙ, සමණා වා බ්‍රාහ්මණා වා  අයං දුක්ඛන්ති යථාභූතං පජානන්ති අයං දුක්ඛසමුදයොති යථාභූතං පජානන්ති, අයං දුක්ඛනිරොධොති යථාභූතං පජානන්ති, අයං දුක්ඛනිරොධගාමිනී පටිපදාති යථාභූතං පජානන්ති, තෙ ජාතිසංවත්තනිකෙසු සඞ්ඛාරෙසු නාභිරමන්ති, ජරාසංවත්තනිකෙසු සඞ්ඛාරෙසු නාභිරමන්ති, මරණසංවත්තනිකෙසු සඞ්ඛාරෙසු නාභිරමන්ති, සොකපරිදෙවදුක්ඛදොමනස්සුපායාසසංවත්තනිකෙසු සඞ්ඛාරෙසු නාභිරමන්ති.**

මහණෙනි, යම්කිසි ශ්‍රමණයෙක් හෝ බ්‍රාහ්මණයෙක් හෝ මේ දුක්ඛ යැයි තත්වූ පරිදි දනිත්ද, මේ දුක්ඛයන්ගේ හට ගැනීම යැයි තත්වූ පරිදි දනිත්ද, මේ දුක්ඛයන්ගේ නිමාව යැයි තත්වූ පරිදි දනිත්ද, මේ දුක්ඛයන් අවසන් කරන ප්‍රඥා පටිපදා මාර්ගය යැයි තත් වූ  පරිදි දනිත්ද, ඔව්හු ජාතිය (උපත) පිණිස පවත්නා වූ සංඛාර කෙරෙහි නොඇලෙත්. ජරාව (මහළුභාවය) පිණිස පවත්නා වූ සංඛාර කෙරෙහි නොඇලෙත්. මරණය පිණිස පවතින්නා වූ සංඛාර කෙරෙහි නොඇලෙත්. ශෝක, පරිදේව, දුක්ඛ, දෝමනස්ස, උපායාස පිණිස පවත්නා වූ සංඛාර කෙරෙහිද නොඇලෙත්.

**තෙ ජාතිසංවත්තනිකෙසු සඞ්ඛාරෙසු අනභිරතා, ජරාසංවත්තනිකෙසු සඞ්ඛාරෙසු අනභිරතා, මරණසංවත්තනිකෙසු සඞ්ඛාරෙසු අනභිරතා, සොකපරිදෙවදුක්ඛදොමනස්සුපායාසසංවත්තනිකෙසු සඞ්ඛාරෙසු අනභිරතා, ජාතිසංවත්තනිකෙපි සඞ්ඛාරෙ නාභිසඞ්ඛරොන්ති, ජරාසංවත්තනිකෙපි සඞ්ඛාරෙ නාභිසඞ්ඛරොන්ති, මරණසංවත්තනිකෙපි සඞ්ඛාරෙ නාභිසඞ්ඛරොන්ති, සොකපරිදෙවදුක්ඛදොමනස්සුපායාසසංවත්තනිකෙපි සඞ්ඛාරෙ නාභිසඞ්ඛරොන්ති.**

ජාතිය පිණිස පවත්නා වූ සංඛාර කෙරෙහි නොඇලුණා වූ, ජරාව පිණිස පවත්නා වූ සංඛාර කෙරෙහි නොඇලුණා වූ, මරණය පිණිස පවත්නා වූ සංඛාර කෙරෙහි නොඇලුණා වූ, ශෝක, පරිදේව, දුක්ඛ, දෝමනස්ස, උපායාස පිණිස පවත්නා වූ සංඛාර කෙරෙහි නොඇලුණා වූ ඔව්හු, ජාතිය පිණිස පවත්නා වූ සංඛාරද රැස් නොකරත්. ජරාව පිණිස පවත්නා වූ සංඛාරද රැස් නොකරත්. මරණය පිණිස පවත්නා වූ සංඛාරද රැස් නොකරත්. සෝක, පරිදේව, දුක්ඛ, දෝමනස්ස, උපායාස පිණිස පවත්නා වූ සංඛාරද රැස් නොකරත්.

**තෙ ජාතිසංවත්තනිකෙපි සඞ්ඛාරෙ අනභිසඞ්ඛරිත්වා, ජරාසංවත්තනිකෙපි සඞ්ඛාරෙ අනභිසඞ්ඛරිත්වා, මරණසංවත්තනිකෙපි සඞ්ඛාරෙ අනභිසඞ්ඛරිත්වා, සොකපරිදෙවදුක්ඛදොමනස්සුපායාසසංවත්තනිකෙපි සඞ්ඛාරෙ අනභිසඞ්ඛරිත්වා, ජාතිපරිළාහෙනපි න පරිඩය්හන්ති, ජරාපරිළාහෙනපි න පරිඩය්හන්ති, මරණපරිළාහෙනපි න පරිඩය්හන්ති, සොකපරිදෙවදුක්ඛදොමනස්සුපායාසපරිළාහෙනපි න පරිඩය්හන්ති. තෙ පරිමුච්චන්ති ජාතියා ජරාය මරණෙන සොකෙහි පරිදෙවෙහි දුක්ඛෙහි දොමනස්සෙහි උපායාසෙහි. පරිමුච්චන්ති දුක්ඛස්මාති වදාමි.**

ජාතිය පිණිස පවත්නා වූ සංඛාරද රැස් නොකොට, ජරාව පිණිස පවත්නා වූ සංඛාරද රැස් නොකොට, මරණය පිණිස පවත්නා වූ සංඛාරද රැස් නොකොට, සෝක, පරිදේව, දුක්ඛ, දෝමනස්ස, උපායාස පිණිස පවත්නා වූ සංඛාරද රැස් නොකොට, ජාතිය (උපත) නමැති දාහයෙන් නොදැවෙත්. ජරාව (මහළු බව) නමැති දාහයෙන් නොදැවෙත්. මරණය නමැති දාහයෙන් නොදැවෙත්. සෝක, පරිදේව, දුක්ඛ, දෝමනස්ස, උපායාස නැමැති දාහයන්ගෙන් නොදැවෙත්. ඔව්හු ජාති, ජරා, මරණ, සෝක, පරිදේව, දුක්ඛ, දොමනස්ස, උපායාසයන්ගෙන් මිදෙත්. **ඔව්හු දුකින් මිදෙත් යයි වදාරමි.**

මේ සසර යනු අනන්ත අප්‍රමාණ දුක්ඛ දෝමනස්සයන්ගෙන් ගැවසුණු තැනකි. නිරතුරු දැවෙන මනසින් කල් ගෙවන සතර අපාගත සත්වයට නිවීමක් පෙනෙන මානයක් වත් නැත. සුගතියක උපන්නද කාමය නිසාම, ප්‍රේමය නිසාම අපමණ දාහයන්ගෙන් දැවෙන්නට සිදුවෙයි. බොහෝ සත්වයන්ට සුගතියක උපන්නද නිවීමක් උරුම නැත.

ජාති, ජරා, මරණ, සෝක, පරිදේව, දුක්ඛ, දෝමනස්ස, උපායාස, රාග, ද්වේෂ, මෝහ යන එකොළාස් ගින්නෙන් නිදහස් වූ සදාතනික නිවීමක් ගැන ධර්මය නොදත් පෘථග්ජන අඥ්ඥාණ ලෝක සත්වයාට කිසිදු වැටහීමක් නොමැත. කාලය, දීපය, දේශය, කුලය, මව යන නිවනට අවශ්‍ය අංග පූර්ණව, ත්‍රිහේතුක ප්‍රතිසන්ධියක් නොහොත් ලෝභය - අලෝභය, ද්වේෂය - අද්වේෂය, මෝහය - අමෝහය වෙන් වෙන් වශයෙන් හඳුනා ගැනීමේ ඥාණ ශක්තිය සහිත උපතක් ලදහොත්, නිවන ගැන සිතන්නට හෝ අවකාශයක් හෝ උදාවේ. එසේ ඉපිද උතුම් කල්‍යාණ මිත්‍ර සම්පත්තිය හිමි කර ගැනීමට තරම් භාග්‍යවන්ත වන, දක්ෂ වන මහ පිනැතියන් පමණක්, තථාගත අමා මෑණි බුදු පියාණන් වහන්සේ පෙන්වා වදාළ නිර්වාණ ධර්මය අසා අවබෝධ කර ගනියි. ඊට පුණ්‍ය කුසල හේතු සම්පත් ලබයි. උපනිශ්‍රය ලබයි.

එසේ සද්ධර්මය අසා, හේතුඵල ධර්මය නොහොත් පටිච්ච සමුප්පාදය නුවණින් දැකීමෙන් ලබන අවබෝධය තුළින් මනසේ රාග ද්වේෂ මෝහ චේතනා නොහොත් සංඛාර ක්‍රම ක්‍රමයෙන් දුරු වී යයි. රාග ද්වේෂ මෝහ සංඛාර නිරෝධයෙන් රාග ද්වේෂ මෝහ විඥ්ඥාණ නිරෝධ වෙයි. රාග ද්වේෂ මෝහ විඥ්ඥාණ නිරෝධ වී යාමෙන් මනස නිවීමට පත් වෙයි. මනස සංසිඤෙයි. රාග ද්වේෂ මෝහ ගින්දර සමනය වීමෙන් මනස සිහිල් භාවයට පත් වෙයි. සිතද සිහිල් වෙයි. කයද සිහිල් වෙයි. අත්භවයම සිහිල් භාවයට, ශාන්ත භාවයට පත්වෙයි. **රාග ද්වේෂ මෝහ ක්ෂය කිරීම නිවන නම් වෙයි.**

# මනස දවන භය නම් වූ අපමණ ගින්දර

**කාමතො ජායතී සොකො කාමතො ජායතී භයං.** කාමය සෝකය ජනිත කරයි, භය ජනිත කරයි. උතුම් බුද්ධ වචනය එයයි. පරම සත්‍යය එයයි. කාමය යනු තමන් තුළ පවතින නොයෙකුත් ආශාවන් ය. ඇස, කන, නාසය, දිව, ශරීරය, මනස පිනවීමට ආශා කරන සත්වයෝ, තමන්ගේ කාමය නිසාම මෙලොවත් අප්‍රමාණ සෝකයන්ට, භයට මුහුණ දෙති. තමන් ප්‍රිය කරන, ආශා කරන, ආදරය කරන පණ ඇති සහ පණ නැති සියල්ල නිසා සත්වයෝ මනසින් අප්‍රමාණ හැලහැප්පීම් වලට ලක්වෙති. තමන් ආශා කරන දේ ප්‍රිය කරන දේ ළං කර ගැනීම උදෙසා, ළං කරගත් කාමයන් ආරක්ෂා කර ගැනීම උදෙසා ලෝකයා සමග ගැටෙමින් අප්‍රමාණ වෙහෙසක් දරති. දුක් උසුලති. එසේ ආරක්ෂා කර ගත් නමුත් ඒ සියල්ල වියපත් වීමෙන් සහ මරණයෙන් කෙළවර වී යයි. එය දකිමින් ඒ ගැන සිතමින් තව තවත් දුක් වෙමින් වැළපෙති.

කාමයන් ගැනම මෙනෙහි කරමින් කටයුතු කරන සත්වයාට මොහොතක් පාසා කර්ම රැස් වෙයි. මනසේ හට ගන්නා රාග, ද්වේෂ, මෝහ චේතනා නිසා මෙලොවත් මහා මානසික දාහයක් හට ගනියි. රාග, ද්වේෂ, මෝහ චේතනා තුළින් රැස්වන කර්ම ශක්තිය හේතුවෙන් පරලොවද නැවත මෙබඳුම කායික මානසික දාහයන් සහිත මහා දුක්ඛස්කන්ධයක් උරුම වෙයි.

තමන් ආශා කරන, ප්‍රිය කරන දේ අහිමි වෙයි යන භය සහ තමන් දුකට පත්වෙයි යන භය සත්වයා තුළ නිරන්තරයෙන් පවතියි. එම භය හේතුවෙන් සෑම සත්වයෙකුටම මහා මානසික පීඩාවක් හිමි වෙයි. අසාර සිත කය ගැන අවබෝධයක් නොමැතිකමින් සෑම පෘථග්ජනික සත්වයෙකුම අසාර රූප, අසාර වේදනා, අසාර සංඥා, අසාර සංඛාර, අසාර විඤ්ඤාණ සහිත පංච උපාදානස්කන්ධ ක්‍රියාවලිය, සැපවත් සාර ධර්ම යැයි වරදවා වටහාගෙන අහිමි වන අසාර දුක්ඛස්කන්ධයක් උදෙසා අනන්ත අප්‍රමාණ දුක් ගිනි වැළඳ ගනිති. අහිමි වන අසාර දුක්ඛස්කන්ධයක් උදෙසා දිවා රෑ මුළාවෙන් හඬති, වැළපෙති. භයෙන් ත්‍රාසයෙන් තැති ගනිති. සත්වයා තුළ සෝකය, භය හට ගන්නේ ස්වකීය කාමයන් හේතු කොටගෙන ය. මෙලොවත් පරලොවත් කාමය සත්වයාට සෝකයම - භයම අත් කර දෙන බැවින් කාමය, භය වශයෙන් නුවණින් දැකිය යුතු ය.

කාමය හේතුවෙන් සත්වයාට අත්වන අනන්ත අප්‍රමාණ දුක් ගින්දර අසමසම බුදු නුවණින් දුටු තථාගත බුදු පියාණන් වහන්සේ, කාමය ගිනි අඟුරු වලකට උපමා කළ සේක. ගිනි අඟුරු වලකට ඇද වැටෙන සත්වයෙකු අප්‍රමාණ දැවීමකට ලක්වෙයි. ඉසිලිය නොහැකි දුක් වේදනාවක් ඔහුට උරුම වෙයි. කාමය එබඳු දුක උපදවන සුළු ය. කාමය සැප යැයි ඒ පසුපස හඹා යන සත්වයාට ඉමක් නිමක් නැති දුක්ඛ වේදනාවන්ට මුහුණ පෑමට සිදුවෙයි. දිවා රෑ නැතිව දැවීමට ලක්වෙයි. එය ගිනි අඟුරු වලකට ඇද වැටීමක් හා සමාන ය.

**කථඤ්ච භික්ඛවෙ, කාමා දිට්ඨා හොන්ති ? යථාස්ස කාමෙ පස්සතො, යො කාමෙසු කාමච්ඡන්දො කාමස්නෙහො කාමමුච්ඡා කාමපරිළාහො, සො නානුසෙති. සෙය්‍යථාපි, භික්ඛවෙ, අඞ්ගාරකාසු සාධිකපොරිසා පුණ්ණා අඞ්ගාරානං වීතච්චිකානං වීතධූමානං.**

**අථ පුරිසො ආගච්ඡෙය්‍ය ජීවිතුකාමො අමරිතුකාමො සුඛකාමො දුක්ඛපටිකූලො. තමෙනං ද්වෙ බලවන්තො පුරිසා නානාබාහාසු ගහෙත්වා, තං අඞ්ගාරකාසුං උපකඩ්ඪෙය්‍යුං. සො ඉතිචීතිචෙව කායං සන්නාමෙය්‍ය. තං කිස්ස හෙතු? ඤාතඤ්හි, භික්ඛවෙ, තස්ස පුරිසස්ස හෙතු හොති ඉමං චාහං අඞ්ගාරකාසුං පපතිස්සාමි, තතොනිදානං මරණං වා නිගච්ඡිස්සාමි මරණමත්තං වා දුක්ඛන්ති.**

**එවමෙව බො භික්ඛවෙ, අඞ්ගාරකාසූපමා කාමා දිට්ඨා හොන්ති, යථාස්ස කාමෙ පස්සතො, යො කාමෙසු කාමච්ඡන්දො කාමස්නෙහො කාමමුච්ඡා කාමපරිළාහො, සො නානුසෙති.**

මහණෙනි, යම් ආකාරයකින් කාමයන් දක්නාවූ ඔහුට කාමයන්හි යම් කාම ආශාවක්, කාම ස්නේහයක්, කාම මූර්ඡාවක්, කාම දාහයක් වේද, එය නැවත නැවත නොපවතියිද, මහණෙනි, ඔහු විසින් ඒ ආකාරයෙන් කාමයෝ නුවණින් දක්නා ලද්දාහුද? මහණෙනි, යම් සේ ගිනි දළු නැති, දුම් නැති, අඟුරු වලින් පිරුණා වූ, පුරුෂයෙකුගේ උසට වැඩියෙන් ගැඹුරු වූ ගිනි අඟුරු වලක් වේද, ඉක්බිති ජීවත්වනු කැමැත්තා වූ, නොමැරෙනු කැමැත්තා වූ, සැප කැමැත්තාවූ, දුක් පිළිකුල් කරන්නාවූ පුරුෂයෙක් එන්නේද, ශක්තිමත් වූ අන්‍ය පුරුෂයෝ දෙදෙනෙක් ඔහු වෙනවෙනම අත්වලින් අල්වා ඒ අඟුරු වළට අදින්නාහුද, හෙතෙම ශරීරය ඒ අතට මේ අතට නමන්නේ ය. ඊට හේතු කවරේද, මහණෙනි, ඒ පුරුෂයා විසින් මම මේ අඟුරු වළට වැටෙන්නෙම්ද, ඒ හේතුවෙන් මරණයට හෝ මරණය සමාන දුකකට හෝ පැමිණෙමියි, දැනගන්නා ලද්දේ වෙයි.

මහණෙනි, එපරිද්දෙන්ම අඟුරු වළට උපමා ඇත්තා වූ කාමයෝ නුවණින් දැකිය යුත්තාහ. එසේ කාමයන් නුවණින් දක්නා වූ ඔහුට කාමයන්හි යම් කාමාශාවක්, කාම ස්නේහයක්, කාම මූර්ඡාවක්, කාම දාහයක් වේද, එය නැවත නැවත නොපවතියි.

**භායන්ති භික්ඛවෙ, කාමානමෙතං අධිවචනං,** මහණෙනි, භය යනු කාමයට තවත් නමකි. සියලු භය උදා වන්නේ කාමය හේතු කරගෙන බැවින් ආර්ය විනයේ කාමය භය වශයෙන් හඳුන්වයි.

ධර්මයට අනුව සියලු භය උපදින්නේ බාලයාට ය. බාලයා යනු ඥාණය මුහුකුරා නොගිය තැනැත්තා ය. සද්ධර්මයට කන් නොදෙන තැනැත්තා ඥාණයෙන් නොවැඩෙයි. සද්ධර්මයට කන් නොදෙන ඔහුට කිසිදා දුක්ඛ ආර්ය සත්‍යය නොහොත් ආර්යයන් පමණක් නුවණින් දකිනා දුක නම් යථාර්ථය අවබෝධ නොවෙයි. **සුතවත් අරිය සාවකයන් පමණක් නුවණින් දකිනා දුක, කාමයයි.** සියලු දුක්ඛයන්ට මූල හේතුව වන බැවින් කාමය දුක වශයෙන් සුතවත් අරිය සාවකයා ප්‍රඥාවෙන් දකියි. යමක් හේතුවෙන් දුක හිමි වන්නේ නම් ඒ අදාළ අරමුණ දුක වශයෙන් නුවණින් දැකිය යුතු ය. එවිට ඒ දුකින් නිදහස් විය හැකි ය. සතර අපාය ඇතුළු තිස් එක් තලය පුරාම සියලු ලෝ සතුන් අනේකවිධ භීතිකාවන්ගෙන් පෙළෙන්නේ තම තමන්ගේ සංකල්පිත කැමැත්ත නොහොත් කාමය මුල් කරගෙන ය. කාමය මෙලොවත් පරලොවත් සත්වයාට දුකක්ම අත් කර දෙයි. සත්පුරුෂයන් හමු වී සද්ධර්මය නොඇසූ, ඥාණය නොවැඩුණු බාල තෙමේ සෑම විටම නොහික්මුණු සිතේ වුවමනාවන්ට අනුවම කටයුතු කරයි. ආස්වාදය මුල් කරගෙනම කටයුතු කරයි. ආස්වාදය ජීවිතයේ එකම සැපත යැයි විශ්වාස කරයි. ඒ

ආස්වාදය උදෙසා ජීවිතයම කැප කරයි. ආස්වාදය විඳින්නට යාමෙන් අකුසල කර්ම බහුල වශයෙන් රැස් වෙයි. එහෙයින් පවෙහි ඇලුණු බාල තෙමේ මෙලොවත් පරලොවත් දුකක්ම අත් කර ගනියි.

**යානි කානිචි, භික්ඛවෙ, භයානි උප්පජ්ජන්ති සබ්බානි තානි බාලතො උප්පජ්ජන්ති, නො පණ්ඩිතතො. යෙ කෙචි උපද්දවා උප්පජ්ජන්ති සබ්බෙ තෙ බාලතො උප්පජ්ජන්ති, නො පණ්ඩිතතො. යෙ කෙචි උපසග්ගා උප්පජ්ජන්ති සබ්බෙ තෙ බාලතො උප්පජ්ජන්ති, නො පණ්ඩිතතො.**

මහණෙනි, යම්කිසි භයක් උපදී නම් ඒ සියල්ල බාලයා කෙරෙන් උපදී, පණ්ඩිතයා කෙරෙන් නූපදී. යම් කිසි උපද්‍රවයක් උපදී නම් ඒ සියල්ල බාලයා කෙරෙන් උපදී, පණ්ඩිතයා කෙරෙන් නූපදී. යම්කිසි විපතක් උපදී නම් ඒ සියල්ල බාලයා කෙරෙන් උපදී, පණ්ඩිතයා කෙරෙන් නූපදී.

**සෙය්‍යථාපි, භික්ඛවෙ, නළාගාරා වා තිණාගාරා වා අග්ගි මුත්තො කූටාගාරානිපි දහති උල්ලිත්තා වලිත්තානි නිවාතානි ඵුසිතග්ගළානි පිහිතවාතපානානි. එවමෙව ඛො, භික්ඛවෙ, යානි කානිචි භයානි උප්පජ්ජන්ති සබ්බානි තානි බාලතො උප්පජ්ජන්ති, නො පණ්ඩිතතො, යෙ කෙචි උපද්දවා උප්පජ්ජන්ති සබ්බෙ තෙ බාලතො උප්පජ්ජන්ති, නො පණ්ඩිතතො, යෙ කෙචි උපසග්ගා උප්පජ්ජන්ති සබ්බෙ තෙ බාලතො උප්පජ්ජන්ති, නො පණ්ඩිතතො.**

මහණෙනි, යම්කිසි බටකොළ සෙවිළි කළ ගෙයක් හෝ තණකොළ සෙවිලි කළ ගෙයක් හෝ ගිනි ඇවිළුණේ යම් සේ ගේ මුදුන් දවාද, සුණු පිරියම් කළ වෙසෙන තැන්ද, අගුළු ගැසූ දොරවල්ද, වසන ලද වාත කවුළුද, යන සියල්ල හළු කෙරේද, එසේම මහණෙනි, යම්කිසි භයක් උපදී නම්, ඒ සියල්ල බාලයා කෙරෙන් උපදී, පණ්ඩිතයා කෙරෙන් නූපදී. යම්කිසි උපද්‍රවයක් උපදී නම්, ඒ සියල්ල බාලයා කෙරෙන් උපදී, පණ්ඩිතයා කෙරෙන් නූපදී. යම්කිසි විපතක් උපදී නම්, ඒ සියල්ල බාලයා කෙරෙන් උපදී, පණ්ඩිතයා කෙරෙන් නූපදී.

**ඉති ඛො, භික්ඛවෙ, සප්පටිභයො බාලො, අප්පටිභයො පණ්ඩිතො. සඋපද්දවො බාලො, අනුපද්දවො පණ්ඩිතො. සඋපසග්ගො බාලො, අනුපසග්ගො පණ්ඩිතො.**

මහණෙනි, මෙසේ බාලතෙම භය සහිත වේ. පණ්ඩිත තෙමේ භය රහිත වේ. බාල තෙමේ උපද්‍රව සහිත වේ. පණ්ඩිත තෙමේ උපද්‍රව රහිත වේ. බාල තෙමේ විපත් සහිත වේ. පණ්ඩිත තෙමේ විපත් රහිත වේ.

**නත්ථි, භික්ඛවෙ, පණ්ඩිතතො භයං, නත්ථි පණ්ඩිතතො උපද්දවො, නත්ථි පණ්ඩිතතො උපසග්ගො. තස්මාතිහ, භික්ඛවෙ, පණ්ඩිතා භවිස්සාම වීමංසකාති, එවඤ්හි වො, භික්ඛවෙ, සික්ඛිතබ්බන්ති.**

මහණෙනි, පණ්ඩිතයා හට භයක් නැත. පණ්ඩිතයා හට උපද්‍රවයක් නැත. පණ්ඩිතයා හට විපතක් නැත. මහණෙනි, **නුවණින් විමසා බලා කටයුතු කරන හෙයින් පණ්ඩිත නම් වෙයි.** මහණෙනි, අපිද එසේ පණ්ඩිත වෙමුයි තොප විසින් හික්මිය යුතු ය.

සද්ධර්මය කන් නොදෙන බාලයාට අත් වන අප්‍රමාණ භය ගැන සංයුත්තනිකායේ, ඛන්ධවග්ගපාළියේ, ඛන්ධසංයුත්තයේ, නකුලපිතුවග්ගයේ එන උපාදානපරිතස්සනා සූත්‍රයේ විග්‍රහ වෙයි.

**උපාදාපරිතස්සනඤ්ච වො, භික්ඛවෙ, දෙසෙස්සාමි අනුපාදාඅපරිතස්සනඤ්ච. තං සුණාථ, සාධුකං මනසි කරොථ, භාසිස්සාමීති.**

මහණෙනි, පංච උපාදානස්කන්ධය උප්පාද වීමෙන් භය හට ගන්නා ආකාරයද, පංච උපාදානස්කන්ධය නොඋප්පාද වීමෙන් (නිරෝධයෙන්) භය දුරුවන ආකාරයද, දේශනා කරන්නෙමි. එය මනාකොට අසව්, මෙනෙහි කරව්, පවසන්නෙමි.

# අසත්පුරුෂ පෘථග්ජනයා විසි ආකාරයකින් භයට පත්වෙයි

**කථඤ්ච, භික්ඛවෙ, උපාදාපරිතස්සනා හොති ? ඉධ, භික්ඛවෙ, අස්සුතවා පුථුජ්ජනො අරියානං අදස්සාවී අරියධම්මස්ස අකොවිදො අරියධම්මෙ අවිනීතො, සප්පුරිසානං අදස්සාවී සප්පුරිසධම්මස්ස අකොවිදො සප්පුරිසධම්මෙ අවිනීතො,**

**රූපං අත්තතො සමනුපස්සති, රූපවන්තං වා අත්තානං, අත්තනි වා රූපං, රූපෙසු වා අත්තානං.**

මහණෙනි, මේ ලෝකයෙහි ආර්යයන් නොදක්නා වූ, ආර්ය ධර්මයෙහි අදක්ෂ වූ ආර්ය ධර්මයෙහි නොහික්මුණා වූ, සත්පුරුෂයන් නොදක්නා වූ සත්පුරුෂ ධර්මයෙහි අදක්ෂ වූ සත්පුරුෂ ධර්මයෙහි නොහික්මුණා වූ අශ්‍රැතවත් පෘථග්ජනතෙම,

රූපය තමන් යැයි දකී. තමන් රූපය සහිත වූවෙක් යැයි දකී. තමන් තුළ රූපය පවතී යැයි දකී. රූපය තුළ තමන් පවතී යැයි දකී.

**තස්ස තං රූපං විපරිණමති අඤ්ඤථා හොති. තස්ස රූප විපරිණාමඤ්ඤථාභාවා රූප විපරිණාමානුපරිවත්ති විඤ්ඤාණං හොති. තස්ස රූප විපරිණාමානුපරිවත්තිජා පරිතස්සනා ධම්මසමුප්පාදා චිත්තං පරියාදාය තිට්ඨන්ති. චෙතසො පරියාදානා උත්තාසවා ච හොති විඝාතවා ච අපෙක්ඛවා ච උපාදාය ච පරිතස්සති.**

එම රූපය විනාසය කරා පෙරළෙයි, අන්‍යභාවයට පත්වෙයි. රූපය විනාසය කරා පෙරළෙමින් අන්‍යභාවයට පත්වන විට, රූපයේ එම විපරිණාමයට අනුකූලව විඤ්ඤාණය පිහිටයි. රූපයේ එම විපරිණාමයට අනුකූලව පිහිටි විඤ්ඤාණයෙන් ජනිත වන භයෙන් තැතිගැන්මෙන් උපදින්නා වූ අදහස්, චිත්තය මැඩගෙන සිටියි. භය තැතිගැන්ම, මානසික අසහනය, සිත සපුරාම ග්‍රහණයට ගනියි. රූපය පිළිබඳ අපේක්ෂා ඇත්තේ භයට පැමිණියේ වෙති.

**වෙදනං අත්තතො සමනුපස්සති, වෙදනාවන්තං වා අත්තානං, අත්තනි වා වෙදනං, වෙදනාසු වා අත්තානං.**

වේදනාව තමන් යැයි දකී. තමන් වේදනා සහිත වූවෙක් යැයි දකී. තමන් තුළ වේදනාව පවතී යැයි දකී. වේදනාව තුළ තමන් පවතී යැයි දකී.

**තස්ස සා වෙදනා විපරිණමති අඤ්ඤථා හොති. තස්ස වෙදනා විපරිණාමඤ්ඤථාභාවා වෙදනා විපරිණාමානුපරිවත්ති විඤ්ඤාණං හොති. තස්ස වෙදනා විපරිණාමානුපරිවත්තිජා පරිතස්සනා ධම්මසමුප්පාදා චිත්තං පරියාදාය තිට්ඨන්ති. චෙතසො පරියාදානා උත්තාසවා ච හොති විඝාතවා ච අපෙක්ඛවා ච උපාදාය ච පරිතස්සති.**

එම වේදනාව විනාසය කරා පෙරළෙයි, අන්‍යභාවයට පත්වෙයි. වේදනාව විනාසය කරා පෙරළෙමින් අන්‍යභාවයට පත්වන විට, වේදනාවේ එම විපරිණාමයට අනුකූලව විඤ්ඤාණය පිහිටයි. වේදනාවේ එම විපරිණාමයට අනුකූලව පිහිටි විඤ්ඤාණයෙන් ජනිත වන භයෙන් තැතිගැන්මෙන් උපදින්නා වූ අදහස්, චිත්තය මැඩගෙන සිටියි. භය

තැතිගැන්ම, මානසික අසහනය, සිත සපුරාම ග්‍රහණයට ගනියි. වේදනාව පිළිබඳ අපේක්ෂා ඇත්තේ භයට පැමිණියේ වෙති.

**සඤ්ඤං අත්තතො සමනුපස්සති, සඤ්ඤාවන්තං අත්තානං, අත්තනි වා සඤ්ඤං, සඤ්ඤාය වා අත්තානං. තස්ස තෙ සඤ්ඤා විපරිණමන්ති අඤ්ඤථා හොන්ති.**

සංඥාව තමන් යැයි දකී. තමන් සංඥා සහිත වූවෙක් යැයි දකී. තමන් තුළ සංඥාව පවතී යැයි දකී. සංඥාව තුළ තමන් පවතී යැයි දකී.

**තස්ස සා සඤ්ඤා විපරිණමති අඤ්ඤථා හොති. තස්ස සඤ්ඤා විපරිණාමඤ්ඤථාභාවා සඤ්ඤා විපරිණාමානුපරිවත්ති විඤ්ඤාණං හොති. තස්ස සඤ්ඤා විපරිණාමානුපරිවත්තිජා පරිතස්සනා ධම්මසමුප්පාදා චිත්තං පරියාදාය තිට්ඨන්ති. චෙතසො පරියාදානා උත්තාසවා ච හොති විඝාතවා ච අපෙක්ඛවා ච උපාදාය ච පරිතස්සති.**

එම සංඥාව විනාසය කරා පෙරළෙයි, අන්‍යභාවයට පත්වෙයි. එම සංඥාව විනාසය කරා පෙරළෙමින් අන්‍යභාවයට පත්වන විට, සංඥාවේ එම විපරිණාමයට අනුකූලව විඤ්ඤාණය පිහිටයි. සංඥාවේ එම විපරිණාමයට අනුකූලව පිහිටි විඤ්ඤාණයෙන් ජනිත වන භයෙන් තැතිගැන්මෙන් උපදින්නා වූ අදහස්, චිත්තය මැඩගෙන සිටියි. භය තැතිගැන්ම, මානසික අසහනය, සිත සපුරාම ග්‍රහණයට ගනියි. සංඥාව පිළිබඳ අපේක්ෂා ඇත්තේ භයට පැමිණියේ වෙති.

**සඞ්ඛාරෙ අත්තතො සමනුපස්සති, සඞ්ඛාරවන්තං වා අත්තානං, අත්තනි වා සඞ්ඛාරෙ, සඞ්ඛාරෙසු වා අත්තානං. තස්ස තෙ සඞ්ඛාරා විපරිණමන්ති අඤ්ඤථා හොන්ති.**

සංඛාරය තමන් යැයි දකී. තමන් සංඛාරය සහිත වූවෙක් යැයි දකී. තමන් තුළ සංඛාරය පවතී යැයි දකී. සංඛාරය තුළ තමන් පවතී යැයි දකී.

**තස්ස තං සඞ්ඛාර විපරිණමති අඤ්ඤථා හොති. තස්ස සඞ්ඛාර විපරිණාමඤ්ඤථාභාවා සඞ්ඛාර විපරිණාමානුපරිවත්ති විඤ්ඤාණං හොති. තස්ස සඞ්ඛාර විපරිණාමානුපරිවත්තිජා පරිතස්සනා ධම්මසමුප්පාදා චිත්තං පරියාදාය තිට්ඨන්ති. චෙතසො පරියාදානා උත්තාසවා ච හොති විඝාතවා ච අපෙක්ඛවා ච උපාදාය ච පරිතස්සති.**

එම සංඛාරය විනාසය කරා පෙරළෙයි, අන්‍යභාවයට පත්වෙයි. සංඛාරය විනාසය කරා පෙරළෙමින් අන්‍යභාවයට පත්වන විට, සංඛාරයේ එම විපරිණාමයට අනුකූලව විඤ්ඤාණය පිහිටයි. සංඛාරයේ එම විපරිණාමයට අනුකූලව පිහිටි විඤ්ඤාණයෙන් ජනිත වන භයෙන් තැතිගැන්මෙන් උපදින්නා වූ අදහස්, චිත්තය මැඩගෙන සිටියි. භය තැතිගැන්ම, මානසික අසහනය, සිත සපුරාම ග්‍රහණයට ගනියි. සංඛාරය පිළිබඳ අපේක්ෂා ඇත්තේ භයට පැමිණියේ වෙති.

**විඤ්ඤාණං අත්තතො සමනුපස්සති, විඤ්ඤාණවන්තං වා අත්තානං, අත්තනි වා විඤ්ඤාණං, විඤ්ඤාණෙසු වා අත්තානං.**

විඤ්ඤාණය තමන් යැයි දකී. තමන් විඤ්ඤාණය සහිත වූවෙක් යැයි දකී. තමන් තුළ විඤ්ඤාණය පවතී යැයි දකී. විඤ්ඤාණය තුළ තමන් පවතී යැයි දකී.

**තස්ස තං විඤ්ඤාණං විපරිණමති අඤ්ඤථා හොති. තස්ස විඤ්ඤාණ විපරිණාමඤ්ඤථාභාවා විඤ්ඤාණ විපරිණාමානුපරිවත්ති විඤ්ඤාණං හොති. තස්ස විඤ්ඤාණ විපරිණාමානුපරිවත්තිජා පරිතස්සනා ධම්මසමුප්පාදා චිත්තං පරියාදාය තිට්ඨන්ති. චෙතසො පරියාදානා උත්තාසවා ච හොති විඝාතවා ච අපෙක්ඛවා ච උපාදාය ච පරිතස්සති.**

**එවං ඛො, භික්ඛවෙ, උපාදාපරිතස්සනා හොති.**

එම විඤ්ඤාණය විනාසය කරා පෙරළෙයි, අන්‍යභාවයට පත්වෙයි. විඤ්ඤාණය විනාසය කරා පෙරළෙමින් අන්‍යභාවයට පත්වන විට, විඤ්ඤාණයේ එම විපරිණාමයට අනුකූලව විඤ්ඤාණය පිහිටයි. විඤ්ඤාණයේ එම විපරිණාමයට අනුකූලව පිහිටි විඤ්ඤාණයෙන් ජනිත වන භයෙන් තැතිගැන්මෙන් උපදින්නා වූ අදහස්, චිත්තය මැඩගෙන සිටියි. භය තැතිගැන්ම, මානසික අසහනය, සිත සපුරාම ග්‍රහණයට ගනියි. විඤ්ඤාණය පිළිබඳ අපේක්ෂා ඇත්තේ භයට පැමිණියේ වෙති.

මහණෙනි, මෙසේ වනාහි පංච උපාදානස්කන්ධය හට ගැනීමෙන් භය තැතිගැන්ම ඇතිවෙයි.

# භය නමැති ගින්දර නිවන සදාතනික නිවන

**කථඤ්ච, භික්ඛවෙ, අනුපාදාඅපරිතස්සනා හොති ? ඉධ, භික්ඛවෙ, සුතවා අරියසාවකො අරියානං දස්සාවී අරියධම්මස්ස කොවිදො අරියධම්මෙ සුවිනීතො, සප්පුරිසානං දස්සාවී සප්පුරිසධම්මස්ස කොවිදො සප්පුරිසධම්මෙ සුවිනීතො,**

මහණෙනි, කෙසේ නම් පංච උපාදානස්කන්ධය හට නොගැනීමෙන් භය ඇති නොවන්නේද? මහණෙනි, මේ ලෝකයෙහි අර්යයන් දක්නා වූ ආර්ය ධර්මයෙහි දක්ෂ වූ ආර්ය ධර්මයෙහි හික්මුණා වූ, සත්පුරුෂයන් දක්නා වූ සත්පුරුෂ ධර්මයෙහි දක්ෂ වූ සත්පුරුෂ ධර්මයෙහි හික්මුණා වූ, බහුශ්‍රැත වූ ආර්යශ්‍රාවක තෙමේ,

**රූපය ගැන අපේක්ෂා නැත්තේ භයෙන් මිදුණා වෙති**

**න රූපං අත්තතො සමනුපස්සති, න රූපවන්තං වා අත්තානං, න අත්තනි වා රූපං, න රූපෙසු වා අත්තානං. තස්ස තං රූපං විපරිණමති අඤ්ඤථා හොති.**

රූපය තමන් යැයි නොදකී. තමන් රූපය සහිත වූවෙක් යැයි නොදකී. තමන් තුළ රූපය පවතී යැයි නොදකී. රූපය තුළ තමන් පවතී යැයි නොදකී.

**තස්ස රූපං විපරිණමති අඤ්ඤථා හොති. තස්ස රූප විපරිණාමඤ්ඤථාභාවා න රූප විපරිණාමානුපරිවත්ති විඤ්ඤාණං හොති. තස්ස න රූප විපරිණාමානුපරිවත්තිජා පරිතස්සනා ධම්මසමුප්පාදා චිත්තං පරියාදාය තිට්ඨන්ති. චෙතසො අපරියාදානා න චෙවුත්තාසවා හොති න ච විඝාතවා න ච අපෙක්ඛවා, අනුපාදාය ච න පරිතස්සති.**

එම රූපය විනාසය කරා පෙරළෙයි, අන්‍යභාවයට පත්වෙයි. එම රූපය විනාසය කරා පෙරළී අන්‍යභාවයට පත්වන විට, රූපයේ එම විපරිණාමයට අනුකූලව විඤ්ඤාණය නොපිහිටයි. රූපයේ එම විපරිණාමයට අනුකූලව විඤ්ඤාණය නොපිහිටි හෙයින් භයෙන් තැතිගැන්මෙන් උපදින්නා වූ අදහස්, චිත්තය මැඩගෙන නොසිටියි. භය තැතිගැන්ම, මානසික අසහනය සිත ග්‍රහණයට නොගනියි. රූපය පිළිබඳ අපේක්ෂා නැත්තේ භයෙන් මිදුණා වෙති.

**වේදනාව ගැන අපේක්ෂා නැත්තේ භයෙන් මිදුණා වෙති**

**න වෙදනං අත්තතො සමනුපස්සති, න වෙදනාවන්තං වා අත්තානං, න අත්තනි වා වෙදනං, න වෙදනාය වා අත්තානං.**

වේදනාව තමන් යැයි නොදකී. තමන් වේදනාව සහිතවූවෙක් යැයි නොදකී. තමන් තුළ වේදනාව පවතී යැයි නොදකී. වේදනාව තුළ තමන් පවතී යැයි නොදකී.

**තස්ස වෙදනා විපරිණමති අඤ්ඤථා හොති . තස්ස වෙදනා විපරිණාමඤ්ඤථාභාවා න වෙදනා විපරිණාමානුපරිවත්ති විඤ්ඤාණං හොති. තස්ස න වෙදනා විපරිණාමානුපරිවත්තිජා පරිතස්සනා ධම්මසමුප්පාදා චිත්තං පරියාදාය තිට්ඨන්ති. චෙතසො අපරියාදානා න චෙවුත්තාසවා හොති න ච විඝාතවා න ච අපෙක්ඛවා, අනුපාදාය ච න පරිතස්සති.**

එම වේදනාව විනාසය කරා පෙරළෙයි, අන්‍යභාවයට පත්වෙයි. එම වේදනාව විනාසය කරා පෙරළී අන්‍යභාවයට පත්වන විට, වේදනාවේ එම විපරිණාමයට අනුකූලව විඤ්ඤාණය නොපිහිටයි. වේදනාවේ එම විපරිණාමයට අනුකූලව විඤ්ඤාණය නොපිහිටි හෙයින් භයෙන් තැතිගැන්මෙන් උපදින්නා වූ අදහස්, චිත්තය මැඩගෙන නොසිටියි. භය තැතිගැන්ම, මානසික අසහනය සිත ග්‍රහණයට නොගනියි. වේදනාව පිළිබඳ අපේක්ෂා නැත්තේ භයෙන් මිදුණා වෙති.

**සංඥාව ගැන අපේක්ෂා නැත්තේ භයෙන් මිදුණා වෙති**

**න සඤ්ඤං අත්තතො සමනුපස්සති, න සඤ්ඤාවන්තං වා අත්තානං, න අත්තනි වා සඤ්ඤං, න සඤ්ඤාය වා අත්තානං.**

සංඥාව තමන් යැයි නොදකී. තමන් සංඥාව සහිතවූවෙක් යැයි නොදකී. තමන් තුළ සංඥාව පවතී යැයි නොදකී. සංඥාව තුළ තමන් පවතී යැයි නොදකී.

**තස්ස සඤ්ඤා විපරිණමති අඤ්ඤථා හොති. තස්ස සඤ්ඤා විපරිණාමඤ්ඤථාභාවා න සඤ්ඤා විපරිණාමානුපරිවත්ති විඤ්ඤාණං හොති. තස්ස න සඤ්ඤා විපරිණාමානුපරිවත්තිජා පරිතස්සනා ධම්මසමුප්පාදා චිත්තං පරියාදාය තිට්ඨන්ති. චෙතසො අපරියාදානා න චෙවුත්තාසවා හොති න ච විඝාතවා න ච අපෙක්ඛවා, අනුපාදාය ච න පරිතස්සති.**

එම සංඥාව විනාසය කරා පෙරළෙයි, අන්‍යභාවයට පත්වෙයි. එම සංඥාව විනාසය කරා පෙරළී අන්‍යභාවයට පත්වන විට, සංඥාවේ එම විපරිණාමයට අනුකූලව විඤ්ඤාණය නොපිහිටයි. සංඥාවේ එම විපරිණාමයට අනුකූලව විඤ්ඤාණය නොපිහිටි හෙයින් භයෙන් තැතිගැන්මෙන් උපදින්නා වූ අදහස්, චිත්තය මැඩගෙන නොසිටියි. භය තැතිගැන්ම, මානසික අසහනය සිත ග්‍රහණයට නොගනියි. සංඥාව පිළිබඳ අපේක්ෂා නැත්තේ භයෙන් මිදුණා වෙති.

**සංඛාර ගැන අපේක්ෂා නැත්තේ භයෙන් මිදුණා වෙති**

**න සඞ්ඛාරෙ අත්තතො සමනුපස්සති, න සඞ්ඛාරවන්තං වා අත්තානං, න අත්තනි වා සඞ්ඛාරෙ, න සඞ්ඛාරෙසු වා අත්තානං.**

සංඛාරය තමන් යැයි නොදකී. තමන් සංඛාරය සහිතවූවෙක් යැයි නොදකී. තමන් තුළ සංඛාරය පවතී යැයි නොදකී. සංඛාරය තුළ තමන් පවතී යැයි නොදකී.

**තස්ස තෙ සඞ්ඛාරා විපරිණමන්ති අඤ්ඤථා හොන්ති. තස්ස සඞ්ඛාර විපරිණාමඤ්ඤථාභාවා න සඞ්ඛාර විපරිණාමානුපරිවත්ති විඤ්ඤාණං හොති. තස්ස න සඞ්ඛාර විපරිණාමානුපරිවත්තිජා පරිතස්සනා ධම්මසමුප්පාදා චිත්තං පරියාදාය තිට්ඨන්ති. චෙතසො අපරියාදානා න චෙවුත්තාසවා හොති න ච විඝාතවා න ච අපෙක්ඛවා, අනුපාදාය ච න පරිතස්සති.**

එම සංඛාරය විනාසය කරා පෙරළෙයි, අන්‍යභාවයට පත්වෙයි. සංඛාරය විනාසය කරා පෙරළී අන්‍යභාවයට පත්වන විට, සංඛාරයේ එම විපරිණාමයට අනුකූලව විඤ්ඤාණය නොපිහිටයි. සංඛාරයේ එම විපරිණාමයට අනුකූලව විඤ්ඤාණය නොපිහිටි හෙයින් භයෙන් තැතිගැන්මෙන් උපදින්නා වූ අදහස්, චිත්තය මැඩගෙන නොසිටියි. භය තැතිගැන්ම, මානසික අසහනය සිත ග්‍රහණයට නොගනියි. සංඛාරය පිළිබඳ අපේක්ෂා නැත්තේ භයෙන් මිදුණා වෙති.

**විඤ්ඤාණය ගැන අපේක්ෂා නැත්තේ භයෙන් මිදුණා වෙති**

**න විඤ්ඤාණං අත්තතො සමනුපස්සති, න විඤ්ඤාණවන්තං වා අත්තානං, අත්තනි වා විඤ්ඤාණං, න විඤ්ඤාණාය අත්තානං.**

විඤ්ඤාණය තමන් යැයි නොදකී. තමන් විඤ්ඤාණය සහිතවූවෙක් යැයි නොදකී. තමන් තුළ විඤ්ඤාණය පවතී යැයි නොදකී. විඤ්ඤාණය තුළ තමන් පවතී යැයි නොදකී.

**තස්ස විඤ්ඤාණං විපරිණමති අඤ්ඤථා හොති. තස්ස විඤ්ඤාණ විපරිණාමඤ්ඤථාභාවා න විඤ්ඤාණ විපරිණාමානුපරිවත්ති විඤ්ඤාණං හොති. තස්ස න විඤ්ඤාණ විපරිණාමානුපරිවත්තිජා පරිතස්සනා ධම්මසමුප්පාදා චිත්තං පරියාදාය තිට්ඨන්ති. චෙතසො අපරියාදානා න චෙවුත්තාසවා හොති න ච විඝාතවා න ච අපෙක්ඛවා, අනුපාදාය ච න පරිතස්සති.**

එම විඤ්ඤාණය විනාසය කරා පෙරළෙයි, අන්‍යභාවයට පත්වෙයි. විඤ්ඤාණය විනාසය කරා පෙරළී අන්‍යභාවයට පත්වන විට, විඤ්ඤාණයේ එම විපරිණාමයට අනුකූලව විඤ්ඤාණය නොපිහිටයි. විඤ්ඤාණයේ එම විපරිණාමයට අනුකූලව විඤ්ඤාණය නොපිහිටි හෙයින් භයෙන් තැතිගැන්මෙන් උපදින්නා වූ අදහස්, චිත්තය මැඩගෙන නොසිටියි. භය තැතිගැන්ම, මානසික අසහනය සිත ග්‍රහණයට නොගනියි. විඤ්ඤාණය පිළිබඳ අපේක්ෂා නැත්තේ භයෙන් මිදුණා වෙති.

**එවං ඛො, භික්ඛවෙ, අනුපාදා අපරිතස්සනං හොතීති.**

මහණෙනි, මෙසේ වනාහි පංච උපාදානස්කන්ධය හට ගැනීමෙන් භය තැතිගැන්ම ඇතිවෙයි.

ජරා, මරණ, සහිත අප්‍රමාණ ඝෝර කටුක සසර දුක් උරුම කරදෙන පංච උපාදානස්කන්ධය වූ කලී මහා භයයි. පංච උපාදානස්කන්ධයේ හට ගැනීම වූ කලී භයේ ඇරඹුමයි. පංච උපාදානස්කන්ධයේ පැවැත්ම වූ කලී භයේ පැවැත්මයි. පංච උපාදානස්කන්ධයේ නිරෝධය වූ කලී භයේ අවසානයයි. භය අවසන් වූ තැන ඇත්තේ ක්ෂේමයයි. **අසොකං විරජං ඛෙමං, සදාතනික නිර්භයභාවය අමාමහ නිවනයි.**

## ඇතුළත රාගය නිවීමෙන් එකොළොස් ගිනි නිවෙයි

සියලු ගිනිවල මූලය වන්නේ රාගයයි. රාගය නිසා තණ්හාව පවතියි. චතුරාර්ය සත්‍යය අවබෝධ වීමෙන් පංච උපාදානස්කන්ධය කෙරෙහි ප්‍රඥාවෙන් කලකිරෙයි. කලකිරීම නිසා රාගය ක්ෂය වී යයි. රාගය දුරුවන විට තණ්හාව ක්ෂය වී යයි. මෙසේ අන්‍යමන්‍ය වශයෙන් රාගය සහ තණ්හාව ක්ෂය වී යයි. රාගය දුරු වීමෙන් සියලු ගිනි නිවී යයි. බුදු පියාණන් වහන්සේගේ මේ අමා දහම හුදෙක්ම රාග ගිනි නිවීම උදෙසායි. **රාගවිරාගත්ථො හි, භික්ඛු, මයා ධම්මො දෙසිතො** යන බුද්ධ වචනය එය සනාථ කරයි. **රාග විරාගය පිණිස මා විසින් ධර්මය දේශනා කරන ලදී.** හුදෙක්ම මේ අමා ධර්මය, රාගයෙන් වෙන්වීම උදෙසායි. විරාගය උදෙසායි. **විරාගය නිවනයි. විරාගො නිබ්බානං.**

සංයුත්තනිකාය, සළායතනවග්ගපාළි, සළායතනසංයුත්තං, නන්දික්ඛයවග්ගො, අජ්ඣත්තනන්දික්ඛය සූත්‍රයේ අභ්‍යන්තර ආයතන කෙරෙහි ඇති ඡන්දරාගය දුරු වී යාම ගැන මෙසේ පෙන්වා දෙයි.

**අනිච්චංයෙව, භික්ඛවෙ, භික්ඛු චක්ඛුං අනිච්චන්ති පස්සති, සාස්ස හොති සම්මාදිට්ඨි. සම්මා පස්සං නිබ්බින්දති. නන්දික්ඛයා රාගක්ඛයො, රාගක්ඛයා නන්දික්ඛයො. නන්දිරාගක්ඛයා චිත්තං සුවිමුත්තන්ති වුච්චති.**

මහණෙනි, භික්ෂු තෙම අනිච්ච වූ ඇස අනිච්ච ලෙස ප්‍රඥාවෙන් දකියි. එයම ඔහුගේ සම්මා දිට්ඨිය වෙයි. හෙතෙම ප්‍රඥාවෙන් කලකිරෙයි. කලකිරීමෙන් තණ්හාව (ආලය) නැසෙයි. තණ්හාව නැසීමෙන් රාගය නැසෙයි. රාගය නැසීමෙන් තණ්හාව නැසෙයි. තණ්හාව සහ රාගය නැසීමෙන් සිත මනාකොට මිදුණේයයි කියනු ලැබේ.

**අනිච්චංයෙව, භික්ඛවෙ, භික්ඛු සොතං අනිච්චන්ති පස්සති, සාස්ස හොති සම්මාදිට්ඨි. සම්මා පස්සං නිබ්බින්දති. නන්දික්ඛයා රාගක්ඛයො, රාගක්ඛයා නන්දික්ඛයො. නන්දිරාගක්ඛයා චිත්තං සුවිමුත්තන්ති වුච්චති.**

මහණෙනි, භික්ෂු තෙම අනිච්ච වූ කන අනිච්ච ලෙස ප්‍රඥාවෙන් දකියි. එයම ඔහුගේ සම්මා දිට්ඨිය වෙයි. හෙතෙම ප්‍රඥාවෙන් කලකිරෙයි. කලකිරීමෙන් තණ්හාව (ආලය) නැසෙයි. තණ්හාව නැසීමෙන් රාගය නැසෙයි. රාගය නැසීමෙන් තණ්හාව නැසෙයි. තණ්හාව සහ රාගය නැසීමෙන් සිත මනාකොට මිදුණේයයි කියනු ලැබේ.

**අනිච්චංයෙව, භික්ඛවෙ, භික්ඛු ඝානං අනිච්චන්ති පස්සති, සාස්ස හොති සම්මාදිට්ඨි. සම්මා පස්සං නිබ්බින්දති. නන්දික්ඛයා රාගක්ඛයො, රාගක්ඛයා නන්දික්ඛයො. නන්දිරාගක්ඛයා චිත්තං සුවිමුත්තන්ති වුච්චති.**

මහණෙනි, භික්ෂු තෙම අනිච්ච වූ නාසය අනිච්ච ලෙස ප්‍රඥාවෙන් දකියි. එයම ඔහුගේ සම්මා දිට්ඨිය වෙයි. හෙතෙම ප්‍රඥාවෙන් කලකිරෙයි. කලකිරීමෙන් තණ්හාව (ආලය) නැසෙයි. තණ්හාව නැසීමෙන් රාගය නැසෙයි. රාගය නැසීමෙන් තණ්හාව නැසෙයි. තණ්හාව සහ රාගය නැසීමෙන් සිත මනාකොට මිදුණේයයි කියනු ලැබේ.

**අනිච්චංයෙව, භික්ඛවෙ, භික්ඛු ජිව්හං අනිච්චන්ති පස්සති, සාස්ස හොති සම්මාදිට්ඨි. සම්මා පස්සං නිබ්බින්දති. නන්දික්ඛයා රාගක්ඛයො, රාගක්ඛයා නන්දික්ඛයො. නන්දිරාගක්ඛයා චිත්තං සුවිමුත්තන්ති වුච්චති.**

මහණෙනි, භික්ෂු තෙම අනිච්ච වූ දිව අනිච්ච ලෙස ප්‍රඥාවෙන් දකියි. එයම ඔහුගේ සම්මා දිට්ඨිය වෙයි. හෙතෙම ප්‍රඥාවෙන් කලකිරෙයි. කලකිරීමෙන් තණ්හාව (ආලය) නැසෙයි. තණ්හාව නැසීමෙන් රාගය නැසෙයි. රාගය නැසීමෙන් තණ්හාව නැසෙයි. තණ්හාව සහ රාගය නැසීමෙන් සිත මනාකොට මිදුණේයයි කියනු ලැබේ.

**අනිච්චංයෙව, භික්ඛවෙ, භික්ඛු කායං අනිච්චන්ති පස්සති, සාස්ස හොති සම්මාදිට්ඨි. සම්මා පස්සං නිබ්බින්දති. නන්දික්ඛයා රාගක්ඛයො, රාගක්ඛයා නන්දික්ඛයො. නන්දිරාගක්ඛයා චිත්තං සුවිමුත්තන්ති වුච්චති.**

මහණෙනි, භික්ෂු තෙම අනිච්ච වූ කය අනිච්ච ලෙස ප්‍රඥාවෙන් දකියි. එයම ඔහුගේ සම්මා දිට්ඨිය වෙයි. හෙතෙම ප්‍රඥාවෙන් කලකිරෙයි. කලකිරීමෙන් තණ්හාව (ආලය) නැසෙයි. තණ්හාව නැසීමෙන් රාගය නැසෙයි. රාගය නැසීමෙන් තණ්හාව නැසෙයි. තණ්හාව සහ රාගය නැසීමෙන් සිත මනාකොට මිදුණේයයි කියනු ලැබේ.

**අනිච්චංයෙව, භික්ඛවෙ, භික්ඛු මනං අනිච්චන්ති පස්සති, සාස්ස හොති සම්මාදිට්ඨි. සම්මා පස්සං නිබ්බින්දති. නන්දික්ඛයා රාගක්ඛයො, රාගක්ඛයා නන්දික්ඛයො. නන්දිරාගක්ඛයා චිත්තං සුවිමුත්තන්ති වුච්චති.**

මහණෙනි, භික්ෂු තෙම අනිච්ච වූ මනස අනිච්ච ලෙස ප්‍රඥාවෙන් දකියි. එයම ඔහුගේ සම්මා දිට්ඨිය වෙයි. හෙතෙම ප්‍රඥාවෙන් කලකිරෙයි. කලකිරීමෙන් තණ්හාව (ආලය) නැසෙයි. තණ්හාව නැසීමෙන් රාගය නැසෙයි. රාගය නැසීමෙන් තණ්හාව නැසෙයි. තණ්හාව සහ රාගය නැසීමෙන් සිත මනාකොට මිදුණේයයි කියනු ලැබේ.

# පිටත රාගය නිවීමෙන් එකොළොස් ගිනි නිවෙයි

සංයුත්තනිකාය, සළායතනවග්ගපාළි, සළායතනසංයුත්තං, නන්දික්ඛයවග්ගො, බාහිරනන්දික්ඛය සූත්‍රයේ බාහිර ආයතන කෙරෙහි ඇති ඡන්දරාගය දුරු වී යාම ගැන මෙසේ පෙන්වා දෙයි.

**අනිච්චෙයෙව, භික්ඛවෙ, භික්ඛු රූපෙ අනිච්චාති පස්සති, සාස්ස හොති සම්මාදිට්ඨි. සම්මා පස්සං නිබ්බින්දති. නන්දික්ඛයා රාගක්ඛයො, රාගක්ඛයා නන්දික්ඛයො. නන්දිරාගක්ඛයා චිත්තං සුවිමුත්තන්ති වුච්චති.**

මහණෙනි, භික්ෂු තෙම අනිච්ච වූ රූපය අනිච්ච ලෙස ප්‍රඥාවෙන් දකියි. එයම ඔහුගේ සම්මා දිට්ඨිය වෙයි. හෙතෙම ප්‍රඥාවෙන් කලකිරෙයි. කලකිරීමෙන් තණ්හාව (ආලය) නැසෙයි. තණ්හාව නැසීමෙන් රාගය නැසෙයි. රාගය නැසීමෙන් තණ්හාව නැසෙයි. තණ්හාව සහ රාගය නැසීමෙන් සිත මනාකොට මිදුණේයයි කියනු ලැබේ.

**අනිච්චෙයෙව, භික්ඛවෙ, භික්ඛු සද්දෙ අනිච්චාති පස්සති, සාස්ස හොති සම්මාදිට්ඨි. සම්මා පස්සං නිබ්බින්දති. නන්දික්ඛයා රාගක්ඛයො, රාගක්ඛයා නන්දික්ඛයො. නන්දිරාගක්ඛයා චිත්තං සුවිමුත්තන්ති වුච්චති.**

මහණෙනි, භික්ෂු තෙම අනිච්ච වූ ශබ්දය අනිච්ච ලෙස ප්‍රඥාවෙන් දකියි. එයම ඔහුගේ සම්මා දිට්ඨිය වෙයි. හෙතෙම ප්‍රඥාවෙන් කලකිරෙයි. කලකිරීමෙන් තණ්හාව (ආලය) නැසෙයි. තණ්හාව නැසීමෙන් රාගය නැසෙයි. රාගය නැසීමෙන් තණ්හාව නැසෙයි. තණ්හාව සහ රාගය නැසීමෙන් සිත මනාකොට මිදුණේයයි කියනු ලැබේ.

**අනිච්චෙයෙව, භික්ඛවෙ, භික්ඛු ගන්ධෙ අනිච්චාති පස්සති, සාස්ස හොති සම්මාදිට්ඨි. සම්මා පස්සං නිබ්බින්දති. නන්දික්ඛයා රාගක්ඛයො, රාගක්ඛයා නන්දික්ඛයො. නන්දිරාගක්ඛයා චිත්තං සුවිමුත්තන්ති වුච්චති.**

මහණෙනි, භික්ෂු තෙම අනිච්ච වූ ගන්ධය අනිච්ච ලෙස ප්‍රඥාවෙන් දකියි. එයම ඔහුගේ සම්මා දිට්ඨිය වෙයි. හෙතෙම ප්‍රඥාවෙන් කලකිරෙයි. කලකිරීමෙන් තණ්හාව (ආලය) නැසෙයි. තණ්හාව නැසීමෙන් රාගය නැසෙයි. රාගය නැසීමෙන් තණ්හාව නැසෙයි. තණ්හාව සහ රාගය නැසීමෙන් සිත මනාකොට මිදුණේයයි කියනු ලැබේ.

**අනිච්චෙයෙව, භික්ඛවෙ, භික්ඛු රසෙ අනිච්චාති පස්සති, සාස්ස හොති සම්මාදිට්ඨි. සම්මා පස්සං නිබ්බින්දති. නන්දික්ඛයා රාගක්ඛයො, රාගක්ඛයා නන්දික්ඛයො. නන්දිරාගක්ඛයා චිත්තං සුවිමුත්තන්ති වුච්චති.**

මහණෙනි, භික්ෂු තෙම අනිච්ච වූ රසය අනිච්ච ලෙස ප්‍රඥාවෙන් දකියි. එයම ඔහුගේ සම්මා දිට්ඨිය වෙයි. හෙතෙම ප්‍රඥාවෙන් කලකිරෙයි. කලකිරීමෙන් තණ්හාව (ආලය) නැසෙයි. තණ්හාව නැසීමෙන් රාගය නැසෙයි. රාගය නැසීමෙන් තණ්හාව නැසෙයි. තණ්හාව සහ රාගය නැසීමෙන් සිත මනාකොට මිදුණේයයි කියනු ලැබේ.

**අනිච්චෙයෙව, භික්ඛවෙ, භික්ඛු ඵොට්ඨබ්බෙ අනිච්චාති පස්සති, සාස්ස හොති සම්මාදිට්ඨී. සම්මා පස්සං නිබ්බින්දති. නන්දික්ඛයා රාගක්ඛයො, රාගක්ඛයා නන්දික්ඛයො. නන්දිරාගක්ඛයා චිත්තං සුවිමුත්තන්ති වුච්චති.**

මහණෙනි, භික්ෂු තෙම අනිච්ච වූ පහස අනිච්ච ලෙස ප්‍රඥාවෙන් දකියි. එයම ඔහුගේ සම්මා දිට්ඨිය වෙයි. හෙතෙම ප්‍රඥාවෙන් කලකිරෙයි. කලකිරීමෙන් තණ්හාව (ආලය) නැසෙයි. තණ්හාව නැසීමෙන් රාගය නැසෙයි. රාගය නැසීමෙන් තණ්හාව නැසෙයි. තණ්හාව සහ රාගය නැසීමෙන් සිත මනාකොට මිදුණේයයි කියනු ලැබේ.

**අනිච්චෙයෙව, භික්ඛවෙ, භික්ඛු ධම්මෙ අනිච්චාති පස්සති, සාස්ස හොති සම්මාදිට්ඨී. සම්මා පස්සං නිබ්බින්දති. නන්දික්ඛයා රාගක්ඛයො, රාගක්ඛයා නන්දික්ඛයො. නන්දිරාගක්ඛයා චිත්තං සුවිමුත්තන්ති වුච්චති.**

මහණෙනි, භික්ෂු තෙම අනිච්ච වූ අදහස් අනිච්ච ලෙස ප්‍රඥාවෙන් දකියි. එයම ඔහුගේ සම්මා දිට්ඨිය වෙයි. හෙතෙම ප්‍රඥාවෙන් කලකිරෙයි. කලකිරීමෙන් තණ්හාව (ආලය) නැසෙයි. තණ්හාව නැසීමෙන් රාගය නැසෙයි. රාගය නැසීමෙන් තණ්හාව නැසෙයි. තණ්හාව සහ රාගය නැසීමෙන් සිත මනාකොට මිදුණේයයි කියනු ලැබේ.

# හිසේ ගින්නටද පෙර නිවිය යුතු භව ගින්න

යමෙකුගේ හිස හෝ වස්ත්‍රය ගිනි ගන්නේ නම් ඒ පුද්ගලයා පළමුවෙන් කළ යුත්තේ එම හිසේ හෝ වස්ත්‍රයේ හෝ ඇවිළෙන ගින්න නිවා දැමීම ය. සෙසු සියලු වැඩ පසෙකින් තබා එම කටයුත්ත පළමුවෙන්ම කළ යුතු ය. අත්‍යවශ්‍යයෙන්ම කළ යුතු ය. නමුත් හිසේ හෝ වස්ත්‍රයේ හෝ ඇවිළෙන ගින්නටත් වඩා ඉක්මනින් නිවා දැමිය යුතු වෙනත් මහා භයානක ගින්නක් ඇත්නම් ? සංයුත්තනිකායේ, මහාවග්ගපාළියේ, සච්චසංයුත්තයේ, සීසපාවනවග්ගයේ එන ආදිත්තචෙල සූත්‍රයේ භව ගින්න ගැන, භාග්‍යවතුන් වහන්සේ මෙබඳු උපමාවකින් ධර්ම දේශනා කරති.

**ආදිත්තෙ, භික්ඛවෙ, චෙලෙ වා සීසෙ වා කිමස්ස කරණීයන්ති ?**

මහණෙනි, වස්ත්‍රයට හෝ හිසට හෝ ගිනි ඇවිළුණු කල්හි කුමක් කළ යුතුද ?

**ආදිත්තෙ, භන්තෙ, චෙලෙ වා සීසෙ වා, තස්සෙව චෙලස්ස වා සීසස්ස වා නිබ්බාපනාය අධිමත්තො ඡන්දො ච වායාමො ච උස්සාහො ච උස්සොළ්හී ච අප්පටිවානී ච සති ච සම්පජඤ්ඤඤ්ච කරණීයන්ති.**

ස්වාමීනි, වස්ත්‍රයට හෝ හිසට හෝ ගිනි ඇවිළුණු කල්හි, ඒ වස්ත්‍රය හෝ හිස හෝ නිවීම පිණිස බලවත් කැමැත්තද වෑයමද, උත්සාහයද, උත්සහවන්තභාවයද, නොපසුබස්නා වීර්යයද, සිහියද, නුවණද ඇතිව කටයුතු කළ යුතුයි.

**ආදිත්තං, භික්ඛවෙ, චෙලං වා සීසං වා අජ්ඣුපෙක්ඛිත්වා අමනසිකරිත්වා අනභිසමෙතානං චතුන්නං අරියසච්චානං යථාභූතං අභිසමයාය අධිමත්තො ඡන්දො ච වායාමො ච උස්සාහො ච උස්සොළ්හී ච අප්පටිවානී ච සති ච සම්පජඤ්ඤඤ්ච කරණීයං.**

මහණෙනි, ඇවිළ ගත් වස්ත්‍රය හෝ හිස හෝ නොබලා, මෙනෙහි නොකොට, අවබෝධ නොකරන ලද, චතුරාර්ය සත්‍යය තත් වූ පරිදි අවබෝධ කිරීම පිණිස බලවත් කැමැත්තද, වෑයමද, උත්සාහයද, උත්සහවන්තභාවයද, නොපසුබස්නා වීර්යයද, සිහියද නුවණද ඇතිව කටයුතු කළ යුතුයි. මේ උපමාවෙන් වැටහෙන්නේ සසරේ ඇති බිහිසුණුභාවයයි. හිසේ ගින්නෙන් දැවෙන්නේ මේ අත්භවය පමණි. හිසේ ගින්නෙන් දුකක් අත්වෙන්නේ මේ භවයේ පමණි. නමුත් උතුම් චතුරාර්ය සත්‍යය අවබෝධ කොට, රාග, ද්වේෂ, මෝහ භව ගින්න නිවා දැමීමට කටයුතු නොකළහොත්, ඒ හේතුවෙන් අත්භව කෝටි සත සහස්‍ර ගණනින් සත්වයාට දුක් ගිනිම උරුම වෙයි. භවයෙන් භවයට දුක්ඛස්කන්ධයම හිමි වෙයි. **එබැවින් ලෝකයේ ඤාණවන්තයෝ සෙසු සියලු ගිනි පසෙකලා භව ගින්නම නිවන්නට වැර දරති.**

# පසුවදනක් ...

## උන්නත් දාහ ය මළත් දාහ ය

අමාමෑණි බුදු පියාණන් වහන්සේගේ අමා ධර්මය නොදන්නා අඥ්ඥාණ ලෝක සත්වයා මෙලොවත් එකොළොස් ගින්නෙන් දැවෙති. මෙලොව උන්නත් දාහය පමණි. රැස් වූ කර්ම ශක්තිය අනුව මරණින් මතුව පරලොවද එකොළොස් ගින්නෙන් දැවෙති. ඒ අනුව පරලොවද දාහය පමණි. මනසේ සංඛාර නොහොත් කර්ම රැස් වනතුරු සත්වයා මෙසේ මෙලොව පරලොව ඉපිද එකොළොස් ගින්නෙන් යළි යළි දැවෙති. කවදා හෝ උතුම් නිවනින් භව ගමන කෙළවර වනතුරුම සියලු ලෝ සතුනට එකොළොස් ආකාර වූ මේ අනවරත අප්‍රමාණ සංසාර දුක් ගින්නෙන් නිරතුරු දැවෙන්නට සිදුවෙයි. කෙබඳු අත්භවයක් ගත කළත් මේ එකොළොස් ගින්නෙන් ගැලවීමක් නොවෙයි. එබැවින් අමා ධර්මය නොදන්නා අඥ්ඥාණයා මෙලොව උන්නත් දාහයෙන් යුක්ත ය. මියගොස් පරලොව උපන්නත් දාහයෙන් යුක්ත ය. **උන්නත් දාහ ය. මළත් දාහ ය. උන්නත් දැවෙයි. මළත් දැවෙයි. මරණින් පසු මහා ගිනි අපායවල යොදුන් ගණන් උස ගිනිදැල් අතර පවා දැවෙයි.**

ඥාණවන්ත සත්පුරිස මිනිසුන් එසේ දැවෙන්නේ නැත. මේ විශ්වයේ අග්‍ර මහා ශාස්තෘ උතුමන් වහන්සේ වන අමාමෑණි ලොව්තුරු ශාන්තිනායක සම්මා සම්බුදු පියාණන් වහන්සේගේ අසමසම අමා ධර්මය අප්‍රමාදීව අසා අවබෝධ කර ගන්නා ඥාණවන්ත, ප්‍රඥාවන්ත සත්පුරුෂ මනුෂ්‍යයෝ, දහම් ඥාණයෙන් සංසාර දුක්ඛස්කන්ධයේ අසාරත්වය අවබෝධ කරගෙන මනසේ රාගය, ද්වේෂය, මෝහය සහමුලින්ම නිවා දමා සදාතනික නිවීමට පත්වෙති. **අමෘත මහා නිවනින් නිවී සැනසෙති.**

**යෙ සුප්පයුත්තා මනසා දළ්හෙන, නික්කාමිනො ගොතමසාසනම්හි**

**තෙ පත්තිපත්තා අමතං විගය්හ, ලද්ධා මුධා නිබ්බුතිං භුඤ්ජමානා**

යමෙක් මනාකොට හික්මු වූ මනස දැඩි කොට ගෙන,

මේ ගෞතම සම්බුද්ධ සාසනයේදීම කාමයෙන් වෙන් වෙයිද,

ඔව්හු අප්‍රමාදීව අමෘතය ස්පර්ශ කොට,

උතුම් විවේකය ලබා නිවන් රසය වළඳන්නෝ ය.

මෙයද, ශාන්ත ප්‍රණීත නිවන් සුවය අත් දකින එබඳු උතුම් ඥාණවන්තයෙකුගේ දහම් සටහනකි. මේ සටහන කාගේද කින්ද මන්ද නොදනිමු. මෙය අන්තර්ජාල කළණ මිතුරු කණ්ඩායම් අතර හුවමාරු වූ දහම් පණිවුඩයකි. මෙහි ඇත්තේද උතුම් නිවන ගැන වටිනා අරුත්බර විදර්ශනා ඥාණ සිතුම් පෙළක් නිසාත්, මෙය සටහන් කළ කළණවතාගේ උතුම් ධර්ම දානය තව තවත් වර්ධනය වන නිසාත්, එයින් මේ පොතට වටිනා පසු වදනක් ලැබෙන නිසාත් එය මෙහි ඇතුළත් කළෙමු.

නිවන හොයන්න කලින්, නිවෙන්න කලින්, ඇවිළෙන තැන හොයන්න ඕනේ

ඇවිළෙන්නේ කොහොමද හොයන්න ඕනේ

ඇවිළෙන්නේ කුමක් නිසාද කියලා හොයන්න ඕනේ

තරහා ගිය වෙලාවට හිතට දැනෙන ගින්න දකින්න

පිච්චුණ දර කැල්ලක් වගේ ඇඟ දරදඬු වෙන හැටි දකින්න

ඇස් රතු වෙන හැටි දකින්න

රත්වෙච්ච හුමාලය පිට වෙනවා වගේ කටින් උණුසුම් වචන පිටවෙන හැටි දකින්න

වචන වල ඇති තාපය, රස්නය දකින්න

වචන නිසා තමනුත් අනිත් අයත් පිච්චෙන හැටි දකින්න

නපුරු වචන නිසා තාපයට සංතාපයට පත්වුණු සිත් සතන් දකින්න

රාගයෙන් ඇවිළෙන වෙලාවට සිරුර රත් වෙන හැටි දකින්න

බුර බුරා නැගෙන ගින්නක් වගේ රාගික ආශාවන් ඇවිළෙන හැටි දකින්න

ලැව් ගින්නක් වගේ නොනවත්වාම ඇවිළෙන ස්පර්ශ කාමය දකින්න

හැම බලාපොරොත්තුවක් ඇතුළෙම තියෙන මහා මානසික ගින්න දකින්න

ළමයා ගෙදර එනකම් මඟ බලාගෙන ඉන්න අම්මා මනසින් පිච්චෙන හැටි දකින්න

ආයෝජනය කරපු මුදලින් ලාභයක් ලැබෙන තුරු ඇඟිලි ගණින වෙළෙන්දා මනසින් පිච්චෙන හැටි දකින්න

පඩි වැඩිවීමක් උසස්වීමක් ලැබෙන තුරු ඉවසන් ඉන්න සේවකයා මනසින් පිච්චෙන හැටි දකින්න

නොයෙක් පසුතැවීම් නිසා මනස පිච්චෙන හැටි දකින්න

මියගිය ප්‍රියයෙක්, සහෝදරයෙක්, මිත්‍රයෙක් මතක් වෙනකොට මනසේ ඇවිළෙන ගින්න දකින්න

ඔබ අතින් අතීතයේ වුණු වැරැදි, පිළිකුල් සහගත ලැජ්ජා සහගත දේවල් මතක් වෙද්දි, ගින්නක් ඇතුළේ තියෙන දර කැල්ලක් පුපුරනවා වගේ සිතට නැගෙන සංවේගය දකින්න

තමාගේ මතයට කෙනෙක් විරුද්ධ වෙනකොට ඔබ තුළ ඇතිවෙන ගින්න දකින්න

තමාගේ ආගමට ජාතියට අපහාස කරන විට ඔබ පිච්චෙන හැටි දකින්න

හිතේ ඇවිළෙන ගිනි නිසා රටේ යුද ගිනිදැල් පවා ඇතිවෙන ආකාරය දකින්න

රාග ද්වේෂ මෝහ ගින්දරෙන් සියලු මිනිසුන් දැවෙන හැටි දකින්න

ඔබ ගින්න නිවන්න මහන්සි වෙවී ක්‍රම හොයන්න එපා

රාගය නැමැති කොළ අතු දානකම්

ද්වේෂය නමැති දර කෑලි තියනකම්

බලාපොරොත්තුව නමැති මෝහ කොළ අතු, එකතු කරන කම්

අතීතය නමැති අඟුරු කෑලි ගොඩ ගහනකම්

මාන්නය නමැති සුළඟ හමනකම්

ඔය ගින්න නිවෙන්නේ නෑ

ඔය ඇවිළීම නවතින්නේ නෑ

නිවනට පත් වෙන්න නම්, මනස නිවෙන්න ඕනේ නම්

ඇවිළෙන ගින්නට පිදුරු දාන එක නවත්වන්න

ඇවිළෙන ගින්නට දර කෑලි, කොළ අතු, අඟුරු දාන එක නවත්වන්න

ගින්නට සුළං පිඹින එක නවත්වන්න

ටිකෙන් ටික ගින්න නිවෙන්න පටන් ගනියි

ඒ විදියට නිවිලා නිවිලා නිවිලා

ගින්න සදහටම නිවිලාම යයි දවසක

කවදාවත් නැවත ඇවිළෙන්නේ නැති අළු ටිකක් විතරක් ඉතුරු කරලා ...

**විඤ්ඤාණං අනිදස්සනං, අනන්තං සබ්බතොපභං**

**එත්ථ ආපො ච පඨවී, තෙජො වායො න ගාධති**

**එත්ථ දීඝඤ්ච රස්සඤ්ච, අණුං ථූලං සුභාසුභං**

**එත්ථ නාමඤ්ච රූපඤ්ච, අසෙසං උපරුජ්ඣති**

**විඤ්ඤාණස්ස නිරොධෙන, එත්ථෙතං උපරුජ්ඣති**

විඤ්ඤාණයෙන් දැකිය නොහැක, එහි කෙළවරක් නැත. සියලු ආකාරයෙන් පබසර ය. එහි වැගිරෙන ස්වභාවය (ආපෝ), තද ස්වභාවය (පඨවි), තාප ස්වභාවය (තේජෝ), විසිරෙන ස්වභාවය (වායෝ) ඇතුළත්ව නැත. දීර්ඝ බව, කෙටි බව, ක්ෂුද්‍ර බව, ස්ථූල බව, සුභ අසුභ කිසිවක් එහි නැත. එය නාම රූපයන්ගේ සදාතනික අවසානයයි.

**විඤ්ඤාණයේ නිරෝධයයි (හට නොගැන්මයි).**
**ඒ නිරෝධය සදාතනික නිවනයි.**

දීඝනිකාය / සීලක්ඛන්ධවග්ගපාළි / කෙවට්ටසුත්තං


**ගෞරවණීය මාපලගම සුසිලවංශ හිමියන්** විසින් සිදුකරනු ලබන ධර්ම දේශනා සහ සතිපතා පැවැත්වෙන ධර්ම සාකච්ඡා ශ්‍රවණය කිරීම සඳහා ඔබට පහත දැක්වෙන දිගුව හෝ QR කේතය හරහා ‘ලොව්තුරු අරණ’ YouTube නාලිකාවට පිවිසෙන්නට හැකියි.
තෙරුවන් සරණයි!

www.Youtube.com/c/LowthuruArana

ධර්ම දානය පිණිසයි !